**ශීර්ෂය - 102 මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු හා ආයතන පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2012 වර්ෂය**

---

මෙම වාර්තාව කොටස් දෙකකින් සමන්විත වේ.

1 කොටස - අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු හා ආයතන වල ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව

2 කොටස - එක් එක් විසර්ජන ශීර්ෂයන්ට අදාල විස්තරාත්මක වාර්තාව

1කොටස

**මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවල ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව**

1. **අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු**

| ශීර්ෂය | දෙපාර්තමේන්තුවේ නම |
|---|---|
| 237 | ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව |
| 238 | රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව |
| 239 | විදේශ සම්පත් දෙපාර්තමේන්තුව |
| 240 | ජාතික අයවැය දෙපාර්තමේන්තුව |
| 241 | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව |
| 242 | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව |
| 243 | සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව |
| 244 | වෙළඳ, තීරුබදු හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව |
| 245 | රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව |
| 246 | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව |
| 247 | ශ්‍රී ලංකා රේගුව |
| 248 | සුරාබදු දෙපාර්තමේන්තුව |
| 249 | භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව |
| 250 | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව |
| 251 | තක්සේරු දෙපාර්තමේන්තුව |
| 252 | ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව |
| 280 | ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව |
| 296 | ආනයන හා අපනයනපාලන දෙපාර්තමේන්තුව |
| 323 | නීති කටයුතු දෙපාර්තමේන්තුව |

324 කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව

- මිලෝදා ආයතනය
- ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මූල්‍ය ප්‍රකාශන

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම්**

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු විස්සක් (20) ක් සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.512,051,344,197ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වනවිට ඉන් රු.433,334,018,424ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ හා එක් එක් දෙපාර්තමේන්තුවේ ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් ඉතිරිවීම් රු.962,708ක සිට රු.2,588,329,339 දක්වා වූ පරාසයක ප්‍රමාණයකින් හෙවත් මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 0.61 සිට සියයට 97.16ක් දක්වා පරාසයක පැවැතින. විස්තර පහත දැක්වේ.

| ශීර්ෂය | අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව | 2012 දෙසැම්බර් 31 දිනට ශුද්ධ ප්‍රතිපාදනය | | 2012 දෙසැම්බර් 31 දිනට උපයෝජනය | | 2012 දෙසැම්බර් 31 දිනට ඉතිරිය | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | පුනරාවර්තන | මූලධන | පුනරාවර්තන | මූලධන | පුනරාවර්තන | මූලධන | එකතුව | ප්‍රතිශතය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | |
| **102** | මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය | 635,718,000 | 1,855,195,270 | 601,799,179 | 1,298,459,476 | 33,918,821 | 556,735,794 | 590,654,615 | 23.71 |
| **237** | ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව | 55,920,500 | 123,023,500 | 54,717,891 | 122,084,857 | 1,202,609 | 938,643 | 2,141,252 | 1.20 |
| **238** | රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව | 636,800,000 | 1,600,000 | 127,561,375 | 1,142,707 | 509,238,625 | 457,293 | 509,695,918 | 79.84 |
| **239** | විදේශ සම්පත් දෙපාර්තමේන්තුව | 255,966,927 | 639,176,000 | 176,049,527 | 635,890,072 | 79,917,400 | 3,285,928 | 83,203,328 | 9.29 |
| **240** | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 39,280,845,000 | 35,197,950,000 | 68,473,412 | 1,409,412,522 | 506,182,816 | 1,038,749,794 | 1,544,932,610 | 2.07 |
| **241** | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව | 48,375,000 | 4,600,000 | 44,205,234 | 2,330,481 | 4,169,766 | 2,269,519 | 6,439,285 | 12.16 |
| **242** | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව | 32,800,000 | 1,450,000 | 30,995,445 | 862,279 | 1,804,555 | 587,721 | 2,392,276 | 6.98 |
| **243** | සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව | 366,225,000 | 2,378,700,000 | 315,775,337 | 1,560,816,339 | 50,459,663 | 817,883,661 | 868,343,324 | 31.63 |
| **244** | වෙළඳ, තීරුබදු හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව | 830,434,000 | 900,000 | 23,062,721 | 561,500 | 807,371,279 | 338,500 | 807,709,779 | 97.16 |
| **245** | රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව | 136,490,000 | 1,385,000 | 113,492,491 | 1,253,070 | 22,997,509 | 131,930 | 23,129,439 | 16.78 |
| **246** | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව | 1,563,600,000 | 57,900,000 | 1,562,267,310 | 42,061,640 | 1,332,690 | 15,838,360 | 17,171,050 | 1.06 |
| **247** | ශ්‍රී ලංකා රේගුව | 1,392,627,000 | 932,800,000 | 1,391,536,742 | 902,832,384 | 1,090,258 | 29,967,616 | 31,057,874 | 1.34 |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| **248** | සුරාබදු දෙපාර්තමේන්තුව | 455,096,000 | 67,000,000 | 445,495,674 | 60,358,987 | 9,601,326 | 6,641,013 | 16,242,339 | 3.11 |
| **249** | භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව | 416,478,342,000 | 6,305,300,000 | 414,147,477,550 | 6,047,835,111 | 2,330,864,450 | 257,464,889 | 2,588,329,339 | 0.61 |
| **250** | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව | 34,880,500 | 15,469,500 | 33,713,683 | 11,461,332 | 1,166,817 | 4,008,168 | 5,174,985 | 10.28 |
| **251** | තක්සේරු දෙපාර්තමේන්තුව | 235,570,000 | 20,700,000 | 229,100,462 | 18,556,751 | 6,469,538 | 2,143,249 | 8,612,787 | 3.36 |
| **252** | ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව | 578,900,000 | 1,271,453,000 | 568,752,974 | 1,137,027,123 | 10,147,026 | 134,425,877 | 144,572,903 | 7.81 |
| **280** | ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව | 64,130,000 | 4,700,000 | 59,055,714 | 3,655,425 | 5,074,286 | 1,044,575 | 6,118,861 | 8.89 |
| **296** | ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව | 39,698,372 | 11,091,628 | 36,945,353 | 10,480,135 | 2,753,019 | 611,493 | 3,364,512 | 6.62 |
| **323** | නීති කටයුතු දෙපාර්තමේන්තුව | 10,612,000 | 650,000 | 10,191,281 | 108,011 | 420,719 | 541,989 | 962,708 | 8.55 |
| **324** | කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව | 24,620,000 | 2,650,000 | 23,882,818 | 2,277,049 | 737,182 | 372,951 | 1,110,133 | 4.07 |
| | එකතුව | 463,157,650,299 | 48,893,693,898 | 420,064,551,173 | 13,269,467,251 | 43,093,099,126 | 35,624,226,647 | 78,717,325,773 | |

## 2.2 ආදායම් ගිණුම්

**ඇස්තමේන්තුගත හා තත්‍ය ආදායම**

අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තු 09ක් විසින් 2012 වර්ෂය සඳහා ආදායම් සංකේත හැට හතක් (67) සඳහා එකතුව රු. 1,036,329,632,000ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර ආදායම් ලෙස රු. 990,664,916,396ක් රැස්කර තිබුණි.ඒ අනුව ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 35.82 සිට සියයට 553.04 දක්වා පරාසයක ප්‍රතිශතයන්ගෙන් ආදායම රැස්කර තිබුණි.විස්තර පහත දැක්වේ.

| ආදායම් ගණන්දීමේ නිලධාරි | ආදායම් සංකේතය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | (අඩුවෙන් එකතුකිරීම)/වැඩියෙන් එකතුකිරීම | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | |
| රේගු අධ්‍යක්ෂ ජනරාල් | 10.01.01.00 | 76,830,000,000 | 73,488,797,447 | (3,341,202,553) | 95.65 |
| - එම - | 10.01.02.00 | 20,000,000 | 20,869,945 | 869,945 | 104.35 |
| ආනයන අපනයන පාලක | 10.01.03.00 | 450,000,000 | 512,671,434 | 62,671,434 | 113.92 |
| රේගු අධ්‍යක්ෂ ජනරාල් | 10.01.04.00 | 75,211,000,000 | 70,110,728,468 | (5,100,271,532) | 93.22 |
| - එම- | 10.01.05.01 | 29,287,000,000 | 29,603,817,902 | 316,817,902 | 101.08 |
| - එම- | 10.01.05.02 | 3,120,000,000 | 3,136,571,565 | 16,571,565 | 100.53 |
| - එම- | 10.01.06.00 | - | - | | |
| - එම- | 10.01.07.00 | - | - | | |
| - එම- | 10.01.08.00 | 36,608,000,000 | 33,665,823,105 | (2,942,176,895) | 91.96 |
| - එම- | 10.01.99.00 | - | - | - | - |
| - එම- | 10.02.05.01 | 54,924,000,000 | 53,528,703,599 | (1,395,296,401) | 97.46 |
| - එම- | 10.02.05.02 | - | 39,070,605 | 39,070,605 | |
| - එම- | 10.02.05.03 | 23,000,000,000 | 28,466,074,809 | 5,466,074,809 | 123.77 |
| - එම- | 10.02.05.04 | 57,510,000,000 | 46,495,735,189 | (11,014,264,811) | 80.85 |
| - එම- | 10.02.05.99 | 5,132,000,000 | 3,336,130,676 | (1,795,869,324) | 65.01 |
| දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් | 10.02.01.01 | 22,208,300,000 | 21,090,795,631 | (1,117,504,369) | 94.97 |
| - එම- | 10.02.01.02 | 56,925,200,000 | 45,609,087,661 | (11,316,112,339) | 80.12 |
| - එම- | 10.02.01.03 | 35,340,500,000 | 38,487,278,292 | 3,146,778,292 | 108.90 |
| - එම- | 10.02.01.04 | 109,487,000,000 | 99,468,871,221 | (10,018,128,779) | 90.85 |
| - එම- | 10.02.02.01 | 12,000,000 | 8,012,275 | (3,987,725) | 66.77 |
| - එම- | 10.02.02.02 | 6,000,000 | 3,982,398 | (2,017,602) | 66.37 |
| - එම- | 10.02.02.03 | - | - | - | - |
| - එම- | 10.02.03.01 | 2,000,000 | 2,008,516 | 8,516 | 100.43 |

| | | | | | |
|---|---|---|---|---|---|
| - එම- | 10.02.03.02 | 2,000,000 | 1,921,838 | (78,162) | 96.09 |
| - එම- | 10.02.03.03 | - | - | - | - |
| සුරාබදු කොමසාරිස් ජනරාල් | 10.02.04.00 | 60,971,000,000 | 60,046,840,535 | (924,159,465) | 137.38 |
| - එම- | 10.02.06.00 | 25,000,000 | 34,344,008 | 9,344,008 | |
| දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් | 10.02.08.00 | - | (481,999) | (481,999) | |
| - එම- | 10.02.09.00 | 25,000,000 | 138,260,169 | 113,260,169 | 553.04 |
| රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති අධ්‍යක්ෂ ජනරාල් | 10.02.10.00 | 200,000,000 | 128,505,342 | (71,494,658) | 64.25 |
| භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල් | 10.02.11.00 | 22,900,000,000 | 22,289,140,870 | (610,859,130) | 97.33 |
| දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් | 10.02.12.01 | 17,441,000,000 | 13,534,045,176 | (3,906,954,824) | 77.60 |
| - එම- | 10.02.12.02 | 7,489,190,000 | 9,542,448,857 | 2,056,258,857 | 127.42 |
| - එම- | 10.02.12.03 | 18,823,000,000 | 15,659,658,331 | (3,163,341,669) | 83.19 |
| - එම- | 10.03.03.00 | 312,000,000 | 289,175,098 | (22,824,902) | 92.68 |
| - එම- | 10.03.04.00 | 2,200,000,000 | 1,285,744,429 | (914,255,571) | 58.44 |
| - එම- | 10.03.05.00 | 950,000,000 | 709,648,933 | (240,351,067) | 74.70 |
| භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල් | 10.03.06.00 | - | - | - | - |
| දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් | 10.04.01.02 | 7,409,210,000 | 8,712,982,193 | 1,303,772,193 | 117.60 |
| - එම- | 10.04.04.00 | 17,318,000,000 | 14,864,241,267 | (2,453,758,733) | 85.83 |
| - එම- | 10.04.01.01 | 75,790,000,000 | 68,285,005,102 | (7,504,994,898) | 90.10 |
| - එම- | 10.04.02.01 | 17,411,000,000 | 14,763,457,967 | (2,647,542,033) | 84.79 |
| - එම- | 10.04.03.01 | 52,574,000,000 | 59,262,107,756 | 6,688,107,756 | 112.72 |
| - එම- | 10.04.03.99 | 400,000,000 | 344,211,910 | (55,788,090) | 86.05 |
| - එම- | 10.04.02.99 | 6,388,790,000 | 6,305,109,016 | (83,680,984) | 98.69 |
| - එම- | 10.04.01.03 | 12,000,000 | 56,028,959 | 44,028,959 | 466.91 |
| ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් | 20.01.03.00 | 100,000,000 | 289,427,871 | 189,427,871 | 289.43 |
| භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල් | 20.02.01.01 | 650,000,000 | 582,263,523 | (67,736,477) | 89.58 |
| - එම- | 20.02.01.99 | 62,000,000 | 50,139,146 | (11,860,854) | 80.87 |
| - එම- | 20.02.02.01 | 7,704,000,000 | 8,100,515,778 | 396,515,778 | 105.15 |
| - එම- | 20.02.02.99 | 1,325,000,000 | 1,387,710,751 | 62,710,751 | 104.73 |
| රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල් | 20.02.03.00 | 36,459,060,000 | 42,214,108,456 | 5,755,048,456 | 115.78 |

| | | | | | |
|---|---|---|---|---|---|
| - එම- | 20.02.04.00 | 5,096,800,000 | 4,546,957,702 | (549,842,298) | 89.21 |
| භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල් | 20.03.01.00 | 130,000,000 | 143,436,379 | 13,436,379 | 110.34 |
| ප්‍රධාන තක්සේරුකරු | 20.03.02.09 | 30,000,000 | 32,585,761 | 2,585,761 | 108.62 |
| රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල් | 20.03.02.11 | 32,000,000 | 34,359,965 | 2,359,965 | 107.37 |
| භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල් | 20.03.02.99 | 7,114,582,000 | 2,941,497,189 | (4,173,084,811) | 41.34 |
| රේගු අධ්‍යක්ෂ ජනරාල් | 20.03.02.17 | 100,000,000 | 104,693,242 | 4,693,242 | 104.69 |
| භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල් | 20.03.03.00 | 3,000,000,000 | 5,137,117,410 | 2,137,117,410 | 171.24 |
| - එම- | 20.03.99.00 | 9,042,000,000 | 3,238,910,549 | (5,803,089,451) | 35.82 |
| රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති අධ්‍යක්ෂ ජනරාල් | 20.05.01.00 | 32,000,000,000 | 43,000,000,000 | 11,000,000,000 | 134.38 |
| භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල් | 20.05.99.00 | 1,800,000,000 | 2,222,737,157 | 422,737,157 | 123.49 |
| - එම- | 20.06.02.00 | 500,000,000 | 831,151,867 | 331,151,867 | 166.23 |
| දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් | 20.06.03.00 | - | - | - | - |
| භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල් | 20.06.04.00 | 16,470,000,000 | 16,409,105,273 | (60,894,727) | 99.63 |
| - එම- | 30.01.01.00 | 20,000,000,000 | 16,070,771,882 | (3,929,228,118) | 80.35 |
| එකතුව | | 1,036,329,632,000 | 990,664,916,396 | (45,664,715,604) | |

## 2.3 අත්තිකාරම් ගිණුම්

### 2.3.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තු විස්සක් (20)වෙත රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව පනවා තිබුණු පහත සඳහන් සීමාවන් පිළිපැඳ තිබුණි. විස්තර පහත දැක්වේ.

| ශීර්ෂය | විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|---|
| | | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 102 | 10201 | 24,000,000 | 10,815,088 | 7,500,000 | 10,222,247 | 90,000,000 | 44,678,838 |
| 237 | 23701 | 4,000,000 | 3,685,564 | 2,500,000 | 3,257,921 | 30,000,000 | 16,832,869 |
| 238 | 23801 | 2,600,000 | 2,069,916 | 1,000,000 | 1,653,259 | 10,000,000 | 7,151,436 |
| 239 | 23901 | 5,000,000 | 4,241,921 | 2,880,000 | 3,086,126 | 32,000,000 | 17,255,208 |
| 240 | 24001 | 7,000,000 | 3,968,834 | 3,700,000 | 4,813,624 | 35,000,000 | 22,223,115 |
| 241 | 24101 | 4,000,000 | 1,913,495 | 1,500,000 | 1,965,027 | 18,000,000 | 10,820,522 |
| 242 | 24201 | 5,000,000 | 2,596,073 | 2,000,000 | 2,144,103 | 23,000,000 | 10,437,504 |
| 243 | 24301 | 2,500,000 | 1,437,657 | 500,000 | 809,643 | 12,000,000 | 4,160,448 |
| 244 | 24401 | 2,500,000 | 1,892,364 | 1,500,000 | 1,578,843 | 15,000,000 | 8,608,918 |
| 245 | 24501 | 4,000,000 | 1,806,388 | 1,000,000 | 2,159,529 | 16,000,000 | 9,425,671 |
| 246 | 24601 | 45,000,000 | 44,681,193 | 48,000,000 | 59,858,857 | 295,000,000 | 219,759,166 |
| 247 | 24701 | 40,100,000 | 40,057,661 | 35,000,000 | 46,697,536 | 294,000,000 | 243,699,139 |
| 248 | 24801 | 28,000,000 | 25,997,714 | 22,000,000 | 25,943,682 | 195,000,000 | 130,598,452 |
| 249 | 24901 | 5,500,000 | 3,532,868 | 2,800,000 | 3,204,052 | 30,000,000 | 17,874,645 |
| 250 | 25001 | 5,000,000 | 2,682,229 | 2,000,000 | 6,016,206 | 25,000,000 | 8,598,509 |
| 251 | 25101 | 15,000,000 | 12,305,765 | 12,500,000 | 12,970,015 | 60,000,000 | 58,186,946 |
| 252 | 25201 | 52,000,000 | 21,079,978 | 19,500,000 | 32,048,355 | 215,000,000 | 139,987,869 |
| 280 | 28001 | 6,000,000 | 2,646,481 | 1,600,000 | 2,658,137 | 21,000,000 | 12,954,686 |
| 296 | 29601 | 4,500,000 | 3,825,966 | 2,000,000 | 3,718,583 | 20,000,000 | 11,929,264 |
| 323 | 32301 | 1,000,000 | 240,292 | 200,000 | 343,320 | 3,000,000 | 1,286,198 |
| 324 | 32401 | 2,000,000 | 1,284,767 | 1,200,000 | 2,008,870 | 11,000,000 | 8,055,013 |

### 2.3.2 වාණිජ නොවන අත්තිකාරම් ගිණුම්

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුවක වාණිජ නොවන අත්තිකාරම් ගිණුම් කටයුතු දෙකක් (02) වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු පහත සඳහන් සීමාවන් පිළිපැද තිබුණි. විස්තර පහත දැක්වේ.

| ශීර්ෂය | විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|---|
| | | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 250 | 25002 | 4,250,000 | 3,836,933 | 4,250,000 | 4,088,717 | 3,500,000 | 909,279 |
| 250 | 25003 | 10,000,000 | 1,872,138 | 3,000,000 | 14,573,099 | 520,000,000 | 490,459,153 |

## 2.4 අග්‍රිම හා පොදු තැන්පත් ගිණුම්

### (අ) අග්‍රිම ගිණුම්

අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තු හතරක (04) 2012 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ගිණුම්වල එකතුව රු.102,550,997 ක් වූ හර ශේෂ තිබුණි. විස්තර පහත දැක්වේ.

| දෙපාර්තමේන්තුව | 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය හර/ |
|---|---|
| | රු. |
| ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 83,325 |
| දේශීය ආදායම් දෙපාර්තමේන්තුව | 70,021,041 |
| ශ්‍රී ලංකා රේගුව | **4,938,397** |
| සුරාබදු දෙපාර්තමේන්තුව | 27,508,234 |
| | 102,550,997 |

### (ආ) පොදු තැන්පත් ගිණුම්

2012 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තු පහළොවක (15) පොදු තැන්පත් ගිණුම් ශේෂවල එකතුව රු.5,322,927,661 ක් වූ අතර ඒ පිළිබඳ විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව | ගිණුම් අංකය | 2012දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|
| | | රු. |
| මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය | 6000/0000/00/0015/0016/000 | 700,498 |
| රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව | 6000/00000/00/0015/118/000 | 38,317 |
| ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 15/120 | 14,058 |
| රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව | 6000/0/0/15/121 | 2,950 |
| කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0122/000 | 3,505 |
| වෙළඳ, තීරුබදු හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව | 6000/00000/00/0015/124/000 | 19,625 |
| රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව | 6000/0/0/15/25 | 330,888 |
| දේශීය ආදායම් දෙපාර්තමේන්තුව | 6000/0/0/15/0126 | 36,079,237 |
| | 6000/0/0/14/3 | 1,096,890,829 |
| ශ්‍රී ලංකා රේගුව | 6000/0/0/15/127 | 3,820,783,061 |
| සුරාබදු දෙපාර්තමේන්තුව | 6000/15/128 | 83,085,184 |
| | 6000/08/051 | 14,437,857 |
| | 6000/06/60 | 215,954,027 |
| රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0130/000 | 2,925 |
| තක්සේරු දෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0131/000 | 435,149 |
| ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0132/000 | 39,803,307 |
| | 6000/0000/00/0011/0592/000 | 13,865,258 |
| ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව | 6000/0/0/15/135 | 3,175 |
| ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0151/000 | 477,811 |
| එකතුව | | 5,322,927,661 |

## 2 කොටස

-----------

## 1. ශීර්ෂය 102 - මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය

---------------------------------------------------

### 1.1 විගණන විෂය පථය

---------------------

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 නොවැම්බර් 26 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශය පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශය පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුලත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම

-------------------------------------------------------------------------------------

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශය පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුලත් වේ.

### 1.3 විගණන නිරීක්ෂණය

-----------------------

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.4 සිට 1.8 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

#### (අ) අයවැය විචලනය

-------------------

(i) වැය විෂයයන් තුනක් (03)යටතේ ප්‍රතිපාදනය කර තිබුණු එකතුව රු.2,120,000ක් වූ සම්පූර්ණ මූලධන ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ii) වැය විෂයයන් පහළොවකට (15) එකතුව රු.529,302,566 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර එයින් එකතුව රු.112,570,615ක් උපයෝජනය කිරීමෙන් පසු රු.416,731,951ක ඉතිරියක් නිරීක්ෂණය විය.එම ඉතිරිය අදාල වැය විෂයයන් යටතේ සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 6 සිට සියයට 98 දක්වා වූ පරාසයක් ගෙන තිබුණි.

**(ආ) රාජ්‍ය වියදම් කළමණාකරණය**

2011 දෙසැම්බර් 30 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 155 හි 2.4 ඡේදය විධිවිධාන වලට පටහැනිව ඉතිරි කරන ලද එක් වැය විෂයයක් සඳහා බල අංක 391 යටතේ පරිපූරක ඇස්තමේන්තුවෙන් රු.12,500,000 ක අතිරේක ප්‍රතිපාදන ලබා ගෙන තිබුණි.

**(ඇ) ඉන්ධන හා විදුලි වියදම් කළමනාකරණය**

(i) 2012 පෙබරවාරි 16 දිනැති අංක 156 දරන භාණ්ඩාගාර චක්‍රලේඛ උපදෙස් නොතකා සමාලෝචිත වර්ෂයේදී වැය විෂයයන් සඳහා මුදල් රෙගුලාසි 66 මගින් රු.5,963,000 ක් ප්‍රතිපාදන මාරු කර තිබුණි.

(ii) 2012 පෙබරවාරි 16 දිනැති අංක 156 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 3 ඡේදයේ විධිවිධාන ප්‍රකාර 2012 ජනවාරි මාසය තුල ඉන්ධන හා විදුලිය සඳහා වැය කරන ලද වියදම මත පදනම්ව, එම සීමාව නොඉක්මවන පරිදි ඉදිරි මාස වලදී මාසික වියදම පවත්වා ගෙන යා යුතු වුවත්, ජනවාරි මස වියදම ඉක්මවා අනෙකුත් මාස වල ඉන්ධන හා විදුලිය වෙනුවෙන් පිලිවෙලින් රු.1,108,001 ක් හා රු.3,826,820 වශයෙන් එකතුව රු.4,934,821 ක වියදම් එකී විධිවිධානවලට පටහැනිව දරා තිබුණි.

**(ඈ) රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිලිබඳ සැසඳුම් ප්‍රකාශය**

චලනය නොවන හිඟ ණය ශේෂ හතරකට (04) අදාලව එකතුව රු.719,257 ක හිඟ ණය ශේෂ පැවති අතර එම මුදල් අයකර ගැනීම පිළිබඳව පසු විපරම් කටයුතු දූර්වල තත්ත්වයක පැවතුණි.

**1.4 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය**

**1.4.1 සංයුක්ත සැලැස්ම**

2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5 (4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැලැස්මක් අමාත්‍යාංශය විසින් වර්ෂය ආරම්භයේ පිළියෙල කළ යුතු වුවත්, එම සැලැස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

### 1.4.2 විගණනය හා කළමණාකරණ කමිටුව ක්‍රියාත්මක කිරීම

2012 වර්ෂය තුළදී විගණන හා කළමණාකරණ කමිටුව රැස්වීම් තුනක් පමණක් පවත්වා තිබුණි.

### 1.5 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | ව්‍යවස්ථාපිත විධිවිධාන | |
| | 1971 අංක 3 හා 1974 අංක 40 දරන පනත්වලින් සංශෝධිත 1969 අංක 07 දරන රජයේ නිවාස (සන්තකය ආපසු ලබාගැනීමේ) පනත | ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 7.1 ඡේදය ප්‍රකාරව රජයේ නිවාසයෙන් අස්වී යන ලෙස නිලධාරියකුට නියම කළ විට ඔහු එසේ නොකළ හොත් මෙම පනත යටතේ ඔහු ඒ නිවසෙන් ඉවත් කළ යුතු වුවත්, හිටපු නියෝජ්‍ය භාණ්ඩාගාර ලේකම්වරයෙකු සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි. |
| (ආ) | ආයතන සංග්‍රහය | |
| | (i)XIX පරිච්ඡේදයේ 6.15 වගන්තිය | රජයේ නිවාස රාජ්‍ය නිලධාරින්ට ලබාදීමේදී බදු කාලය අවසානයේදී හෝ නිවාස වෙන් කර දෙන බලධරයා නියම කළ විට හෝ නිවාසයෙන් අස්වී යායුතු වුවත්, හිටපු නියෝජ්‍ය භාණ්ඩාගාර ලේකම්වරයෙකු හා ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂවරයෙකු එසේ කර නොතිබුණි. |
| | (ii)7.2 වගන්තිය | බදු කාලය ඉක්මවා රජයේ නිවාසයක පදිංචිව සිටින කාලපරිච්ඡේදය වෙනුවෙන් ඉහත නිලධාරින් දෙදෙනාගෙන් සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂවරයෙකුගෙන් 2012දෙසැම්බර් 31 දින දක්වා දණ්ඩන කුලී අය කර නොතිබුණි. |
| | (iii)5.2.1 වගන්තිය | උපලේඛන ගත නිවාස ලබා ගැනීමට හිමිකමක් නැති නිලධාරියකු රජයේ නිවාසයක පදිංචි වීම වෙනුවෙන් විවාහක නිලධාරියකුගේ වැටුපෙන් සියයට 12 1/2 ක් අයකර ගත යුතු වුවත් වැටුපෙන් සියයට 10 ක් පමණක් අය කර තිබුණි. |

| | |
|---|---|
| (iv)5.4 වගන්තිය | රාජ්‍ය සේවයේ නියුතු වූ අඹුසැමි යුවලක් රජයේ නිවාසයක පදිංචි වී සිටින අවස්ථාවලදී උපලේඛන ගත නිවාස ලබා ගැනීමට හිමිකමක් නැතිනම් ඒ දෙදෙනාගෙන් වැඩි වැටුප් ලබන නිලධාරියාගේ වැටුපෙන් සියයට 12 1/2 ක් සහ අඩු වැටුප් ලබන නිලධාරියාගේ වැටුපෙන් සියයට 5 ක් අයකර ගත යුතු වුවත් මෙම අමාත්‍යාංශය යටතේ පවතින නිල නිවාස සඳහා වැටුපෙන් සියයට 10 ක් පමණක් නිලධාරියාගෙන් අයකර තිබුණ අතර නිවාස ලාභියාගේ කලත්‍රයා රජයේ සේවකයෙකු වූ අවස්ථා තුනකදී එම කලත්‍රයාගෙන් 2012 දෙසැම්බර් 31 දින දක්වා එසේ නිවාස කුලී අයකර නොතිබුණි. |

(ඇ) රාජ්‍ය පරිපාලනචක්‍රලේඛ
-----------------------------

| | |
|---|---|
| (i) 1992 අගෝස්තු 19 දිනැති අංක 26/92, 1994 අගෝස්තු 03 දිනැති අංක 26/92(**i**) හා 2002 පෙබරවාරි 26 දිනැතිඅංක 01/2002 දරන චක්‍රලේඛ | අමාත්‍යාංශයේ සංචිත වාහනවල රාජ්‍ය ලාංඡනය හා ආයතනයේ නම යොදා නොතිබුණි. |
| (**ii**)2008 ජුනි 26 දිනැති අංක 13/2008 දරන චක්‍රලේඛය 07 ඡේදය | නිවාස සහ කාර්යාලය අතර කණ්ඩායම් ප්‍රවාහන පහසුකම් සැලසිය හැකි උපරිම දුර ප්‍රමාණය යාම් ඊම් සඳහා කිලෝමීටර් 50 ක් වුවත්, ඊට පටහැනිව එම දුර සීමාවන් ඉක්මවා කිලෝමීටර් 58 සිට 86 දක්වා කණ්ඩායම් ප්‍රවාහන පහසුකම් ලබාදීම සඳහා වාහන 05 ක් යොදවා තිබුණි. |

(ඇ**)** රාජ්‍ය මුදල් චක්‍රලේඛ
----------------------------

| | |
|---|---|
| 1997 සැප්තැම්බර් 30 දිනැති අංක 353 දරන චක්‍රලේඛය 3 IIවගන්තිය | සමීක්ෂණ මණ්ඩලයක්/ තක්සේරු මණ්ඩලයක් පත් කර අපහරණය සඳහා ඉදිරිපත් කර ඇති වාහන පිළිබඳ තක්සේරු වාර්තාව සමග තත්ත්ව වාර්තාව සහ අනෙකුත් අදාල දත්තයන් ඉදිරිපත් කළ යුතු වුවත් 2011 වර්ෂයේදි අපහරණය කරන ලද වාහන 25 ක් සහ 2012 වර්ෂයේදි අපහරණය කරන ලද වාහන 24 ක් සඳහා තත්ත්ව වාර්තා සහ අනෙකුත් අදාල දත්තයන් ලබා ගෙන නොතිබුණි. |

(ඉ) ජාතික අයවැය චක්‍රලේඛ

| | |
|---|---|
| 2010 දෙසැම්බර් 07 දිනැති අංක 150 දරන චක්‍රලේඛය | අවුරුදු 10 කට වඩා පැරණි සහ ආර්ථික වශයෙන් ඵලදායි නොවන වාහන අපහරණය කිරීම සඳහා ප්‍රමුඛත්වය ලබාදිය යුතු වුවත් 2004, 2005 සහ 2007 වර්ෂවල ලියාපදිංචි කළ වාහන 4 ක් හේතු මත අපහරණය කර තිබුණි. |

(ඊ) විශ්‍රාම වැටුප් චක්‍රලේඛ

| | |
|---|---|
| 2010 මැයි 25 දිනැති අංක 4/2010 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය **vii** ජේදය | එක් එක් මාසයේ දායක මුදල් ඊලඟ මාසයේ 10 වන දිනට පෙර රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට ලැබීමට සැලැස්වීමත් එසේ අය කරනු ලබන දායක මුදල් පිළිබඳ බැර නිවේදනයක් එවීමත් ප්‍රධාන ගණන්දීමේ නිලධාරින්ගේ වගකීම වුවත් ඒ අනුව කටයුතු නොකර මාස 3 සිට වර්ෂ 2 දක්වා කාල ප්‍රමාදයකින් දායක මුදල් යවා තිබුණි. |

## 1.6 කාර්ය සාධනය

2012 වාර්ෂික අයවැය ඇස්තමේන්තු/ක්‍රියාකාරී සැලසුමට අනුව අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**සැලසුම් කිරීම**

**වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මට අනුව ක්‍රියා නොකිරීම**

පහත සඳහන් අවස්ථාවලදී ක්‍රියාකාරි සැලැස්මට අනුකූලව ක්‍රියා නොකර තිබුණු බව නිරීක්ෂණයවිය.

| | අංශය | | ක්‍රියාකාරකම |
|---|---|---|---|
| (i) | ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවා අංශය | | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මගින් පුහුණු සැසි පැවැත්වීම |
| (ii) | ගොඩනැගිලි පාලන අංශය | i. | මහා භාණ්ඩාගාර ගොඩනැගිල්ලට යාබදව නව පස් මහල් ගොඩනැගිල්ලක් ඉදි කිරීමේ කොන්ත්‍රාත්තුව පිරිනැමීම හා ඉදි කිරීම් ආරම්භ කිරීම |
| | | ii. | බුදු මැදුරේ අළුත්වැඩියා කටයුතු |
| | | iii. | දෙවන මහලේ සිවිලිම අළුත්වැඩියා කිරීම |

| | | | |
|---|---|---|---|
| (iii) | ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවා අංශය | | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මගින් පුහුණු සැසි පැවැත්වීම |
| (iv) | පරිපාලන හා මානව සම්පත් සංවර්ධන අංශය | i. | මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය සඳහා සන්ධාන නිලධාරි තනතුරක් ඇති කිරීම |
| | | ii. | ලේඛණාගාරය තුල ඇති අපහරණය කළ හැකි ලිපිගොණු රාජ්‍ය පරිපාලන චක්‍රෙල්ඛ 25/2008 අනුව විධිමත් පරිදි අනුමැතිය ලබාගැනීමෙන් පසු අපහරණය කිරීම |

## 1.7 කළමණාකරණ දුර්වලතා

---------------------------

නියැදි විගණන පරික්ෂණ වලදී පහත සඳහන් දුර්වලතා නිරික්ෂණ විය.

### භූමි අලංකරණ කටයුතු - 2011/ 2012

----------------------------------------

2011 ජුනි සිට 2012 අගෝස්තු දක්වා භූමි අලංකරණ කටයුතු සඳහා රු. 963,166 ක් වැය කර තිබූ අතර පහත අඩුපාඩු නිරික්ෂණය විය.

(අ) ගොඩනැගිලි පරිශ්‍රය තුල ඖසු උයනක් සකස් කිරිම අරමුණක් වුවද ඖසු උයනක් ආකාරයට ඖෂධ පැලැටි සිටුවා නොතිබුණි. තවද භූමි අලංකරණ රකෙන පරිදි පරිසරයට උචිත පැලැටි තෝරා නොගැනීම නිසා සහ නිසි පරිදි නඩත්තු නොකිරිම නිසා පැලැටි සමහරක් විනාශ වි තිබුණි. එසේ විනාශ වූ පැලැටි වෙනුවට අළුත් පැල සිටුවිමක් ද සිදු කර නොතිබුණි.

(ආ) අඩි 3ක් අවම උස ඇති ස්වාභාවික මල් බඳුන් 50 ක් විශේෂිත ස්ථානවල තැබීමට සැලසුම් කර තිබුණද එම අයිතමය ඉවත් කර භාණ්ඩාගාර භූමියේ එළවළු පැල සිටුවීමට අවධානය යොමු කර තිබුණි. එම එළවළු වගාවෙන් ඵලදාවක් ලැබී නොතිබුණු අතර ඒවා විනාශ වී ගොස් තිබුණි.

**1.8 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (අ) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 25 | 19 | 06 |
| (ආ) | තෘතියික මට්ටම | 08 | 04 | 04 |
| (ඇ) | ද්විතියික මට්ටම | 139 | 107 | 32 |
| (ඈ) | ප්‍රාථමික මට්ටම | 110 | 99 | 11 |
| | එකතුව | 282 | 229 | 53 |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 53 ක් පිරවීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

## 2. ශීර්ෂය 237 - ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව

### 2.1 විගණන විෂය පථය

ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 දෙසැම්බර් 09 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශනය පිළබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුලත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 2.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයක් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුලත් වේ.

### 2.3 විගණන නිරීක්ෂණය

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 2.4 සිට 2.7 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

#### (අ) අයවැය විචලනය

වැය විෂයයකට රු.2,250,000 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර එයින් රු.1,730,192 ක් උපයෝජනය කිරිමෙන් පසු රු.519,808 ක ඉතිරියක් නිරීක්ෂණය විය. එම ඉතිරිය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 23 ප්‍රතිශතයක් ගෙන තිබුණි. වැය විෂය සඳහා අධි ප්‍රතිපාදන සැලසීම නිසා මෙම ඉතිරිය ඇති වී තිබුණු බව නිරීක්ෂණය විය.

**(ආ) රාජ්‍ය වියදම් කළමනාකරණය**

2011 දෙසැම්බර් 30 දිනැති අංක 155 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික අයවැය ඇස්තමේන්තුවලින් සලසා තිබුණු ප්‍රතිපාදනවලින් පුනරාවර්තන හා මූලධන ප්‍රතිපාදනවලින් පිළිවෙලින් සියයට 2 ක් හා සියයට 9 ක ප්‍රතිපාදන ඉතිරි කළ යුතු වුවත්, 2012 වර්ෂය සඳහා දෙපාර්තමේන්තුව විසින් එසේ ඉතිරි කර තිබුණේ පිළිවෙලින් සියයට 1.72 හා සියයට 0.2 ක ප්‍රතිශතයකි.

**(ඇ) ඉන්ධන හා විදුලි වියදම් කළමනාකරණය**

ඉන්ධන හා විදුලි වියදම් සඳහා අතිරේක මුදලක් ලබා නොදෙන බවත්,මුදල් රෙගුලාසි 66 මගින් ප්‍රතිපාදන මාරු කිරීම භාණ්ඩාගාරය විසින් අනුමත නොකරන බවත් 2012 පෙබරවාරි 16 දිනැති අංක 156 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයෙන් උපදෙස් දී තිබුණත්,එම උපදෙස් නොතකා එම වැය විෂයයන් සඳහා මුදල් රෙගුලාසි 66 මගින් රු.100,000 ක් ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂයේදී මාරු කර තිබුණි.

**(ඈ) රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 23701 දරන රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළබඳ 2012 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟ හිට තිබුණු ශේෂවල එකතුව රු.233,836 ක්වූ අතර, එම හිඟ හිටි ශේෂ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත්වී තිබුණි.

**2.4 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය**

**2.4.1 සංයුක්ත සැලැස්ම**

2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5 (4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය ප්‍රකාරව 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැලැස්මක් දෙපාර්තමේන්තුව විසින් වර්ෂය ආරම්භයේ පිළියෙල කළ යුතු වුවත්, එම සැලැස්ම මෙම වාර්තාවේ දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

**2.4.2 වාර්ෂික කාර්ය සාධන වාර්තාව**

ඉහත 2.4.1ඡේදයෙහි සඳහන් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියේ සඳහන් පිලිවෙලින් 2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 හා 2004 පෙබරවාරි 20 දිනැති අංක 402 (1) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාර දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කළ යුතු වාර්ෂික කාර්ය සාධන වාර්තාව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත විගණකාධිපතිට පිටපතක් සහිතව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාල කාර්ය සාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කර තිබුණේ 2013 ඔක්තෝබර් 03 දිනදීය.

**2.5 වත්කම් කළමනාකරණය**

**වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

2010 දෙසැම්බර් 17 දිනැති අංක පීඑෆ්/සමීක්ෂණ මණ්ඩල/01 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය මගින් සංශෝධිත 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාර 2012 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදු කර එම වාර්තා 2013 මාර්තු 31 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය මෙම වාර්තාවේ දින වන විටත් පවත්වා නොතිබුණි. අවසාන වරට භාණ්ඩ සමීක්ෂණය පවත්වා තිබුණේ 2011 වර්ෂය වෙනුවෙනි.

**2.6 අනුකූල නොවීම්**

**නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නිල නිවාස ගිවිසුම්වල කාලය අවසන් වී තිබුණද එම නිල නිවාස ආපසු භාරදී නොතිබුණු නිලධාරීන් 05 දෙනෙකු සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 7.1 හා 7.2 වගන්ති අනුව නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**2.7 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2012 දෙසැම්බර් 31 දිනට වු සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (අ) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 58 | 35 | 23 |
| (ආ) | තෘතියික මට්ටම | 02 | 01 | 01 |
| (ඇ) | ද්විතියික මට්ටම | 26 | 22 | 04 |
| (ඈ) | ප්‍රාථමික මට්ටම | 29 | 29 | - |
| | එකතුව | 115 | 87 | 28 |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 28 ක් පිරවීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

## 3. ශීර්ෂය - 238 රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

### 3.1 විගණන විෂය පථය

රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා ආදායම් ගිණුම් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 මාර්තු 03 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුලත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 3.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුලත් වේ.

### 3.3 විගණන නිරීක්ෂණය

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සහ(ආ) හි වූ පොදු නිරීක්ෂණ සහ පහත 3.4 සිට 3.8 දක්වා වූ ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

#### (අ) අයවැය විචලනය

වැය විෂයන් 06 කට එකතුව රු.605,035,000 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර එයින් එකතුව රු.99,561,167 ක් උපයෝජනය කිරීමෙන් පසු රු.505,473,833 ක ඉතිරියක් නිරීක්ෂණය විය. එම ඉතිරියන් අදාල වැය විෂයයන් යටතේ සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් සියයට 27 සිට 84 දක්වා වූ පරාසයක ප්‍රතිශතයක් ගෙන තිබුණි.

එසේම වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මගින් ප්‍රතිපාදන සලසා දී නොතිබුණු වැය විෂය අංක 238-1-1-1405 **(i)** සඳහා වීරමෝං ක්‍රියාපටිපාටිය යටතේ රු. 78,728,000 ක් මාරු කර තිබුණි.

**(ආ) ආදායම් ගිණුම්**

ඉදිරිපත් කළ ගිණුම් 02 කට අනුව රු.1,435,858,156 ක් වූ ආදායම් හිඟ හිට තිබුණු අතර, ඉන් රු.82,306,007 ක ප්‍රමාණයක් වර්ෂ 02ට වැඩි හිඟ ආදායම්වේ. එම හිඟ හිටි ආදායම් අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවැතුණි.

## 3.4 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය

### 3.4.1 සංයුක්ත සැලැස්ම

2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5 (4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03ක් සඳහා සංයුක්ත සැලැස්මක් දෙපාර්තමේන්තුව විසින් වර්ෂය ආරම්භයේදී පිළියෙල කළ යුතු වුවත්, එම සැලැස්ම 2013 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙළ කර නොතිබුණි.

### 3.4.2 වාර්ෂික කාර්ය සාධන වාර්තා

ඉහත 3.4.1 ඡේදයෙහි සඳහන් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියේ සඳහන් 2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 හා 2004 පෙබරවාරි 20 දිනැති අංක 402(1) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාර දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කළ යුතු වාර්ෂික කාර්ය සාධන වාර්තාව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත විගණකාධිපතිට පිටපතක් සහිතව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාල කාර්ය සාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කර තිබුණේ 2013 දෙසැම්බර් 19 දිනදීය.

### 3.4.3 විගණන හා කළමනාකරණ කමිටුව ක්‍රියාත්මක කිරීම

සමාලෝචිත වර්ෂයේදී විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 03 ක් පමණක් පවත්වා තිබුණි.

## 3.5 වත්කම් කළමනාකරණය

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

පහත විග්‍රහ කර ඇති පරිදි වත්කම් නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| වත්කම් වර්ගය | ඒකක ගණන | නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති කාලය |
|---|---|---|
| යන්ත්‍ර සූත්‍ර | 14 | වර්ෂ 1ට වැඩි |
| වෙනත් වත්කම් | 275 | වර්ෂ 1ට වැඩි |
| වෙනත් වත්කම් (ටෝනර්) | 84 | වර්ෂ 3ට වැඩි |

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

2010 දෙසැම්බර් 17 දිනැති අංක පීඑෆ්/සමීක්ෂණ මණ්ඩල/01 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය මගින් සංශෝධිත 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාර 2012 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදු කර එම වාර්තා 2013 මාර්තු 31 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදු කර තිබුණේ 2013 ජූලි 25 දිනදීය.

## 3.6 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | මුදල් රෙගුලාසි | | |
| | මුදල් රෙගුලාසි 104 (3) හා (4) | 72,525 | අලාභහානි පිලිබඳ පරිපූර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරීමට දින 07 කට වඩා ගත වන්නේ නම් ප්‍රාරම්භක වාර්තාවක්ද තුන් මසක් ඇතුලත පරිපූර්ණ වාර්තාවක්ද ලබා දිය යුතු වුවත් එපරිදි කටයුතු කර නොතිබුණි. |
| (ආ) | භාණ්ඩාගාර චක්‍රලේඛ | | |
| | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන චක්‍රලේඛයේ අංක 02 ඡේදය හා 3 වැනි උපලේඛනය | 84,228 | සමාලෝචිත වර්ෂයේදී අවස්ථා 04 කදී මිලදී ගත් යූපීඑස් යන්ත්‍ර 07 ක් ස්ථාවර වත්කම් ලේඛනයේ සටහන් කිරීමේදී අඩුපාඩු රාශියක් සිදු කර තිබුණි. |

**3.7 කාර්ය සාධනය**

දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂය සඳහා සංයුක්ත සැලැස්මක් පිලියෙල කර නොතිබුණ බැවින් අනුකූල නොවීම් නිරීක්ෂණය කළ නොහැකි විය.

**3.8 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (අ) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 22 | 11 | 11 |
| (ආ) | තෘතියික මට්ටම | 03 | 02 | 01 |
| (ඇ) | ද්විතීයික මට්ටම | 25 | 16 | 09 |
| (ඈ) | ප්‍රාථමික මට්ටම | 15 | 10 | 05 |
| | එකතුව | 65 | 39 | 26 |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 26 ක් පිරවීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

**4. ශීර්ෂය 239 - විදේශ සම්පත් දෙපාර්තමේන්තුව**

**4.1 විගණන විෂය පථය**

විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 නොවැම්බර් 07 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශනය පිළබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුලත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**4.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයක් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුලත් වේ.

**4.3 විගණන නිරීක්ෂණය**

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශනය මෙහි (අ) සහ (ආ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 4.4 සිට 4.6 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) අයවැය විචලනය**

වැය විෂයයන් 04 කට එකතුව රු. 7,700,000 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර එයින් එකතුව රු. 4,629,527 ක් උපයෝජනය කිරීමෙන් පසු රු. 3,070,473 ක ඉතිරියක්

නිරීක්ෂණය විය.එම ඉතිරිය අදාල වැය විෂයයන් යටතේ සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් සියයට 26 සිට සියයට 82 දක්වා වූ පරාසයක් ගෙන තිබුණි.වැය විෂයන් සඳහා අධි ප්‍රතිපාදන සැලසීම නිසා මෙම ඉතිරියන් ඇති වී තිබුණු බවද නිරීක්ෂණය විය.

**(ආ) රාජ්‍ය වියදම් කළමනාකරණය**

2011 දෙසැම්බර් 30 දිනැති අංක 155 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික අයවැය ඇස්තමේන්තුවලින් සලසා තිබුණු ප්‍රතිපාදනවලින් පුනරාවර්තන හා මූලධන ප්‍රතිපාදනයන්ගෙන් පිළිවෙලින් සියයට 2 ක් හා සියයට 9 ක ප්‍රතිපාදන ඉතිරි කළ යුතු වුවත්, 2012 වර්ෂය දෙපාර්තමේන්තුව විසින් පුනරාවර්තන ප්‍රතිපාදනවලින් එසේ ප්‍රතිපාදන ඉතිරි කර නොතිබුණු අතර මූලධන ප්‍රතිපාදනවලින් ඉතිරිකර තිබුණේ සියයට 0.25 ක ප්‍රතිශතයකි.

**4.4 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය**

**සංයුක්ත සැලැස්ම**

2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5 (4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැලැස්මක් දෙපාර්තමේන්තුව විසින් වර්ෂය ආරම්භයේ පිළියෙල කළ යුතු වුවත්, එම සැලැස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

**4.5 අනුකූල නොවීම්**

**නිති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වු නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවු අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| (අ) මුදල් රෙගුලාසි 94 | 1,027,302 | වැය විෂයයන් 3 කට සලසා තිබුණු රු.6,594,615 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.6,593,058 ක් උපයෝජනය කළ පසු ඉතිරිය රු.1,757 ක් වී තිබුණි. මු.රෙ.94 ට |

| | | | |
|---|---|---|---|
| | | | පටහැනිව එම ඉතිරිය රු.1,025,545 කින් ඉක්මවා රු.1,027,302 ක බැරකම්වලට එළඹ තිබුණි. |
| (ආ) | 2004 ඔක්තෝබර් 18 දිනැති අංක 174 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය | 5,750 | ගණක යන්ත්‍ර 10 ක් මිලදී ගැනීම ජංගම නොවන වත්කම් සංචලනය පිළිබඳ වාර්තාවට ඇතුලත් කර නොතිබුණි. |

**4.6 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (අ) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 45 | 29 | 16 |
| (ආ) | තෘතියික මට්ටම | 03 | 02 | 01 |
| (ඇ) | ද්විතියික මට්ටම | 64 | 40 | 24 |
| (ඈ) | ප්‍රාථමික මට්ටම | 29 | 24 | 05 |
| | එකතුව | 141 | 95 | 46 |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 46 ක් පිරවීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

## 5. ශීර්ෂය - 240 ජාතික අයවැය දෙපාර්තමේන්තුව

### 5.1 විගණන විෂය පථය

ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා ආදායම් ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 පෙබරවාරි 28 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුලත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 5.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුලත් වේ.

### 5.3 විගණන නිරීක්ෂණය

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශනය මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 5.4 සිට 5.7 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

#### (අ) අයවැය විචලනය

(i) එක් මූලධන වැය විෂයයක් සඳහා සලසා තිබුණු රු.30,000,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ii) වැය විෂයයන් 07 කට එකතුව රු.1,161,642,000 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර එයින් එකතුව රු. 787,617,504 ක් උපයෝජනය කිරීමෙන් පසු

රු.374,024,496 ක ඉතිරියක් නිරික්ෂණය විය.එම ඉතිරිය අදාල වැය විෂයයන් යටතේ සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් සියයට 23 සිට සියයට 50 දක්වා වු පරාසයක් ගෙන තිබුණි.වැය විෂයන් සඳහා අධි ප්‍රතිපාදන සැලසීම නිසා මෙම ඉතිරියන් ඇති වී තිබුණු බවද නිරික්ෂණය විය.

**(ආ) අග්‍රිම ගිණුම්**

2008 ජනවාරි 09 දින සිට පැවත එමින් තිබු රු.83,325 ක් වූ අග්‍රිම ශේෂය 2012 දෙසැම්බර් 31 දිනටද පියවීමට ක්‍රියා කර නොතිබුණි.

**(ඇ) ආදායම් ගිණුම**

(i) ඉදිරිපත් කළ ගිණුමට අනුව රු.270,798,938 ක් වු ආදායම් හිඟ හිට තිබුණු අතර, එම හිඟහිටි ආදායම වර්ෂ 1ට අඩු සහ වර්ෂ 4ට වැඩි කාල පරාසයකට අදාල විය. එම හිඟ හිටි ආදායම් අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දූර්වල තත්ත්වයක පැවැතුණි.

(ii) 2012 වර්ෂයේ රු.50,000,000 ක් වූ මූලික ආදායම් ඇස්තමේන්තුව රු.100,000,000 ක් ලෙස සංශෝධනය කර තිබුණද රැස් කරන ලද ශුද්ධ ආදායම රු. 289,427,871 ක් වුයෙන් එය මූලික ආදායම් ඇස්තමේන්තුවෙන් සියයට 579 ක් සහ සංශෝධිත ආදායම් ඇස්තමේන්තුවෙන් සියයට 289 ක් විය .ඒ අනුව ආදායම් ඇස්තමේන්තු කිරීම නිසි අධ්‍යයනයකින් සහ සැලකිල්ලකින් සිදුකර නොතිබුණි .

(iii) ඉදිරිපත් කර ලද ආදායම් ගිණුම අනුව 2011 වර්ෂයේ රැස් කරන ලද ශුද්ධ ආදායම රු.4,640 ක් වුවද 2012 ,වර්ෂයේ රැස් කරන ලද ශුද්ධ ආදායම රු.289,427,871 ක් වුයෙන් රු. 289,423,231 ක ආදායමේ විශාල වැඩි වීමක් සිදුවී තිබුණි .මෙම ආදායම් විචලතාවයට හේතු වී ඇත්තේ ශ්‍රී ලංකා නාවික හමුදාවෙන් සහ බන්ධනාගාර දෙපාර්තමේන්තුවෙන් ඉකුත් වර්ෂ වලට අදාල ලැබිය යුතු හිඟ ආදායම් පිළිවෙලින් රු.250,000,000 ක් සහ රු.39,427,871 ක් 2012 වර්ෂය තුල මෙම ආදායම් සංකේතාංකයට බැරකර තිබීමයි .

(iv) 2012 වර්ෂය සඳහා ඇස්තමේන්තු කළ ආදායම රු.50,000,000 සිට රු.100,000,000 දක්වා සංශෝධනය කර තිබුණද මුදල් රෙගුලාසි 85(2)(ආ) අනුව ඒ බව රාජ්‍ය මුල්‍ය ප්‍රතිපත්ති අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත වාර්තා කිරීමට කටයුතු කර නොතිබුණි.

(v) 2002 ජුලි 17 දිනැති අංක 2002/01 දරන රාජ්‍ය මුල්‍ය ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු චක්‍රලේඛයේ 7 ඡේදය අනුව ආදායම් ගිණුමට අදාල අර්ධ වාර්ෂික ආදායම් වාර්තා, රාජ්‍ය මුල්‍ය ප්‍රතිපත්ති අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(vi) 2006 සැප්තැම්බර් 27 දිනැති අංක 2006/187 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 4 ඡේදය ප්‍රකාරව දළ ආදායම් සම්බන්ධයෙන් භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත , දෙපාර්තමේන්තුවේ පොත් සමඟ සසඳා ඒ බව ඊලඟ මාසයේ අවසාන දිනය වන විට රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත වාර්තා කළ යුතු වුවත් ,ශ්‍රී ලංකා නාවික හමුදාව සහ බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් අත්තිකාරම් ගිණුම්වලින් රැස් කරනු ලබන ආදායම් සම්බන්ධයෙන් මෙම දෙපාර්තමේන්තුව පොත් පත් පවත්වා නොගන්නා බැවින් අදාල සැසදීම් සිදු නොකෙරෙන බව නිරීක්ෂණය විය.

(vii) මෙම ආදායම් සංකේතාංකයට ආදායම් බැර කරනු ලබන ආයතන දෙකෙහි හිඟ ආදායම් කිසිවක් නොමැති බව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් 2013 මැයි 31 දිනැති අංක බීඩී/ආගි 2010/ලිපිය මගින් විගණනය වෙත දැනුම් දී තිබුණද ඉදිරිපත් කරන ලද ආදායම් ගිණුමේ සමාලෝචිත වර්ෂය අවසාන වන විට මුළු ශුද්ධ හිඟ මුදල රු 178,000,000.ක් ලෙස දක්වා තිබුණි .එසේම ශුද්ධ හිඟ මුදල රු 178,000,000.ක් ලෙස දක්වා තිබුණද ශ්‍රී ලංකා නාවික හමුදාවේ සහ බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ අත්තිකාරම් ගිණුම්වලට අනුව සත්‍ය හිඟ මුදල රු 270,798,938.ක් බව විගණනයේදී අනාවරණය විය .

(viii) මුදල් රෙගුලාසි 128 (2) (ඇ)ප්‍රකාර එක් එක් මුදල් වර්ෂයේ ජුනි 30 දිනට සහ දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම් පිළිබඳ තත්ත්වය පෙන්නුම් කෙරෙන අර්ධ වාර්ෂික වාර්තා පිළියෙල කර විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ix) 2011 වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද ආදායම් ගිණුමේ 2011 වර්ෂයට අදාල හිඟ ආදායම් රු. 150,000,000 ක් ලෙසත් 2012 වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබු ආදායම් ගිණුමේ 2011 වර්ෂයට අදාල හිඟ ආදායම රු.288,000,000 ක් ලෙසත් දක්වා තිබුණි.එහෙත් ආදායම් රැස් කරන ශ්‍රී ලංකා නාවික හමුදාවේ සහ බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ අත්තිකාරම් ගිණුම් අනුව අදාල හිඟ මුදල රු.162,713,169ක් බව විගණනයේදී අනාවරණය විය .

(x) 2011 වර්ෂයට පෙර වර්ෂ සඳහා වු හිඟ මුදලක් නොමැති බව ආදායම් ගිණුමේ දක්වා තිබුණද ශ්‍රී ලංකා නාවික හමුදාවේ සහ බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ අත්තිකාරම් ගිණුම්වලින් පිළිවෙලින් රු.165,216,126 ක් සහ රු.86,289,503 ක් එනම් එකතුව රු. 251,505,629 ක් ලැබිය යුතු හිඟ ආදායමක් 2011වර්ෂයට පෙර වර්ෂ සඳහා පැවති බව එම ආයතනවල ගිණුම් අනුව විගණනයේදී අනාවරණය විය.

(xi) බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සහ ශ්‍රී ලංකා නාවික හමුදාවේ 2012 වර්ෂයේ අත්තිකාරම් ගිණුම්වලින් ලැබිය යුතු හිඟ ආදායම් පිළිවෙලින් රු.45,566,785 ක් සහ රු.100,441,256 ක් එනම් එකතුව රු.146,008,041 ක් වුවත් ආදායම් ගිණුමේ “වාර්තා කරනු ලබන වසරට අදාල හිඟ මුදල් ”රු.140,000,000 ක් ලෙස එනම් රු.6,008,011 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(xii) බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සහ ශ්‍රී ලංකා නාවික හමුදාවේ අත්තිකාරම් ගිණුම්වලින් සමාලෝචිත වර්ෂයේදී පිළිවෙලින් රු.39,427,871 ක් සහ රු.250,000,000 එනම් එකතුව රු.289,427,871ක් ඉකුත් වර්ෂවලට අදාලව හිඟ මුදල් ලෙස ලැබී තිබුණද ආදායම් ගිණුමේ "වාර්තා කරනු ලබන වසර තුල හිඟ මුදලට අනුරූපීව රැස් කරන ලද මුළු ප්‍රමාණය "ලෙස රු.250,000,000ක් පමණක් එනම් රු.39,427,871ක් අඩුවෙන් දක්වා තිබුණි .

(xiii) බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ අත්තිකාරම් ගිණුමට අදාලව 2009 වර්ෂයේදී සහ 2010 වර්ෂයේදී උපයන ලද ශුද්ධ ආදායමෙන් 2010 හා 2011 වර්ෂවලදී ලැබී තිබුණු පිළිවෙලින් රු.46,622,554 ක් සහ රු.39,666,949 ක් මෙම ආදායම් ගිණුමට බැර කරනු වෙනුවට අංක 20.03.02.99දරන "විවිධ "ආදායම් ගිණුමට 2010 සහ 2011 වර්ෂවලදී සාවද්‍යාව බැරකර තිබුණි .මෙම වැරදි බැර කිරීම නිවැරදි කිරීමට මෙතෙක් කටයුතු කර නැත.

**(ඇ) රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

**------------------------------------------------------------------------**

විෂය අංක 24001 දරන රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2012 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශනය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.481,629 ක් වු අතර, එම හිඟ හිටි ශේෂ අයකර ගැනීමට ක්‍රියා කර නොතිබුණි.

**5.4 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය**

**---------------------------------------**

**5.4.1 සංයුක්ත සැලැස්ම**

**-------------------**

2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5 (4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03ක් සඳහා සංයුක්ත සැලැස්ම දෙපාර්තමේන්තුව විසින් වර්ෂය ආරම්භයේදී පිළියෙල කළ යුතු වුවත්,එම සැලස්ම 2013 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙළ කර නොතිබුණි.

**5.4.2 වාර්ෂික කාර්යසාධන වාර්තා**

**------------------------------**

ඉහත 5.4.1 ඡේදයෙහි සඳහන් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියේ සඳහන් 2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 හා 2004 පෙබරවාරි 20 දිනැති අංක 402(1) රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාර දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කළ යුතු වාර්ෂික කාර්යසාධන වාර්තාව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත විගණකාධිපතිට පිටපතක් සහිතව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාල කාර්ය සාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරිම සඳහා ඉදිරිපත් කර තිබුණේ 2013 ඔක්තෝබර් 31 දිනදීය.

**5.5 අනුකූල නොවීම්**

**නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණ වලදි නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| මුදල් රෙගුලාසි | | |
| (i) මුදල් රෙගුලාසි 110 (2) | - | 2012 වර්ෂට අදාලව සිදු වූ වාහන අනතුරු පිළිබඳ විස්තර විසර්ජන ගිණුමේ ඇතුලත් කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 371 (ආ) | 87,340 | එක් අවස්ථාවකදී තත් කාර්ය අතුරු අග්‍රිමයක් වශයෙන් ලබා දෙන මුදල රු.20,000 ට වැඩි නොවිය යුතු වුවත් ඊට පටහැනිව අවස්ථා 3 කදී මාණ්ඩලික නිලධාරියෙකු වෙත අතුරු අග්‍රිම මුදල් ලබා දී තිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 371 (ඇ) | 7,000 | තත් කාර්ය අතුරු අග්‍රිම යටතේ ඉන්ධන අත්තිකාරම් ලෙස දෙන ලද මුදල් පියවීමට මාස 3 ½ ක පමණ කාලයක් ගත කර තිබුණි. |

**5.6 කාර්ය සාධනය**

සමාලෝචිත වර්ෂයේදි සංවර්ධන වැඩසටහන යටතේ ප්‍රතිපාදන සලසා ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ අයවැය යෝජනා 30 කින් අයවැය යෝජනා 15 ක් සඳහා වෙන් කළ රු.5,000,000,000 ක් වූ මුළු ප්‍රතිපාදනයද ඉතිරි යෝජනා 15 සඳහා වෙන් කරන ලද රු.12,625,000,000 ක් වූ ප්‍රතිපාදන වලින් සියයට 80 ක් එනම් රු.10,073,700,000 ක් වෙනත් වැය විෂයයන් වෙත මුදල් රෙගුලාසි 66 යටතේ මාරු කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදි ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි.

## 5.7 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (අ) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 36 | 22 | 14 |
| (ආ) | තෘතියික මට්ටම | 02 | 02 | - |
| (ඇ) | ද්විතීයික මට්ටම | 83 | 65 | 18 |
| (ඈ) | ප්‍රාථමික මට්ටම | 37 | 32 | 5 |
| | එකතුව | 158 | 121 | 37 |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පැවති පුරප්පාඩු 37 ක් පිරවීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

## 6. ශීර්ෂය 241 - රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව

### 6.1 විගණන විෂය පථය

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා ආදායම් ගිණුම් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 නොවැම්බර් 27දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුලත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 6.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුලත් වේ.

### 6.3 විගණන නිරීක්ෂණ

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම,ආදායම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 6.4 සිට 6.8 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) අයවැය විචලනය**

(i) වැය විෂයයන් 01 ක් සඳහා සලසා තිබුණු රු.1,500,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ii) වැය විෂයයන් 09 කට එකතුව රු. 14,455,000 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර එයින් එකතුව රු. 10,522,719 ක් උපයෝජනය කිරීමෙන් පසු රු. 3,932,281 ක ඉතිරියක් නිරීක්ෂණය විය.එම ඉතිරිය එම වැය විෂයයන් යටතේ සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 11 සිට සියයට 85 දක්වා වූ පරාසයක් ගෙන තිබුණි.වැය විෂයන් සඳහා අධි ප්‍රතිපාදන සැලසීම නිසා මෙම ඉතිරියන් ඇති වී තිබුණු බව නිරීක්ෂණය විය.

(iii) රාජ්‍ය ව්‍යාපාර ප්‍රතිසංස්කරණ කොමිෂමට අදාල ගෙවීම් 241-1-1-1503 (රාජ්‍ය ව්‍යාපාර ප්‍රතිසංස්කරණ කොමිෂම- රාජ්‍ය ආයතන) වැය විෂයයෙන් සිදු කළ යුතු වුවද, රු.4,743,309 ක් වූ පාරිතෝෂික ගෙවීම් 241-1-1-1405 (වෙනත්) වැය විෂයයෙන් සිදු කර තිබුණි.

**(ආ) ආදායම් ගිණුම්**

(i) මුදල් රෙගුලාසි 128 (2) ප්‍රකාරව ආදායම් සංකේතාංක දෙකකට(2) කට අදාල හිඟ ආදායම් පිළිබඳ වාර්තා පිලියෙල කර නොතිබුණි.

(ii) ආදායම් සංකේතාංකය - 20.02.03.00-ලාභ

i. ආදායම් ඇස්තමේන්තු සැකසීම

සමාලෝචිත වර්ෂයේ රු.30,091,000,000 ක් වූ මුලික ඇස්තමේන්තුව රු.36,459,060,000 ක් ලෙස සංශෝධනය කර තිබුණද, වර්ෂය තුල රැස්කර තිබු ශුද්ධ ආදායම රු.42,214,108,456 ක් විය. එනම්, මුලික ඇස්තමේන්තු ආදායම හා සසඳන විට සියයට 140 ක් සහ සංශෝධිත ආදායම හා සසඳන විට සියයට 116 ක් විය. ඒ අනුව, ඇස්තමේන්තු කිරීම නිසි අධ්‍යයනයකින් සිදු කර නොතිබු බව නිරීක්ෂණය විය.

ii. හිඟ ආදායම් සම්බන්ධයෙන් වාර්තා කිරීම

හිඟ ආදායම් වාර්තා පවත්වා නොගැනීම නිසා ලැබිය යුතු ආදායම්, දෙපාර්තමේන්තු පොත්වලින් අනාවරණය නොකෙරුණි.

- 2012 වර්ෂයේදී ශ්‍රී ලංකා රූපවාහිනි සංස්ථාවෙන් 2007 වර්ෂයට අදාලව රු.5,000,000 ක් ලැබී තිබුණද එය හිඟ ආදායම් ලෙස දෙපාර්තමේන්තු පොත්වල සටහන් කර නොතිබුණි.

- රූපවාහිනි සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශයන්ට අනුව 2011 වර්ෂය සඳහා ප්‍රකාශ කරන ලද ලාභ රු.32,498,000 ක් ද 2012 වර්ෂය සඳහා ප්‍රකාශ කරන ලද ලාභ රු.922,000 ක් ද විය. දෙපාර්තමේන්තු පොත්වල එම සංස්ථාවෙන් ලැබිය යුතු ආදායම් ලෙස කිසිදු මුදලක් සටහන් වී නොතිබුණි.

iii. ලාභ ලබන ආයතනවලින් ලැබිය යුතු ලාභ කොටස් ඇස්තමේන්තුවට ඇතුලත් නොකිරීම

- ආයතන 12 ක් විසින් 2012 වර්ෂයේදී රු.මිලියන 21,508 ක ලාභයක් උපයා ගෙන තිබුණද එම ලාභවලින් මෙම ආදායම් සංකේතයට අදාල ප්‍රමාණය ඇස්තමේන්තු කර දෙපාර්තමේන්තු පොත්වල ලැබිය යුතු ආදායමක් ලෙස දක්වා නොතිබුණි.

- ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව විසින් 2011 සහ 2012 වර්ෂවල පිළිවෙලින් රු.මිලියන 113 ක් සහ රු.මිලියන 163 ක් ද, රාජ්‍ය මුද්‍රණ සංස්ථාව විසින් 2011 සහ 2012 වර්ෂවල පිළිවෙලින් රු.මිලියන 134 ක් සහ රු.මිලියන 141 ක්ද ලාභ ලබා තිබුණද ආදායම් සංකේතයට අදාල ප්‍රමාණය ඇස්තමේන්තු කර දෙපාර්තමේන්තු පොත්වල ලැබිය යුතු ආදායමක් ලෙස දක්වා නොතිබුණි.

iv. ලාභ ලැබීමට නියමිත ආයතන

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් විගණනයට ඉදිරිපත් කරන ලද ලාභ ලැබීමට නියමිත ආයතනයන් වර්ගීකරණය කරන ලද වාර්තාවේ ලාභ ලැබීමට නියමිත ආයතන සංඛ්‍යාව 199 ක් ලෙස දක්වා තිබුණද ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී ආයතන 24 ක් පමණක් සැලකිල්ලට ගෙන තිබුණි.

(iii) ආදායම් සංකේතාංකය - 20.02.04.00-ලාභාංශ

i. ආදායම් ඇස්තමේන්තු සැකසීම

සමාලෝචිත වර්ෂයේ රු.8,012,000,000 ක් වූ මුලික ඇස්තමේන්තුව රු.5,096,800,000 ක් ලෙස සංශෝධනය කර තිබුණ අතර වර්ෂය තුළ රැස්කර තිබූ ශුද්ධ ආදායම රු.4,546,957,702 කි. එනම්, මුලික ඇස්තමේන්තු ආදායම හා සසඳන විට සියයට 57 ක් සහ සංශෝධිත ඇස්තමේන්තු ආදායම හා සසඳන විට සියයට 89 ක් විය. ඒ අනුව, ඇස්තමේන්තු කිරීම නිසි අධ්‍යයනයකින් සිදු කර නොතිබූ බව නිරීක්ෂණය විය.

ii. හිඟ ආදායම් සම්බන්ධයෙන් වාර්තා කිරීම

දෙපාර්තමේන්තුව විසින් හිග ආදායම් වාර්තා පවත්වා නොගැනීම නිසා ලැබිය යුතු ආදායම් කොපමණද යන්න දෙපාර්තමේන්තු පොත්වලින් අනාවරණය නොවුණි.

උදාහරණ ලෙස 2012 සැප්තැම්බර් 27 දින රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් හලාවත වැවිලි සමාගම වෙත යවන ලද ලිපියට අනුව එම සමාගමෙන් 2010 වර්ෂයට අදාලව රු.මිලියන 75 ක මුදලක් ලාභාංශ වශයෙන් ලැබිය යුතු වුවද එම මුදල මේ වන තෙක් ලැබී නොතිබුණු අතර හිඟ ආදායම් ලෙසද පොත්වල සටහන් කර නොතිබුණි.

iii. ලාභ ලබන ආයතන ඇස්තමේන්තුවට ඇතුලත් නොකිරීම

ආයතන 08 ක් විසින් 2012 වර්ෂයේදී රු.මිලියන 8,463 ක ලාභයක් උපයා ගෙන තිබුණද එම ලාභයෙන්, මෙම ආදායම් සංකේතාංකයට අදාල ප්‍රමාණය ඇස්තමේන්තු කර පොත්වල ලැබිය යුතු ආදායමක් ලෙස දක්වා නොතිබුණි.

iv. ලාභාංශ ලැබීමට නියමිත ආයතන

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් විගණනයට ඉදිරිපත් කරන ලද ලාභාංශ ලැබීමට නියමිත ආයතනයන් වර්ගීකරණය කරන ලද වාර්තාවේ,ලාභාංශ ලැබීමට නියමිත ආයතන සංඛ්‍යාව 52 ක් ලෙස දක්වා තිබුණද ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී ආයතන 24 ක් පමණක් සැලකිල්ලට ගෙන තිබුණි.

**(ඇ) රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 24101 දරන රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2012 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟ හිට තිබුණු ශේෂවල එකතුව රු.745,556 ක් වූ අතර එම හිඟ හිටි ශේෂ අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

**6.4 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය**

**6.4.1 සංයුක්ත සැලැස්ම**

2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5 (4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය ප්‍රකාරව 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැලැස්මක් දෙපාර්තමේන්තුව විසින් වර්ෂය ආරම්භයේ පිළියෙල කළ යුතු වුවත්, එම සැලැස්ම මෙම වාර්තාවේ දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

**6.4.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

ඉහත 6.4.1 ජේදයෙහි සඳහන් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියේ සඳහන් පිලිවෙලින් 2002 සැප්තැම්බර් 12 හා අංක 402 සහ 2004 පෙබරවාරි 20 දින දරන අංක 402(1) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාර, දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කළ යුතු වාර්ෂික කාර්ය සාධන වාර්තාව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත විගණකාධිපතිට පිටපතක් සහිතව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාල කාර්ය සාධන වාර්තාව 2013 නොවැම්බර් 11 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

### 6.4.3 විගණන හා කළමනාකරණ කමිටුව ක්‍රියාත්මක කිරීම

අවම වශයෙන් කාර්තුවකට එක් වරක්වත් විගණන හා කළමනාකරණ කමිටුව රැස්වීම් පැවැත්විය යුතු වුවත්, 2012 වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා තිබුණේ වර්ෂයකට 03 ක් පමණි.

### 6.5 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම්**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථාවක් පහත දැක්වේ.

1994 අගෝස්තු 10 දිනැති අංක 96 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9 (iv) ඡේදය ප්‍රකාරව ණය පාලන ගිණුමක් පවත්වා ගෙන ගොස් නොතිබුණි.

### 6.6 කාර්ය සාධනය

2012 වාර්ෂික ක්‍රියාකාරි සැලසුම්වලට අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් ප්‍රමාණවත් ලෙස ඉටු නොකර තිබුණු අතර එසේ නිරීක්ෂණය වූ අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(අ) රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශය යාවත්කාලීන කිරීම-
මෙය 2011 වර්ෂයේදීද ඉටු නොකර ඇති කාර්යයක් ලෙස දක්වා තිබුණද මේ වන තෙක් එය එසේම පවතී.

(ආ) අක්‍රීය තත්ත්වයේ පවතින රාජ්‍ය ව්‍යාපාර නගා සිටුවීම

(ඇ) පිරිවැය ගිණුම් ක්‍රමය හඳුන්වා දීම

### 6.7 අනාර්ථික ගනුදෙනු

රාජ්‍ය ව්‍යාපාර ප්‍රතිසංස්කරණ කොමිෂම මේ වන විට ක්‍රියාකාරි ආයතනයක් නොවන අතර මෙම කොමිෂමේ සේවය කරන ලද නිලධාරින්ද 2011 ජනවාරි 01 දින සිට රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත අනුයුක්ත කර තිබුණි. නමුත්, එම කොමිෂම පවත්වාගෙන යනු ලැබූ ලෝහෝර් ආර්යා අරමුදලට අයත් ගොඩනැගිල්ලේ පවත්වාගෙන ගිය කාර්යාලය වෙනුවෙන් තවදුරටත් ඒ මාසික කුලිය රු.56,000 බැගින් 2012 වර්ෂය තුලදී රු.616,000 ක මුදලක් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් ලෝහෝර් ආර්යා ණය අරමුදලට ගෙවා තිබුණි. අදාල කුලී ගෙවීමට අදාල ගිවිසුමේ නීතිඥ ගාස්තු වශයෙන් රු.6,000 ක් ද ගෙවා තිබුණි.

**6.8 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (අ) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 22 | 21 | 01 | - |
| (ආ) | තෘතියික මට්ටම | 04 | 04 | - | - |
| (ඇ) | ද්විතීයික මට්ටම | 34 | 20 | 14 | - |
| (ඈ) | ප්‍රාථමික මට්ටම | 15 | 15 | - | - |
| (ඉ) | වෙනත් (අනියම්/තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | - | - | - | 03 |
| | එකතුව | 75 | 60 | 15 | 03 |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 15 ක් පැවති අතර අතිරික්ත සේවක සංඛ්‍යාව 03 ක් සඳහා විධිමත් අනුමැතියක් ලබාගැනීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

## 7. ශීර්ෂය - 242 කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

### 7.1 විගණන විෂය පථය

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 ජනවාරි 27 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුලත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 7.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මුල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුලත් වේ.

### 7.3 විගණන නිරීක්ෂණ

2012 දෙසැම්බර් 31 දිනට මුල්‍ය වාර්තා හා පොත් අනුව රාජ්‍ය මුල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශ, මෙහි (අ) පොදු නිරීක්ෂණය සහ පහත 7.4 සහ 7.5 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) අයවැය විචලනය**

වැය විෂයයන් තුනකට (03) එකතුව රු.881,000 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර එයින් එකතුව රු.292,069 ක් උපයෝජනය කිරීමෙන් පසු රු.588,931 ක ඉතිරියක් නිරීක්ෂණය විය.එම ඉතිරිය එම එක් එක් වැය විෂයය සඳහා සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 53 සිට සියයට 100 දක්වා වූ පරාසයක් ගෙන තිබුණි.වැය විෂයන් සඳහා අධි ප්‍රතිපාදන සැලසීම නිසා මෙම ඉතිරියන් ඇති වී තිබුණු බව නිරීක්ෂණය විය.

**7.4 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය**

**සංයුක්ත සැලැස්ම**

2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5 (4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03ක් සඳහා සංයුක්ත සැලැස්මක් දෙපාර්තමේන්තුව විසින් වර්ෂය ආරම්භයේදී පිළියෙල කළ යුතු වුවත්,එම සැලස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙළ කර නොතිබුණි.

**7.5 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (අ) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 22 | 11 | 11 |
| (ආ) | තෘතියික මට්ටම | 02 | 02 | - |
| (ඇ) | ද්විතීයික මට්ටම | 40 | 35 | 05 |
| (ඈ) | ප්‍රාථමික මට්ටම | 13 | 11 | 02 |
| | එකතුව | 77 | 59 | 18 |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 18 ක් පිරවීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

## 8. විසර්ජන ශීර්ෂය 243 - සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව

### 8.1 විගණන විෂය පථය

සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 නොවැම්බර් 06 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශය පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශය පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුලත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 8.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශය පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුලත් වේ.

### 8.3 විගණන නිරීක්ෂණ

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 8.4 සිට 8.7 දක්වා ජේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) අයවැය විචලනය**

(i) වැය විෂයයන් 03 ක් සඳහා සළසා තිබුණු එකතුව රු.302,234,402 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි. මින් එක් වැය විෂයයක් සඳහා රු.1,764,952 ක ප්‍රතිපාදන මුදල් රෙගුලාසි 66 වීරමොං ක්‍රියාපටිපාටිය මගින් ලබාගෙන තිබුණි.

(ii) වැය විෂයයන් එකොළහක් (11)සඳහා එකතුව රු.2,207,838,650 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර එයින් එකතුව රු.1,861,452,119 ක් උපයෝජනය කිරීමෙන් පසු රු.346,386,531 ක ඉතිරියක් නිරීක්ෂණය විය. එම ඉතිරිය එම එක් එක් වැය විෂයය සඳහා සළසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 9 සිට සියයට 91 දක්වා වූ පරාසයක ප්‍රතිශතයක් ගෙන තිබුණි. වැය විෂයයන් සඳහා අධි ප්‍රතිපාදන සැලසීම නිසා මෙම ඉතිරිවීම් සඳහා හේතු වී තිබුණු බව නිරීක්ෂණය විය.

**(ආ) ඉන්ධන හා විදුලි වියදම් කළමනාකරණය**
**-----------------------------------------------**

2012 පෙබරවාරි 16 දිනැති අංක 156 දරන අයවැය චක්‍රලේඛයෙන් ලබා දී තිබූ උපදෙස් නොතකා ඉන්ධන හා විදුලි වියදම් සම්බන්ධ වැය විෂයයන් සඳහා මුදල් රෙගුලාසි 66 මගින් රු.167,280 ක් ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂයේදී මාරු කර තිබුණි.

**(ඇ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**
**-----------------------------------------------------------------------**

(i) 2012 වර්ෂයේ මාර්තු සහ මැයි මාසවලදී පිළිවෙලින් රු.46,000 ක් හා රු.56,000 ක් ලෙස රියදුරු මහතුන් දෙදෙනෙකුට අවස්ථා දෙකකදී (2) ලබා දුන් එකතුව රු.102,000ක ආපදා ණය මුදල වෙනුවෙන් ණය වාරික හා ඊට අදාල පොළිය 2012 අගෝස්තු මස දක්වාම එනම් ඔවුන් ස්ථාන මාරු වී ගිය දින දක්වාම අයකර ගෙන නොතිබුණි.

(ii) 2012 අගෝස්තු 06 දින දේශිය ආදායම් දෙපාර්තමේන්තුවට ස්ථාන මාරු වී ගිය ඉහත සඳහන් එක් රියදුරු මහතෙකුගේ ණය ශේෂයට රු. 46,000 ක් වූ ආපදා ණය මුදල එකතු කර නොතිබුණි.

**8.4 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය**
**---------------------------------------------**

**වාර්ෂික කාර්යසාධන වාර්තාව**
**---------------------------------**

2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5 (4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියේ සඳහන් 2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 සහ 2004 පෙබරවාරි 20 දිනැති අංක 402(1) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාර දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කළ යුතු වාර්ෂික කාර්යසාධන වාර්තාව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත විගණකාධිපතිට පිටපතක් සහිතව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාල කාර්ය සාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කර තිබුණේ 2013 අගෝස්තු 21 දිනදීය.

**8.5 අනුකූල නොවීම්**
**--------------------**

**නිති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**
**------------------------------------------------**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | | |
| (i) | 1992 ජනවාරි 25 දිනැති අංක 03/92 දරන චක්‍රලේඛය | (i) පෙ.ව.8.30 ත් පෙ.ව.9.00 ත් අතර ඕනෑම වේලාවක කාර්යාලයට පැමිණෙන නිලධාරියකු එසේ ප්‍රමාද වන කාලය ප.ව.4.15 න් පසුව ප.ව.4.45 තෙක් වැඩ ආවරණය කිරීමට ඉඩදෙනු ලැබුවත් ප්‍රමාද කාලය ආවරණය නොකර කාර්යාලයෙන් නිලධාරින් පිටවූ අවස්ථා නිරීක්ෂණය විය.<br><br>(ii) පෙ.ව.8.00 ත් පෙ.ව.8.15 ත් අතර කාර්යාලයට පැමිණෙන සුළු සේවකයින් එසේ ප්‍රමාද වූ කාලය ප.ව. 4.45 න් පසුව ආවරණය කිරිමට ඉඩ දෙනු ලැබුවත් මෙම දෙපාර්තාමේන්තුවේ සුළු සේවකයින් පෙ.ව. 8.15 න් පසුව සේවයට වාර්තා කර තිබුණද බොහෝ අවස්ථාවලදි එම ප්‍රමාද කාලයන් ආවරණය කර නොතිබුණි. |
| (ii) | 1994 ජනවාරි 21 දිනැති අංක 06/94 දරන චක්‍රලේඛය | යම් නිලධාරියකු ඉහත (i) පරිදි කටයුතු කිරීමට අපොහොසත් වුවහොත් එවැනි ප්‍රමාද වන අවස්ථා තුනක් සඳහා අදාල නිලධාරියාගේ නිවාඩුවලින් දින භාගයක් නිවාඩු අඩු කළ යුතු වුවත් එසේ කර නොතිබුණි. |
| (iii) | 2006 මැයි 30 දිනැති අංක 09/2006 දරන චක්‍රලේඛය | රජයේ සේවයේ නියුතු කණිෂ්ඨ සේවකයින් හැර අනිකුත් සියළුම සේවකයින්ගේ කාර්යාල වේලාව පෙ.ව.8.30 සිට ප.ව.4.15 දක්වා වන නමුත් දෙපාර්තමේන්තුවේ නිලධාරින් පෙ.ව.9.00 පසුවී රාජකාරියට පැමිණි අවස්ථා විය. මෙම අවස්ථාවලදී කෙටි නිවාඩු ලබා ගැනීමක් හෝ දින භාගයක (½) නිවාඩු ලබා ගැනීමක් සිදු කර නොතිබුණි. |
| (iv) | 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන චක්‍රලේඛය | රාජ්‍ය ආයතනවල නිළධාරීන් සේවා ස්ථානයට පැමිණීම හා පිටවීම ඇඟිලි සළකුණු යන්ත්‍රය මඟින් සනාථ කළ යුතු වුවද දෙපාර්තමේන්තුව මඟින් ලබා දුන් ඇඟිලි සළකුණු යන්ත්‍ර මුද්‍රිත පිටපත් පරීක්ෂාවේදී නිළධාරින්ගේ පැමිණිමේ හෝ පිටවිමේ යන දෙකෙන් එක් වේලාවක් පමණක් සටහන් කර තිබූ අවස්ථා නිරීක්ෂණය විය. |

**8.6 කාර්ය සාධනය**

**ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන්**

**(අ) ස්වයං රැකියා ණය ලබාදීමේ ව්‍යාපෘතිය**

2013 අයවැය යෝජනාවක් මත ආරම්භ වූ පුනරුත්ථාපනය කරන ලද අභ්‍යාසලාභීන්ට ස්වයං රැකියා ණය ලබා දීමේ ව්‍යාපෘතිය අක් මුදල් නොලැබීම නිසා ක්‍රියාත්මක කර නොතිබුණි.

**(ආ) නව සපිරි ණය යෝජනා ක්‍රමය**

මෙම යෝජනා ක්‍රමය සඳහා ද වෙන් කරන ලද මුදලින් සියයට 19 ක් එනම් රු.48,273,656 ක් අක් මුදල් නොලැබීම නිසා ඉතිරි වී තිබුණි.

**(ඇ) ගුදම් කුවිතාන්සි මුල්‍යකරණ ව්‍යාපෘතිය**

මෙම ව්‍යාපෘතියේ ගිවිසුම 2012 ජුලි මාසයේ ලෝක බැංකු සමඟ අත්සන් කර තිබුණද එහි කටයුතු එම වසර තුලදී ආරම්භ නොකිරීම නිසා විදේශිය අරමුදල් යටතේ වෙන් කර තිබූ රු.300,000,000 ක මුළු මුදලම හා ඒකාබද්ධ අරමුදලින් වෙන් කර තිබූ මුදලින් සියයට 69 ක් එනම් රු.16,881,754 ක් ද ඉතිරි වී තිබුණි.

(ඈ) කුඩා, මධ්‍යම හා සුක්ෂම ග්‍රාමීය ව්‍යාපාර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන වැඩ සටහන සඳහා 2010 පෙබරවාරි 23 දින සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල සමඟ ශ්‍රී ලංකා රජය ගිවිසුම් අත්සන් කර තිබුණද, මෙම ව්‍යාපෘතිය ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ දිවි නැගුම ව්‍යාපෘතියට බද්ධව ක්‍රියාත්මක කිරිමට පියවර ගත් බව දැනුම් දී තිබුණි. එසේ වුවද භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් හරහා 2012 වර්ෂය තුලදී රු.11,618,165 ක් විදේශිය අරමුදල් යටතේද රු.188,788 ක් ඒකාබද්ධ අරමුදල යටතේ වූ වැය විෂයයන්ට හර කර තිබුණ අතර මෙම වියදම් ව්‍යාපෘති කාර්ය මණ්ඩල වැටුප්, සමාජ සජීවී කාරකයන් සඳහා වැටුප්, පුහුණු කිරීමේ වියදම්, මිලදී ගැනීම් හා බදු ගෙවීම් බව වාර්තා කර තිබුණි.
ඒ අනුව වෙන් කරන ලද මුදලින් විදේශිය අරමුදල් යටතේ සියයට 97 ක් එනම් රු.338,381,836 ක් හා දේශිය අරමුදලින් සියයට 81 ක් එනම් රු.811,212 ක් වශයෙන් එකතුව රු.339,193,048 ක් ඉතිරි වී තිබුණි.

**8.7 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (අ) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 10 | 09 | 01 |
| (ආ) | ද්විතීක මට්ටම | 07 | 06 | 01 |
| (ඇ) | ප්‍රාථමික මට්ටම | 09 | 09 | - |
| | එකතුව | 26 | 24 | 02 |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 02ක් පිරවීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

## 9. ශීර්ෂය 244 – වෙළඳ තීරුබදු හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

### 9.1 විගණන විෂය පථය

වෙළඳ තීරු බදු හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014ජනවාරි 21 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුලත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 9.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයක් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුලත් වේ.

### 9.3 විගණන නිරීක්ෂණ

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව වෙළඳ, තීරු බදු හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ, මෙහි (අ) පොදු නිරීක්ෂණය සහ පහත 9.4 සිට 9.7 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

#### (අ) අයවැය විචලනය

(i) වැය විෂයයන් 03 ක් සඳහා සලසා තිබුණු එකතුව රු.804,510,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ii) වැය විෂයයන් 07 ක් සඳහා එකතුව රු.3,900,000 ක මුදල් ප්‍රතිපාදන සලසා තිබුණ ද එයින් එකතුව රු.2,473,809ක් උපයෝජනය කිරිමෙන් පසු රු.1,426,191ක ඉතිරියක් තිබූ බව නිරික්ෂණය විය. එම ඉතිරිය එක් එක් වැය විෂයය සඳහා සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 27 සිට සියයට 92 දක්වා වූ පරාසයක ප්‍රතිශතයක් ගෙන තිබුණි. වැය විෂයන් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා මෙම ඉතිරිවීම් සිදු වී තිබුණු බව නිරික්ෂණය විය.

**9.4 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය**

**9.4.1 සංයුක්ත සැලැස්ම**

2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5 (4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැලැස්මක් දෙපාර්තමේන්තුව විසින් වර්ෂය ආරම්භයේ පිළියෙල කළ යුතු වුවත්, එම සැලැස්ම මෙම වාර්තාවේ දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

**9.4.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

ඉහත 9.4.1 හි සඳහන් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියේ සඳහන් 2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 හා 2004 පෙබරවාරි 20 දිනැති අංක 402 (1) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාර දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කළ යුතු වාර්ෂික කාර්ය සාධන වාර්තාව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත විගණකාධිපතිට පිටපතක් සහිතව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාල කාර්ය සාධන වාර්තාව මෙම වාර්තාවේ දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**9.4.3 විගණන හා කළමනාකරණ කමිටුව**

සමාලෝචිත වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටුව රැස්වීම් 03 ක් පමණක් පවත්වා තිබුණි.

**9.5 වත්කම් කළමනාකරණය**

**බේරුම් නොකළ බැරකම්**

2012 දෙසැම්බර් 31 දිනට වර්ෂ 1 ට අඩු බේරුම් නොකළ බැරකම් රු.306,228 ක් විය.

**9.6 කාර්ය සාධනය**

2012 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරි සැලැස්මට අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණය පහත දැක්වේ.

(අ) ඉන්දිය - ශ්‍රී ලංකා විස්තීරණ ආර්ථික සහයෝගීතා ගිවිසුම ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වන සාකච්ඡා සඳහා සහභාගී වීම තාවකාලික අත්හිටුවා ඇති බැවින් අදාල කාර්ය ඉටු කර නොතිබුණි.

(ආ) බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල තාක්ෂණ හා ආර්ථික සහයෝගිතා ගිවිසුම ක්‍රියාත්මක කිරීම සඳහා වූ සාකච්ඡා සඳහා සහභාගී වී නොතිබුණි.

(ඇ) ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුමේ ප්‍රගති සමාලෝචන කටයුතු නිම කර නොතිබුණි.

(ඈ) දකුණු ආසියානු නිදහස් වෙළඳ කලාපීය සහයෝගීතා ගිවිසුමේ, සංවේදී ලැයිස්තුව සංශෝධනය කිරීමට අදාල නිරීක්ෂණ කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය වෙත යවා ඇති අතර මේ වන තෙක් අදාල සංශෝධනයන් නිම කර නොතිබුණි.

(ඉ) රේගු ආඥා පනතේ 19 (අ) වගන්තියේ සඳහන් විධිවිධානයන්ට අනුව තීරු බදු නිදහස් කරන සියළු ආයතනයන් පිළිබඳ විස්තර ගැසට් මගින් ප්‍රකාශයට පත් කිරීම හා පාර්ලිමේන්තුවේ සහාගත කිරිමේ කටයුතු නිම කර නොතිබුණි.

## 9.7 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (අ) | ජොෂ්ඨ මට්ටම | 14 | 11 | 03 |
| (ආ) | ද්විතීයික මට්ටම | 25 | 23 | 02 |
| (ඇ) | ප්‍රාථමික මට්ටම | 13 | 13 | - |
| | එකතුව | 52 | 47 | 05 |

## 10. ශීර්ෂය - 245- රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව

### 10.1 විගණන විෂය පථය

රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 ජනවාරි 21 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුලත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 10.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුලත් වේ.

### 10.3 විගණන නිරීක්ෂණ

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 10.4 සිට 10.7දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

#### (අ) ගිණුම් ඉදිරිපත් කිරිම

දෙපාර්තමේන්තුව විසින් 2013 මාර්තු 31 දින වන විට පහත සඳහන් ගිණුම් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| ශීර්ෂය / විෂය අංකය | ගිණුමේ නම |
|---|---|
| 24501 | රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම |
| 999/408 | ඇවර අත්තිකාරම් ගිණුම |
| 999/407 | ඇවර අත්තිකාරම් ගිණුම |
| 0999/08 | ඇවර අත්තිකාරම් ගිණුම |

**(ආ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

1994 අගෝස්තු 10 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 96 හි 6.1 ඡේදය ප්‍රකාරව අත්තිකාරම් බී ගිණුමට අදාල සියළු ලේඛන සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට නිසි පරිදි ලියා ශේෂ කර නොතිබුණි. රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් බී පාලන ගිණුම විගණනයට ඉදිරිපත් කරන ලද්දේ 2013 ජුලි 25 දිනය. තවද රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් බී පාලන ගිණුම නිසි පරිදි ශේෂ කර නොතිබුණි.

**(ඇ) අයවැය විචලනය**

වැය විෂයය සංකේතාංක 1504 සඳහා මු.රෙ. 66 වීරමොං පටිපාටිය යටතේ ලබා දී තිබූ රු. 499,500 ක් වූ ප්‍රතිපාදන වර්ෂය අවසාන වන විටත් උපයෝජනය කර නොතිබුණි.

**10.4 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය**

**10.4.1 සංයුක්ත සැලැස්ම**

2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5 (4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03ක් සඳහා සංයුක්ත සැලැස්මක් දෙපාර්තමේන්තුව විසින් වර්ෂය ආරම්භයේදී පිළියෙල කළ යුතු වුවත්,එම සැලැස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙළ කර නොතිබුණි.

**10.4.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

ඉහත 10.4.1 ඡේදයෙහි සඳහන් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියේ සඳහන් 2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 හා 2004 පෙබරවාරි 20 දිනැති අංක 402(1) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාර දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කළ යුතු වාර්ෂික කාර්යසාධන වාර්තාව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත විගණකාධිපතිට පිටපතක් සහිතව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාල කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කර තිබුණේ 2013 ඔක්තෝබර් 23 දිනදීය.

### 10.4.3 විගණන හා කළමනාකරණ කමිටුව

සමාලෝචිත වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටුව රැස්වීම් 3 ක් පමණක් පවත්වා තිබුණි.

### 10.5 වත්කම් කළමනාකරණය

**වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

2010 දෙසැම්බර් 17 දිනැති අංක පීඑෆ්/සමීක්ෂණ මණ්ඩල/01 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය මගින් සංශෝධිත 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාර 2012 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදු කර එම වාර්තා 2013 මාර්තු 31 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණේ 2013 අප්‍රේල් 30 වන දිනය.

### 10.6 කාර්යසාධනය

දැනට ක්‍රියාත්මක වන 1992 මුදල් රෙගුලාසි සංග්‍රහය යාවත්කාලීන කිරීම වසර ගණනාවක් තිස්සේ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරී සැලැස්මෙහි ප්‍රධාන කාර්යයක් ලෙස දක්වා ඇතත් 2012 දෙසැම්බර් 31 දින වන විටත් මුදල් රෙගුලාසි සංග්‍රහය යාවත්කාලීන කිරීමේ කටයුතු නිම කර නොතිබුණි.

### 10.7 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (අ) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 27 | 15 | 12 | - |
| (ආ) | තෘතියික මට්ටම | 04 | 01 | 03 | - |
| (ඇ) | ද්විතීයික මට්ටම | 28 | 26 | 02 | 01 |
| (ඈ) | ප්‍රාථමික මට්ටම | 17 | 14 | 03 | - |
| | එකතුව | 76 | 56 | 20 | 01 |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 20 ක් පිරවීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

## 11. ශීර්ෂය 246 - දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

### 11.1 විගණන විෂය පථය

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන පොත් පත්,ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා ආදායම් ගිණුම් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 පෙබරවාරි 13 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කර ඇත. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්,විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය,මට ලැබී ඇති කාර්ය මණ්ඩලය,අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුලත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 11.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන් දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම් සහ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම සඳහා වූ සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්,වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්,රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම,පිළියෙල කිරිම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරිම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් හා ගණන් දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරිම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරිම,ක්‍රියාත්මක කිරිම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුලත් වේ.

### 11.3 විගණන නිරීක්ෂණ

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම,ආදායම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශනවල තත්ත්වය ප්‍රකාශ වන, මෙහි (අ) සිට (උ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ 11.4 සිට 11.13 දක්වා වූ ඡේදවල ඇතුලත් වෙනත් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

#### (අ) ගිණුම් ඉදිරිපත් කිරිම

දෙපාර්තමේන්තුව විසින් 2012 මාර්තු 31 දින වනවිට ආදායම් සංකේත 31 ට අදාල ආදායම් ගිණුම් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**(ආ) අයවැය විචලනය**

ප්‍රාග්ධන වැය විෂයන් 04ක් සඳහා එකතුව රු.41,900,000 ක් වූ ප්‍රතිපාදනයෙන් එකතුව රු.27,808,309 ක් උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය රු.14,091,691 ක් විය.මෙම ඉතිරිවීම්, එකී එක් එක් වැය විෂයය සඳහා සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 21 සිට 49 දක්වා වූ පරාසයක ප්‍රතිශතයක් ගෙන තිබුණි. වැය විෂයන් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා මෙම ඉතිරිවීම් සිදු වී තිබුණු බව නිරීක්ෂණය විය.

**(ඇ) අයවැය සහය සේවා හදිසි අවශ්‍යතා වගකීම් ව්‍යාපෘතිය යටතේ ලබාගත් ප්‍රතිපාදන**

අයවැය සහය සේවා හදිසි අවශ්‍යතා වගකීම් ව්‍යාපෘතිය යටතේ අංක 2001 වැය විෂයය සඳහා රු.10,000,000 ක් වූ අතිරේක ප්‍රතිපාදනයක් ලබාගෙන තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ඉන් කිසිදු උපයෝජනයක් සිදු කර නොතිබුණි.

**(ඈ) රාජ්‍ය වියදම් කළමනාකරණය**

2011 දෙසැම්බර් 30 දිනැති අංක 155 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව, අයවැය ඇස්තමේන්තුවෙන් සලසා තිබුණු ප්‍රතිපාදන වලින් ඉතිරි කිරීම් කළයුතු බවට දක්වා තිබුණු වැය විෂයන් 16 ක ඉතිරි කිරීම් කර නොතිබුණි. ඒ සඳහා 2012 දෙසැම්බර් 19 දින පැවැත්වූ අමාත්‍ය මණ්ඩල රැස්වීම් තීරණය පරිදි ඉතිරි කිරීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කිරීම සඳහා භාණ්ඩාගාර ලේකම්වරයාගේ අනුමැතිය ලබාගත යුතුව තිබුණ ද එලෙස අනුමැතිය ලබාගෙනද නොතිබුණි.

**(ඉ) පොදු තැන්පත් ගිණුම**

ආදායම් සංකේතවල භාණ්ඩාගාර වාර්තා සහ දෙපාර්තමේන්තු වාර්තා අතර 2010 දෙසැම්බර් 31 දිනට පැවති රු.202,076,920 ක්වූ වෙනස්කම් අංක 6000/0000/000/015/0126/00 දරන පොදු තැන්පත් ගිණුමට 2010 වර්ෂයේදී මාරුකර තිබුණු අතර එයින් මෙතෙක් හඳුනාගෙන නොතිබුණු රු.6,045,171 ක්වූ මුදල හඳුනා ගැනීමෙන් තොරව 2012 වර්ෂයෙදි 10.02.01.02 ආදායම් සංකේතයට බැර කර පොදු තැන්පත් ගිණුම පියවා තිබුණි.

**(ඊ) ආදායම් ගිණුම**

2012 වර්ෂය සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තු සංශෝධිත ඇස්තමේන්තු ආදායම රු.448,526,190,000 ක් වූ අතර, රැස් කරන ලද ආදායම රු.418,423,600,997 ක් වූයෙන් ඇස්තමේන්තුගත ආදායමට වඩා රු.30,102,589,003 ක අඩුවීමක් සිදු වී තිබුණි. වාර්තාගත වූ ශුද්ධ ආදායම වූ රු.418,423,606,997 න් රු.118,098,650,535 ක් එනම්, සියයට 28 ක් විවිධ දෙපාර්තමේන්තු / ආයතන විසින් සෘජුව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ගේ ගිණුමට බැර කරන ලද ආදායම විය.

සමාලෝචිත වර්ෂයේ දල බදු ආදායම වූ රු.433,333,049,649 න් රු.14,909,448,652 ක් එනම්, බදු ආදායමින් සියයට 3 ක් ආපසු ගෙවා තිබුණි. 2002 වර්ෂයේ රු.52,102,129,721 ක් වූ හිඟ බදු ආදායම සමාලෝචිත වර්ෂයේ අවසානයට රු.192,663,476,919ක්දක්වා වැඩිවී තිබුණු අතර, ඒ හා සම්බන්ධ විස්තර ආදායම් ගිණුම්වල දක්වා නොතිබුණි. ඉහත රු.192,663,476,919 ක් වූ හිඟ ආදායම්වලින් කාල විශ්ලේෂණ ඉදිරිපත් කර තිබුණේ රු.183,937,243,290 ක් සඳහා පමණි. සමාලෝචිත වර්ෂයේදී රැස්කර තිබූ රු.418,423,600,997 ක් තුළ පසුගිය වර්ෂයන්ට අදාල හිඟ බදු අයවීම්ද ඇතුළත්ව තිබූ බැවින් සමාලෝචිත වර්ෂයට අදාලව ලැබූ තථ්‍ය ආදායම කොපමණද යන්න නිවැරදිව තහවුරු කරගත නොහැකි විය.

වසර 10 කට කලින් අවලංගු කරන ලද පිරිවැටුම් බදු, භාණ්ඩ හා සේවා බද්ද හා ආරක්ෂක සේවා බද්ද සඳහා පිළිවෙලින් රු.6,052,626,880 ක්, රු.8,658,357,263 ක් හා රු.2,123,845,021 ක් හිඟව පැවතුණි.

2005/2006 වර්ෂයේදී අනාවරණය කර ගන්නා ලද වැට් බදු වංචාව නිසා 2003 වර්ෂයේ සියයට 15 ක්ව තිබූ වැට් බදු ආපසු ගෙවීම ප්‍රමාණය 2012 වර්ෂය අවසානය වන විට සියයට 2 දක්වා අඩු වී තිබුණි.

2010 අංක 16 දරන ගෙවීම් පැහැර හරිනු ලැබූ බදු පියවීමේ (විශේෂ විධිවිධාන)බදු පනත මගින් පැහැර හරිනු ලැබූ බදු අයකර ගැනීම සඳහා වෙනම ඒකකයන් 2012 වර්ෂයේදී ආරම්භ කර තිබුණු අතර, එම ඒකකයට 2009 දෙසැම්බර්31 දිනට පෙර කාලයට අයිති රු.91,161,681,174 ක් වූ බදු මාරු කර තිබුණි. 2012 දෙසැම්බර් 31 දිනට රු.71,094,633,641 ක් තවදුරටත් අයවිය යුතුව තිබුණ බැවින් මෙම ඒකකයේ බදු අය කිරීමේ තත්ත්වය සතුටුදායක වන බවට සාක්ෂි නොතිබුණි.

සමාලෝචිත වර්ෂයේදී තක්සේරු කිරීම්, කපා හැරීම් හා නිදහස් කිරීම් පිළිබඳව වටිනාකම් ලබා ගැනීම සඳහා අවශ්‍ය වන මාරු කිරීම් ජ'නල් සටහන්, අවලංගු වූ චෙක්පත් ආදී විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. පසුගිය වර්ෂ 9 තුළ තක්සේරු කරන ලද බදු ප්‍රමාණය රු. බිලියන 238.2 ක් වූ අතර, අයවී තිබූ ප්‍රමාණයරු. බිලියන 85.3 ක් එනම්, සියයට 35.8 පමණක් විය. එහෙත් වර්ෂ 9ක් තුළ තක්සේරු කර පසුව කපා හැර තිබුණු / නිදහස් කර තිබුණු (Discharge Orders) ප්‍රමාණය රු. බිලියන 98.9 එනම්, සියයට 41.5 ක් වේ.

ආදායම් ගිණුම සම්බන්ධව පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) කේවල ගිණුම හා පාලන ගිණුම් සැසඳීමෙන් තොරව මාරු කරන ලද වෙනස්කම් නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| | ගිණුමේනම | කේතාංක | වෙනස | බැර කරන ලද ගිණුම් කේතාංක |
|---|---|---|---|---|
| i | එකතු කළ අගය මත බදු පාලන ගිණුම | 10.02.01.01 | 12,496,608 | 10.02.01.02 |
| ii | භාණ්ඩ හා සේවා බදු සඳහා වූ පාලන ගිණුම | 10.02.02.00 | 47,479 | 10.02.02.01 |
| iii | අනෙකුත් බදු ගිණුම් | 10.04.02.99 | 26,553,978 | එම ගිණුමටම ගලපා ඇත. |

බදු ගෙවීම්වලට අදාල ගෙවීම් පත්‍රිකා එම වර්ෂයේදීම නොලැබීම වෙනසට හේතුව බවත්, 2008 සිට 2011 කාල පරිච්ඡේද වලට අදාල රු.26,583,868 ක ගෙවීම් පත්‍රිකා 2012 වර්ෂයේදී ලැබී ඇති බවත්, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් දන්වා තිබුණි. ඉහත අංක ඊ (i) ඡේදයේ ආදායම් වෙනස්කම් සඳහා විස්තර විගණනයට ලබා දී නොතිබුණි.

(ii) බැංකු ගෙවීම් පත්‍රිකා නොමැතිව බැර කිරීම.

2012 වර්ෂයේදී ආර්ථික සේවා ගාස්තු වශයෙන් රු.43,489,718 ක්ද, ආදායම් බදු ලෙස රු.93,336,460 ක් ද, ගෙවීම් පත්‍රිකා නොමැතිව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ගේ ගිණුම බැර කර තිබුණි.

2013 දෙසැම්බර් 31 දිනට ආර්ථික සේවා ගාස්තු වශයෙන් රු.10,534,796 ක්ද ආදායම් බදු වශයෙන් රු.392,278 ක්ද සඳහා වූ ගෙවීම් පත්‍රිකා හඳුනාගෙන තිබුණි. ඉතිරි මුදල් හඳුනාගෙන නොතිබුණි.

(iii) සමාලෝචිත වර්ෂයේදී, මාසික වාර්තාවල ලියාපදිංචි නොවූ ලෙස දැක්වෙන බදු වර්ග 4 කට අදාලව රු.395,432,094 ක් සඳහා වැරදි සංකේත ලෙස දක්වා ඇති බදු වර්ග 3 කට අදාල වූ රු.55,095,335 ක ආදායම් ලැබීම්වල නිවැරදිතාවය තහවුරු කර ගැනීමට අවශ්‍ය සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(iv) පහත සඳහන් විෂයයන් සම්බන්ධයෙන් අදාල සාක්ෂිද විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| | | රු. |
|---|---|---|
| i. | එකතු කළ අගය මත බදු ආපසු ගෙවීම | 702,527,076 |
| ii. | ශ්‍රී ලංකා යුධ හමුදාවට ආපසු ගෙවීම | 17,838,913 |
| iii. | ශ්‍රී ලංකා යුධ හමුදාව ආපසු ගෙවූ ජාතිය ගොඩනැගීමේ බදු | 4,620,480 |
| iv. | කොටස් ගනුදෙනු බදු ආපසු ගෙවීම් | 1,220,515 |
| v. | ආදායම් බදු ආපසු ගෙවීම් | 3,242,259 |
| vi. | වැට් බදු ආපසු ගෙවීම් | 2,430,112 |

(v) සමාලෝචිත වර්ෂය ආරම්භයට හා අවසානයට භාණ්ඩ හා සේවා හිඟ බදු වාර්තාව අනුව ලැබිය යුතු මුදලට වඩා රු.93,123,713 ක් අඩුවෙන් පැවතුණු අතර, එයට බදු නිදහස් කිරීම රු.7,976 ක් හා දඩ කපා හැරීම් රු.93,115,738ක් ඇතුලත් වී තිබුණි.

(vi) මුදල් රෙගුලාසි 128(2) (අ) ප්‍රකාරව වූ අර්ධ වාර්ෂික වාර්තා ජූලි 31 දින හා ඊළඟ වර්ෂයේ ජනවාරි 31 දිනට පෙර විගණනය වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, 2012 දෙසැම්බර් 31 දිනට වූ අදාල වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර ඇත්තේ 2013 ජූනි 14 දින එනම්, දින 133 ක ප්‍රමාද කාලයකින් පසුවය.

සමාලෝචිත වර්ෂය අවසානයට මුද්දර බදු හිඟ ශේෂය රු.62,130,578 ක් වුවත්, එම මුදල රු.66,384,917 ක් ලෙස පොත් හා වාර්තාවල දක්වා තිබුණි.

**(උ) රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 24601 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ 2012 දෙසැම්බර් 31දිනට සැසඳුම් ප්‍රකාශනය ප්‍රකාරව එදිනට අයවීම් හිඟ හිට තිබුණු ශේෂවල එකතුව රු.2,409,450ක් විය. ඒ පිළිබඳව පහත සඳහන් කරුණු නිරික්ෂණය විය.

(i) 1997 ට පෙර වැඩ තහනම් වු සේවකයන් තිදෙනෙකුගෙන් අයකරගත යුතු එකතුව රු.8,196 ක් වූ මුදලින්, සමාලෝචිත වර්ෂයේදී කිසිඳු මුදලක් අය කර නොතිබුණි.

(ii) අත්තිකාරම් "බී" ගිණුමේ උපලේඛන අංක 07 සහ 08 හි දැක්වෙන රු.230,534 ක් වු ණය ශේෂයන් අය නොවන ණය බවට පත්වී තිබුණි.

(iii) 1999 වර්ෂයේදී සේවය හැරගොස් සිටි සේවකයෙකුට රු.250,445 ක් වූ දේපල ණය මුදල් ලබාදීමේදී එම නිලධාරියාගේ නමට ඉඩම ලිවීමට කටයුතු කර නොතිබුණු බැවින් එම මුදල් අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

(iv) තවද,1996,1997,1998 සහ 2010 වර්ෂ වල සේවය හැර ගිය නිලධාරීන් 5දෙනෙකුගෙන් එකතුව රු.76,226 ක් අයවිය යුතුව තිබුණු නමුත්,එම මුදල් ද අය කර නොතිබුණි.

## 11.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

### 11.4.1 සංයුක්ත සැලැස්ම

2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/ 2/2/3/5(4)දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැලැස්මක් දෙපාර්තමේන්තුව විසින් වර්ෂය ආරම්භයේදී පිළියෙල කළ යුතු වුවත් එම සැලැස්ම 2012 දෙසැම්බර් 31 වනවිටත් පිළියෙල කර නොතිබුණි.

**11.4.2 වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම**

දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම පිළියෙල කර තිබුණි.

**11.4.3වාර්ෂික කාර්ය සාධන වාර්තාව**

2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරණ රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපියේ සඳහන් 2002 සැප්තැම්බර් 12දිනැති අංක 402 සහ 2004 පෙබරවාරි 20 දිනැති අංක 402(1) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාර දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කළ යුතු වාර්ෂික කාර්ය සාධන වාර්තාව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුලත විගණකාධිපතිට පිටපත් සහිතව පාර්ලිමේන්තුවේ සභාගත කල යුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාල කාර්ය සාධන වාර්තාව 2013 සැප්තැම්බර් 30 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**11.4.4වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍ර ලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර තිබුණි. එහෙත් ප්‍රසම්පාදන සැලැස්මට අනුව ප්‍රසම්පාදන කටයුතු සිදු වී නොතිබුණි.

**11.4.5 අභ්‍යන්තර විගණනය**

දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර තිබුණු නමුත්,බදු පිළිබඳ පරීක්ෂාවන් එම විගණන ඒකකයෙන් ඉටුකර නොතිබුණි.

**11.4.6 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම**

විගණන හා කළමනාකරණ කමිටුව මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මකව පැවති අතර 2012 වර්ෂය සඳහා කමිටු රැස්වීම් 03ක් පමණක් පවත්වා තිබුණි.

**11.5 වත්කම් කළමනාකරණය**

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

පහත විග්‍රහ කර ඇති පරිදි සමහර වත්කම් නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය විය

| | වත්කම් වර්ගය | ඒකක ගණන | නිෂ්ක්‍රීය හෝ ඌන උපයෝජිතව පැවති කාලය |
|---|---|---|---|
| (i) | විදුලි උත්පාදක යන්ත්‍රය | 01 | දේශීය ආදායම් ගොඩනැගිල්ල නවීකරණයේදී මෙම විදුලි උත්පාදක යන්ත්‍රය රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් 2009 වර්ෂයේදී රැගෙන ගොස් තිබුණි. |
| (ii) | ට්‍රාන්ස්ෆෝමර් යන්ත්‍ර | 02 | දේශීය ආදායම් ගොඩනැගිල්ල නවීකරණයේදී සපයා තිබුණු එම ට්‍රාන්ස්පෝමර් 2009වර්ෂයේ සිට භාවිතයට ගෙන නොතිබුණි. |
| (iii) | සී.සී.ටී.වී.කැමරා | 70 | 2010 වර්ෂයේ දී දේශීය ආදායම් ගොඩනැගිල්ල නවීකරණයේ දී ගොඩනැගිල්ලේ මහල් වලට සවිකර තිබුණු නමුත් ඒවා භාවිතයට ගෙන නොතිබුණි. |

**(ආ) ලැබිය යුතු ශේෂ**

කොළඹ 12, ශ්‍රී සංඝරාජ මාවතේ පිහිටි සීමාසහිත ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාවට අයත් ඉඩමේ පර්චස් 100 ක ඉඩම් කොටසක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට පවරා ගැනීම සඳහා 2008 පෙබරවාරි 28 දින රුපියල් මිලියන 50 ක අත්තිකාරම් මුදලක් සී/ස ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාවේ සභාපති වෙත ගෙවා තිබුණි. පසුව එම දේපල පවරා ගැනීම නවතා තිබුණද එම අත්තිකාරම් මුදල් අයකර ගෙන නොතිබුණි.

**(ඇ) බේරුම් නොකළ බැරකම්**

සමාලෝචිත වර්ෂය සඳහා විසර්ජන ගිණුමේ වර්ෂ 01ට අඩු නොපිය වූ බැරකම් ලෙස රු.76,294,694 ක් පමණක් දක්වා තිබූණද 2013විසර්ජන (වැය) ලෙජරයෙහි දක්වා තිබුණු බැදීම්වලට අනුව විසර්ජන ගිණුමේ දක්වා තිබුණු බැරකම්වලට අතිරේකව රු.2,144,523 ක් වූ බැරකම් පැවතුණි

## 11.6 අනුකූල නොවීම්

**(අ) නීති,රීති,රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

(i) **මුදල් රෙගුලාසි**

මුදල් රෙගුලාසි 1646 ප්‍රකාරව දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ නියමිත පරිදි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

මුදල් රෙගුලාසි 245 (3)පරිදි සියළුම වවුචර්වල අදාල විස්තර නියමිත නියමිත වැය විස්තර යටතේ සටහන් කළ යුතුය. තවද මුදල් රෙගුලාසි 447 (6)පරිදි ගෙවීම් වවුචරයේ අංකය විසර්ජන (සම්මත) ලෙජරයේ ඇති තීරයේ දැක්විය යුතු වේ. එහෙත් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් විසර්ජන (සම්මත) ලෙජරයෙහි ගෙවීම් වවුචර්වලට අදාල විස්තර සහ ගෙවීම් වවුචර් අංකය සටහන් කර නොතිබුණි.

**(ii) චක්‍රලේඛ**

2004 ඔක්තෝබර් 10 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 174 පරිදි විසර්ජන ගිණුම සමඟ සටහන අංක (I) යටතේ ඉදිරිපත් කරන ලද ජංගම නොවන වත්කම් සංචලනයන් පිළිබඳ වාර්තාව - 2012 හි පහත දැක්වෙන අඩුපාඩු පැවතුණි.

i. දෙපාර්තමේන්තුවට අයත් ඉඩම් සහ ගොඩනැගිලි පිළිබඳ විස්තර ඇතුලත් කර නොතිබීම.

ii. සමාලෝචිත වර්ෂයේ දී මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයෙන් ලැබී තිබුණු වාහන 03 ක මිල වූ රු.27,500,000 ක් ද, අපහරණය කරන ලද වාහන 15 වටිනාකම වූ රු.17,514,326 ක් ද වාර්තාවට ඇතුලත් කර නොතිබීම.

**(ආ) බදු අවශ්‍යතාවන්ට අනුකූල නොවීම**

**(i) එකතු කළ අගය මත බදු වාර්තා ඉදිරිපත් කර නොතිබීම**

2002 සැප්තැම්බර් 30 දිනැති අංක 364(3) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 5 ඡේදයට අනුව ටෙන්ඩර්කරුවෙකුට / සැපයුම්කරුවෙකුට එකතු කළ අගය මත බදු ගෙවන විට එසේ ගෙවන ලද බද්ද පිළිබඳ විස්තර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ට එවිය යුතු වුවත් ගෙවන ලද සහ රඳවා ගන්නා ලද එකතු කළ අගය මත බද්දට අදාල වාර්තා ගෙන්වා ගැනීමට විධිමත්ව කටයුතු කර නොතිබුණි.

(ii) 2007 අංක 14 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනතේ 7 වගන්තියට අනුව කොන්ත්‍රාත්කරුවන්ට ගෙවනු ලබන එකතු කළ අගය මත බද්දෙන් 33 1/3 ක් රඳවා ගෙන දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ට එවිය යුතු විය. ආයතන 08 ක් සම්බන්ධයෙන් කරන ලද නියැදි විගණනයකදී එලෙස 2007 සිට 2010 වර්ෂය දක්වා කාලයට අදාලව දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබුණු එකතුව රු.13,796,542 ක්වූ සියයට 33 1/3 ක්වූ බදුවලට අදාළ බදුකරු විසින් එවිය යුතු සියයට 66 2/3 ක මුදල් අයවී නොතිබුණි. ඊට අදාළ සමහර බදුකරුවන් පදිංචිය හැර ගොස් තිබුණු බවත්, කැඳවන ලද සම්මුඛ පරීක්ෂණ වලට පැමිණ නොමැති බවත් 2014 මාර්තු 24 දිනැතිව එවන ලද ලිපියකින් දන්වා තිබුණි.

(iii) එහෙත් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට අයත් ක්‍රියාකාරි බදුකරුවන් විසින් මාසික/ ත්‍රෛමාසික වාර්තා ඉදිරිපත් කර නොතිබුණු නිසා එම බදුකරුවන් විසින් ප්‍රේෂණය කළ යුතුව තිබුණු එකතු කළ අගය මත බදු මුදල දෙපාර්තමේන්තුවට ලැබී තිබුණු බවට සනාථ නොවිණි.

## 11.7 බදු ලිපිගොනු පරීක්ෂාව

බදු ලිපි ගොනු සම්බන්ධයෙන් නියැදි පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

| | | | නිරීක්ෂණය |
|---|---|---|---|
| (අ) | ටින් අංකය 124006139 | | බද්දට ගත් ගොඩනැගිලි වැඩි දියුණුකිරීම් සඳහා දරන ලද වියදම්වලින් 2007/08 වර්ෂයේ දී සියයට 6.67ක් ද, 2008/09 වර්ෂයේ දී සියයට 12.5ක් ද ප්‍රාග්ධන දීමනා ලබා ගැනීමට කටයුතු කර තිබිය දී 2009/10 තක්සේරු වර්ෂයේ දී බද්දට ගත් ගොඩනැගිලි සඳහා දරන ලද රු.108,690,000 ක් වූ වියදම එකවර අඩු කිරීමට බදුකරුට ඉඩ සලසා තිබුණි. මේ නිසා රු.33,286,312 ක් වූ බදු ආදායම් අත්හැරී තිබුණි. |
| (ආ) | ටින් අංකය 114020265 | (i) | බදු ගණනයේ දී ක්‍රීඩා සමාජ අනුග්‍රාහකත්ව වියදම් වශයෙන් 2008/09 තක්සේරු වර්ෂයේ දී රු.36,154,345ක් ද 2009/10 තක්සේරු වර්ෂයේ දී රු.68,946,968ක් ද අඩු කර තිබුණි. 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත් 26 (න) වගන්තිය අනුව ප්‍රචාරණ ගාස්තු වලින් අඩක් ඉඩ නොදෙන වියදම් බැවින් එම වියදම් ප්‍රචාරණ වියදම් නොවන බවට තහවුරු කර ගැනීමට ප්‍රමාණවත් සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| | | (ii) | මෙම බදුකරුගෙන් 2002 සිට පැවත එන රු.55,175,099 ක ආරක්ෂක බදුද ඇතුළුව රු.686,307,414 ක හිඟ බදු 2013 අප්‍රේල් 24 දිනට පැවතියද එම බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

(ඈ) ටින් අංකය 114117854 — මෙම බදුකරුගෙන් 2009 වර්ෂය දක්වා අයවිය යුතුව තිබුණු රු.11,091,584 ක්වූ එකතුකළ අගය මත බදු මුදල මේ දක්වා අයව කර නොතිබුණි.

(ඇ) ටින් අංකය 114226815 — අවුරුදු 20 ක් වූ බදු නිදහසක් ලබා තිබුණු මෙම බදුකරු ආයෝජන මණ්ඩලය යටතේ ලියාපදිංචි වී තිබුණු සමාගමක් වූ අතර 2003 පෙබරවාරි මස නිෂ්පාදන කටයුතු ආරම්භ කර තිබුණි. මෙම බදුකරු සම්බන්ධයෙන් ලිපිගොනු පරීක්ෂාවේදී අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(i) මෙම සමාගමෙන් වෙනත් ආදායම් ප්‍රභවයන්ගෙන් ලබන ආදායම් මත බදු අය කළ යුතු වූ බැවින් 2006/07 තක්සේරු වර්ෂයේ දී සුන්බුන් විකිණීමෙන් ලත් ආදායම මත බදු ගණනය කර තිබූ නමුත් 2007/08 තක්සේරු වර්ෂයේදී සුන්බුන් විකිණීමෙන් ලත් රු.4,645,088 ක් සඳහා බදු අය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) මෙම බදුකරුගෙන් 2013 නොවැම්බර් 15 දින වන විටත් එකතු කල අගය මත බදු වශයෙන් රු.947,981,622 සහ ආදායම් බදු රු.1,318,909 ක් අයවිය යුතුව පැවතුණි.

(ඉ) ටින් අංකය 104024025

(i) කාර් රථ සඳහා 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 26 (2) (අ) වගන්තිය පරිදි ප්‍රාග්ධන දීමනා සඳහා හිමිකම් නොමැති වුවද 2009/10 තක්සේරු වර්ෂයේදී කාර් රථ 02ක් සඳහා එකතුව රු.1,880,000 ක්වූ ප්‍රාග්ධන දීමනා බදු ගණනයේදී අඩුකර තිබුණු බැවින් රු.658,000 ක ආදායම් බද්ද අඩුවෙන් අයවී තිබුණි.

(ii) 2008/09 තක්සේරු වර්ෂයේ දී වෙනත් දීමනා වශයෙන් ගෙවා තිබුණු රු.10,741,650 ක් වූ මුදලින් රු.1,080,000 ක් වූ සේවක කුලී දීමනා ලෙස අඩුකර ඉතිරි මුදල ඉඩදිය නොහැකි මුදල් වශයෙන් රු.7,246,240 ක් සංශෝධිත තක්සේරුවේ දී එකතු කර ඒ මත බදු අයකර තිබුණද 2009/10 තක්සේරු වර්ෂයේ දී කුලී දීමනා වශයෙන් ගෙවා තිබුණු රු.3,149,305 ක් වූ මුදලින් ඉඩදිය නොහැකි කුලී දීමනා තීරණය කර බදු අයකර නොතිබුණි.

(iii) 2009/10 තක්සේරු වර්ෂයේ බදු ගණනයේ දී කල් බදු වාහන විකිණීමෙන් රු.6,054,823 ක අලාභයක් අඩුකර තිබුණු නමුත් එම අලාභය ගණනය කිරීමේ දී විකුණන ලද කල් බදු වාහන වලට අදාල ක්ෂය/ ප්‍රාග්ධන දීමනා

සැලකිල්ලට ගෙන නොතිබුණි.

(iv) 2009/10 තක්සේරු වර්ෂයේ දී රු.14,009,371 ක් වූ ගොඩනැගිලි විකුණා තිබෙන බව ගිණුම් සමඟ වූ සටහන් අංක 15 හි දක්වා තිබෙන නමුත් එම ගොඩනැගිලි විකිණීමෙන් ලද මුදල් ඉදිරිපත් කර තිබුණු මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ සඳහන් නොවන අතර එම මුදල් සම්බන්ධයෙන් පැහැදිලි කිරීම් ද ලබාගෙන නොතිබුණි.

(ඊ) ටින් අංකය 114333506

2008/09 තක්සේරු වර්ෂයේ දී ව්‍යාපාරය රු.26,379,293 ක අලාභයක් ලබා තිබුණු අතර එම තක්සේරු වර්ෂයේ ගනුදෙනු පරීක්ෂාවේ දී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) අදාල සමාගම විසින් ඉදිරිපත් කර තිබුණු මූල්‍ය ප්‍රකාශන අනුව පිරිවැටුම රු.577,285,154 ක් වුවත් ගනුදෙනු සඳහා පවත්වා තිබුණු බැංකු ගිණුම පරීක්ෂාවේ දී ශුද්ධ පිරිවැටුම රු.2,085,390,250 ක් විය. පසුව සිදු කරන ලද පරීක්ෂණයේ දී ශුද්ධ පිරිවැටුම රු.1,533,845,911 ක් බවට ගණනය කර ඒ අනුව රු.82,471,769 ක ලාභයක් මත 2008/09 තක්සේරු වර්ෂය සඳහා රු.23,525,249 ක බද්දක් අයකර ගැනීම සඳහා තක්සේරු දැන්වීම් නිකුත්කර තිබුණි.

(ii) මෙම සමාගම විසින් 2003/04 තක්සේරු වර්ෂයේ සිට 2009/10 දක්වා ආදායම් පිළිබඳ වාර්තා ඉදිරිපත් කිරීමේ දී මාස 04 සිට මාස 13 ක් දක්වා වූ ප්‍රමාදයක් සිදු කර තිබුණි.

## 11.8 ඔට්ට‍ු හා සූදු බදු පනත ක්‍රියාත්මක කිරීම සහ බදු අය කිරීම

**(i)** සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ඔට්ටු හා සූදු බදු ආදායම රු.312,000,000 ක් වූ අතර රු.289,175,098 ක් එනම් සියයට 93 ක් පමණක් ආදායම් රැස්කර තිබුණි.

**(ii)** ඔට්ටු හා සූදු බදු ගෙවනු ලබන බදුකරුවන්ට අතිරේකව ඔට්ටු හා සූදු ව්‍යාපාර රාශියක් කොළඹ හා තදාසන්න ප්‍රදේශ වල ක්‍රියාත්මක වන නමුත් එම ව්‍යාපාර පිළිබඳව විමර්ශනයක් දෙපාර්තමේන්තුව විසින් සිදු කර තිබුණු බවට සාක්ෂි නොතිබුණි.

තවද, 2013 ජූලි 13 දිනැති පුවත්පත් අනාවරණයට අනුව සූදු බදු නොගෙවන ආයතන දෙකක් පිළිබඳව අනාවරණය කර තිබුණු අතර එයින් එක් ආයතනයක් 2009 වර්ෂයෙන් පසු බදු නොගෙවන ආයතනයක් ද විය.

**(iii)** බදු ගෙවීම සඳහා ලැබී තිබුණු රු.5,000,000 ක චෙක්පතක් 2010 නොවැම්බර් 02 දින අහරුවී තිබුණු නමුත් එම චෙක්පත ඔට්ටු හා සූදුබදු අංශයට මාස 14 කට පසුව එනම්

2012 ජනවාරි 02 දින එවා තිබුණි. එම කැසිනෝ ආයතනය ක්‍රියාත්මකව පවතින ආයතනයක්ද යන්න සනාථ කරගැනීමට හැකි වී නොතිබුණි.

(iv) මේ දක්වා ඔට්ටු හා සූදු බද්ද සම්බන්ධ බදුකරුවන්ගේ තොරතුරු දෙපාර්තමේන්තුවේ පරිගණක පද්ධතිය තුලට ඇතුලත් වී නොතිබුණි.

## 11.9 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන් / දුර්වලතා

එකතුවරු.1,584,898,000 ක ඇස්තමේන්තුවක් මත දේශීය ආදායම් ගොඩනැගිල්ල නවීකරණය කිරීමේ කොන්ත්‍රාත්තුව රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට 2009 වර්ෂයේ දී ලබාදී තිබුණු අතර, එම නවීකරණ කටයුතු විධිමත් පරිදි සිදු කර නොතිබුණි. ඒ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ගොඩනැගිල්ලේ සමහර මහල් වලට වැසි ජලය ගලා ඒම නිසා කාර්යාල කටයුතු පවත්වා ගෙන යාමේදී දුෂ්කරතා ඇතිවී තිබීම.

(ආ) එම ඇස්තමේන්තුවේ ඇතුළත් රු.190,000,000 ක් වූ මහල් 09 කින් යුත් වාහන අංගනයේ කටයුතු 2014 ජූනි 30 දින වනවිටත් අවසන් කර නොතිබීම.

(ඇ) නවීකරණය නිම කිරීමෙන් පසු සවි කිරීම්, කොන්ත්‍රාත්තුව යටතේ සපයන ලද කාර්යාල උපකරණ, යන්ත්‍රෝපකරණ විධිමත් ලෙස බාරදී නොතිබීම.

(ඇ) නවීකරණය කරන ලද ගොඩනැගිල්ලේ සමහර ඉදිකිරීම්, සවිකිරීම් සහ සපයන ලද උපකරණ කැඩී බිඳී තිබීම.

## 11.10 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු

අංක 4224 දරණ බැංකු ගිණුමේ 2012 දෙසැම්බර් 31 දිනට මාස 06 ඉක්මවූ රු.480,556 ක්වූ චෙක්පත වෙනුවට නව චෙක්පතක් 2013 නොවැම්බර් 08 දින නිකුත් කර තිබුණු නමුත් එම චෙක්පත ද කල් ඉකුත් වී තිබුණි. එම චෙක්පත සම්බන්ධයෙන්2014 මාර්තු 25 දින වන විටද මු.රෙ. 396 (ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 11.11 අවිධිමත් ගනුදෙනු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

### (අ) දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ බදුල්ල ප්‍රාදේශීය කාර්යාලය නවීකරණය කිරීම

මෙම ප්‍රාදේශීය කාර්යාලය නවීකරණය කිරීම් සඳහා වූ කොන්ත්‍රාත්තුව රු.1,499,378 කට 2012 ඔක්තෝබර් 16 දින පිරිනමා තිබුණු අතර කොන්ත්‍රාත් කාර්ය 2013 ජනවාරි 23 දිනට පෙර අවසන් කර භාරදිය යුතු වුවත් කොන්ත්‍රාත්කරු විසින් අදාල කොන්ත්‍රාත් කාර්ය ඉටුකර නොතිබුණි.

**(ආ) ප්‍රාදේශීය කාර්යාල පවත්වා ගෙන යාම සඳහා කුලී පදනම මත ගොඩනැගිලි ලබා ගැනීම**

දෙපාර්තමේන්තුව විසින් රත්නපුර,කළුතර,යාපනය ,දඹුල්ල ,මහරගම සහ ගම්පහ ප්‍රාදේශීය කාර්යාල පවත්වා ගෙන යාම සඳහා කුලී පදනම මත ගොඩනැගිලි ලබා ගෙන තිබුණු අතර ඒ සම්බන්ධයෙන් කරන ලද විගණනයේ දී නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(i) ගොඩනැගිලි කුලියට ලබා ගැනීමේ දී කාර්යාල පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය ඉඩකඩ ප්‍රමාණයන් පිළිබඳව පිරිවිතරයන් ඇතුලත් කර ඒ අනුව ලංසු කැඳවා නොතිබුණි. මේ නිසා අතිරේක ඉඩකඩ නැවත නැවතත් කුලී ගෙවමින් එම ගොඩනැගිලි ලබා ගැනීමට සිදුව තිබුණි.දඹුල්ල සහ මහරගම ප්‍රාදේශීය කාර්යාල උදාහරණ වශයෙන් දැක්විය හැකිය.

(ii) ගම්පහ සහ දඹුල්ල ප්‍රාදේශීය කාර්යාල සඳහා ලබා ගෙන තිබුණු ගොඩනැගිලි සඳහා ආරම්භයේ දී අත්සන් කර තිබුණු කුලී ගිවිසුම් කල් ඉකුත් වීමෙන් පසු අළුත් කර නොතිබුණි.

(iii) කුලියට ලබාගත් මහරගම ප්‍රදේශීය කාර්යාල ගොඩනැගිල්ල සඳහා ගෙවා තිබුණු ජලය හා විදුලිය සඳහා බිල්පත් නොතිබුණු අතර මුළු ගොඩනැගිල්ල සඳහා අයකර තිබුණු ජල ගාස්තු සහ විදුලි ගාස්තු සඳහා වූ බිල්පත් වලින් අයිතිකරු දන්වා තිබුණු කොටස දෙපාර්තමේන්තුව විසින් ගෙවා තිබුණි. මේ නිසා ප්‍රාදේශීය කාර්යාලය සඳහාම භාවිතා කල ජලය සහ විදුලිය සඳහා පමණක් ගෙවීම්කර තිබුණේද යන්න සනාථ නොවිණි.

**(ඇ) කුලී පදනම මත ලබා ගෙන තිබූ රෙඩ්වෙයා ගොඩනැගිල්ලට අදාලව ගෙවා තිබූ අත්තිකාරම් පියවීම**

දෙපාර්තමේන්තුව විසින් 2000 මාර්තු සිට කාර්යාල පවත්වා ගෙන යාම සඳහා කොළඹ 02, පාර්ක් වීදිය, අංක 33 දරන ස්ථානයේ පැවති රෙඩ්වෙයා ගොඩනැගිල්ලේ වර්ග අඩි64,500 ක් ලබා ගෙන තිබුණි .එම ගොඩනැගිල්ලේ කුලී ගෙවීම සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) පළාත් තක්සේරුකරුගේ මාසික කුලී තක්සේරුකරුට අනුව මධ්‍යගත වායු සමීකරණ පහසුකම්,රථ වාහන නැවතීමේ පහසුකම් සහ අනෙකුත් සියළුම මූලික පහසුකම් සැපයීමේ පදනම මත උපරිමය වර්ග අඩියකට රු 75.ක් ගෙවීම අනුමත කර තිබුණු අතර වර්ග අඩියකට රු.75 ක් සහ අනෙකුත් බදු සමඟ රෙඩ්වෙයා ගොඩනැගිල්ලෙහි වර්ග අඩි 64,500 ක් කුලියට ගැනීම කැබිනට් පත්‍රිකා අංක 021/306/0364/09 මඟින් අනුමත කර තිබුණි .ඊට

පටහැනිව විදුලි ගාස්තු ,ජල ගාස්තු ,විදුලි සෝපාන සහ වායු සමීකරණ නඩත්තු වියදම් වශයෙන් 2009 මාර්තු සිට 2010 ජූනි දක්වා එකතුව රු 2,752,747.ක් ගෙවා තිබුණි.

(ii) 2010 ජූනි මාසයෙන් පසුව ගොඩනැගිලි වලින් ඉවත්ව තිබුණ ද, රෙඩිවෙයා ගොඩනැගිල්ල සඳහා 2009 දී ගෙවා තිබුණු රු.14,512,500 ක් වූ අත්තිකාරම් මුදල 2012 දෙසැම්බර් 31 දින එනම් අවුරුදු 2 ½ ක පමණ කාලයක් රඳවා තබා ගැනීමෙන් පසුව ආපසු ගෙවා තිබුණි. මෙයට අමතරව වෙනත් ගොඩනැගිල්ලක් සඳහා ගෙවා තිබුණු රු.18,900,000 ක අත්තිකාරමෙන් රු.10,489,500 ක් වර්ෂ 2 ½ ක්ද, රු.8,410,500 ක් වර්ෂ 3 ½ ක්ද රඳවා ගෙන ආපසු ගෙවා තිබුණි. එම තත්ත්වය රජයේ මුදල් අනිසි පරිහරණයකට ඉඩ සැලසීමක් ලෙස විගණනයේදී නිරීක්ෂණය විය.

**11.12වංචනික ස්වරූපයේ ගනුදෙනු**

---

දෙපාර්තමේන්තුවේ පරිගණක පද්ධතියේ සටහන් ව්‍යාජ ලෙස වෙනස් කිරීම මඟින් බදු ලිපිගොනු හතක (07) රු.184,665,975 ක් සහ තවත් එක් බදු ලිපිගොනුවක රු.19,242,377 ක මූල්‍ය අක්‍රමිකතාවයන් සිදු කර තිබුණු බව සමාලෝචිත වර්ෂයේ දී දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින් පොලිස්පතිවරයා වෙත වාර්තා කර තිබුණි.

ඒ සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් මූලික විමර්ශනයක් සිදු කර අතුරු වාර්තාවක් 2013 ජනවාරි 09 දින කොමසාරිස් ජනරාල්වරයා වෙත භාරදී තිබුණි. එම අක්‍රමිකතාවයන් සඳහා ද විශේෂයෙන් පරිගණක පද්ධතිය ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩු බලපා තිබුණි.

**11.13 මානව සම්පත් කළමනාකරණය**

---

**අනුමත සේවක සංඛ්‍යාව හා පුරප්පාඩු**

---

2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (අ) | ජොෂ්ඨ මට්ටම | 894 | 755 | 139 |
| (ආ) | තෘතික මට්ටම | 1024 | 548 | 476 |
| (ඇ) | ද්විතික මට්ටම | 664 | 531 | 133 |
| (ඈ) | ප්‍රාථමික මට්ටම | 397 | 366 | 31 |
| | එකතුව | 2979 | 2200 | 779 |

(i) ජ්‍යෙෂ්ඨ මට්ටමේ හා ද්විතීක මට්ටමේ තනතුරු 615 ක් එනම්, සියයට 32 ක් පුරප්පාඩුව පැවතීම දෙපාර්තමේන්තුවේ බඳු කළමනාකරණ අයහපත් වීමට හේතු වී තිබුණි.

(ii) දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සඳහා නව සේවා ව්‍යවස්ථාවක් 2012 ඔක්තෝබර් 01 දින සිට ක්‍රියාත්මක වන නමුත් එහි කටයුතු අවසන් නොවීමද, පුරප්පාඩු පැවතීමට හේතු වී තිබුණි.

## 12. ශීර්ෂය - 247 ශ්‍රී ලංකා රේගුව

### 12.1 විගණන විෂය පථය

ශ්‍රී ලංකා රේගුවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා ආදායම් ගිණුම් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත 2014 පෙබරවාරි 21නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂයපථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුලත හැකිතාක් පුළුල් විගණනයක් කල හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 12.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුලත් වේ.

### 12.3 විගණන නිරීක්ෂණ

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව ශ්‍රී ලංකා රේගුවේ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන, මෙහි (අ) සිට (ඒ ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 12.4 සිට 12.14 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) ගිණුම් ඉදිරිපත් කිරීම**

ශ්‍රී ලංකා රේගුව විසින් 2013 මාර්තු 31 දින වන විට පහත සඳහන් ගිණුම් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| ශීර්ෂය / ආදායම් සංකේතාංකය / විෂය අංකය | ගිණුමේ නම |
|---|---|
| 24701 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය |
| 7000 - 0 - 0 - 24702 | අත්අඩංගුවට ගන්නා ලද හා රාජසන්තක කරන ලද බඩු ද්‍රව්‍ය පිළිබඳ වියදම් අත්තිකාරම් ගිණුම |
| 6000/0000/00/00/0015/0127 | විවිධ තැන්පත් ගිණුම |
| 6000/0000/00/0006/0062 | රේගු නිලධාරීන්ගේ ත්‍යාග අරමුදල් ගිණුම |

**(ආ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

(i) එකතුව රු.647,363,760 ක් වටිනා ගෙවීම් වවුචර් 107 ක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ii) 2012 වර්ෂයට අදාල කාර්ය සාධන වාර්තාව, පාඩු හා අලාභහානි ලේඛනය, 2012 වර්ෂයට පෙර සිදු වී ඇති වාහන අනතුරු ලිපිගොනු, අත්අඩංගුවට ගන්නා හා රාජසන්තක කරන ලද බඩු ද්‍රව්‍ය පිළිබඳ අත්තිකාරම් ගිණුමට අදාල සිද්ධිලිපිගොනු, වෙනත් ආයතන වලට ලබා දී ඇති වත්කම් හා මානව සම්පත් පිළිබඳ තොරතුරු සහ බාහිර ආයතනවලට අයත් වත්කම් හා මානව සම්පත් භාවිතා කිරීම් පිළිබඳ තොරතුරු ආදී අවශ්‍ය සාක්ෂි ශ්‍රී ලංකා රේගුව විසින් විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා ඒවා විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකි විය.

(iii) ශ්‍රී ලංකා රේගුව වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 26 කට හා ඉකුත් වර්ෂවලදී නිකුත් කළ විගණන විමසුම් 34 කට 2014 අප්‍රේල් 30 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.

**(ඇ) අයවැය විචලනය**

(i) වැය විෂයයන් 05 ක් සඳහා එකතුව රු.106,550,000 ක මුදල් ප්‍රතිපාදන සලසා තිබුණ ද එයින් එකතුව රු. 40,393,044 ක් උපයෝජනය කිරීමෙන් පසු රු. 66,156,956ක ඉතිරියක් තිබූ බව නිරීක්ෂණය විය. එම ඉතිරිය එක් එක් වැය විෂයය සඳහා සලසා තිබුණු

ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 50 සිට සියයට 75 දක්වා වූ පරාසයක ප්‍රතිශතයක් ගෙන තිබුණි. වැය විෂයන් සඳහා අධි ප්‍රතිපාදන සැලසීම නිසා මෙම ඉතිරිවීම්සිදු වී තිබුණු බව නිරීක්ෂණය විය.

(ii) 2012 නොවැම්බර් 26 දිනැති අංක 227/2012 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව ජංගම නොවන සංචලන වාර්තාව ඉදිරිපත් කර නොතිබුණු අතර ඒ හේතුවෙන් ශ්‍රී ලංකා රේගුව සතු ස්ථාවර වත්කම්වල පිරිවැය, ගිණුම්වල අනාවරණය වී නොතිබුණි.

**(ඇ) ඉන්ධන හා විදුලි වියදම් කළමණාකරණය**

(i) ඉන්ධන හා විදුලි වියදම් සම්බන්ධයෙන් 2012 පෙබරවාරි 16 දිනැති අංක 156 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයෙන් ලබා දී තිබූ උපදෙස්වලට පටහැනිව විදුලිය වැය විෂයය සඳහා මුදල් රෙගුලාසි 66 මගින් රු.42,033,000ක් වූ ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂයේදී මාරු කර තිබුණි.

(ii) චක්‍රලේඛයේ 03 ඡේදය පරිදි ප්‍රතිපාදන සීමා ඇතුලත වියදම් කළමනාකරණය කරගත යුතු වුවත් ප්‍රතිපාදන මුදලට අමතරව ත්‍යාග අරමුදල යටතේ ඇති ඉන්ධන අරමුදලෙන්ද, ඉන්ධන වියදම් ලෙස රු.18,577,015 ක් වැය කර තිබුණි.

**(ඉ) දැයට කිරුළ සංවර්ධන ප්‍රදර්ශනයේ වියදම්**

(i) 2011 ජූලි 29 දිනැති අංක 153 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 07 ඡේදය ප්‍රකාරව දැයටකිරුළ සංවර්ධන ප්‍රදර්ශනයේ වැඩසටහන් සඳහා වෙනම වැය විෂයයක් 2012 වර්ෂයේ ඇස්තමේන්තුව යටතේ නිශ්චිතව දක්වා තිබිය යුතු වුවද, එසේ කටයුතු නොකර අංක 247-1-1-2001 දරන (ගොඩනැගිලි ඉදිකිරීම්) වැය විෂයය යටතේ රු.2,195,898 ක වියදම් දරා තිබුණි.

(ii) දැයට කිරුළ ප්‍රදර්ශන ගොඩනැගිල්ල සඳහා වැයවූ රු.1,097,949 ක මුදලක් ආයතන 02 කින් අයවිය යුතු වුවත්, 2013 දෙසැම්බර් 31 දින වන විටත් එම මුදල් අයවී නොතිබුණි.

**(ඊ) අග්‍රිම ගිණුම**

2014 අප්‍රේල් 30 දිනට නොපියවූ අග්‍රිම ශේෂය රු. 4,751,600 ක් විය.

**(උ) විවිධ තැන්පත් ගිණුම**

2012 දෙසැම්බර් 31 දිනට විවිධ තැන්පතු ගිණුමේ ශේෂය රු.6,384,478,190 ක් විය. ඒ සම්බන්ධයෙන් තැන්පතු ලෙජරවල වර්ෂ දෙකක් ඉකුත් වූ සියළු තැන්පතු සඳහා අර්ධ වාර්ෂික ලැයිස්තු පිළියෙල කිරීම, තුලන ගිණුම පවත්වා ගැනීම, ශේෂයන් ඉදිරියට ගෙන යාම හා මාසික තැන්පතු සාරාංශ පිළියෙල කිරීම යනාදිය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571(1),(3),(4)සහ (5)වගන්තිවල ඇතුලත් ඇතැම් විධිවිධාන අනුගමනය කර නොතිබුණි. පොදුතැන්පත් ගිණුමේ විවිධ තැන්පතු ලැබීම් හා ගෙවීම්වලට අදාලව උපයෝගී ලෙජරයන්හි දක්වා ඇති කේවල ශේෂ එකතුන් හා ගිණුම්වල දක්වා ඇති කේවල ශේෂ එකතුන් අතර පිළිවෙලින් රු.1,350,464,983ක හා රු.344,636,927 ක ප්‍රමාණාත්මක වෙනස්කම් නිරීක්ෂණය විය.

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) රු.715,050 ක දණ්ඩන මුදල දණ්ඩන තැන්පතු ලෙජරයේ ගෙවීම්වල මුළු එකතුවෙන් අඩුකර සදොස් ලෙස දක්වා තිබුණ අතර කොළඹ දණ්ඩන ගිණුමට බැර කළ යුතු රු.1,700,000 ක මුදල සටහන් කර නොතිබුණි.

(ii) 2012 මාර්තු මස දණ්ඩන ලැබීම්වල එකතුව රු.42,736,101 ක් වුවද, එය ලෙජරයේ රු.60,000 ක් වැඩියෙන් දක්වා තිබුණ අතර ගිණුමේ රු.100,000 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(iii) වර්ෂ 02ක් ඉක්මවූ තැන්පත් මුදල් රාජ්‍ය ආදායමට බැරකර තැන්පතු ලෙජර හර කිරීමේදී එම හර කිරීම් තැන්පතු ලෙජරවලට නිවැරදි ලෙස හරකර නොමැති අවස්ථා නිරීක්ෂණය විය. එවැනි අවස්ථා දෙකක එකතු වටිනාකම රු.1,057,112 ක් විය.

(iv) ඕ.ර්. බීසීඑච්සී තැන්පතු ගිණුමේ(Outpanel Examination - Bulk Cargo Handling Charges)පැවති ශේෂය ඉක්මවා ප්‍රවර්තන වර්ෂය තුළදී ගෙවීම් කර ඇති බව වාර්තා කිරීම හේතුවෙන් වර්ෂය අවසානයට එම ගිණුමේ ශේෂය රු.269,450 ක හර ශේෂයක් බවට පත්වී තිබුණි. එය අසාමාන්‍ය තත්ත්වයක් බව නිරීක්ෂණය විය.

**(ඍ) ආදායම් ගිණුම්**

-----------------

ඉදිරිපත් කළ ගිණුම් නවයකට අනුව රු.11,455,193,303 ක් වූ ආදායම් හිඟ හිට තිබුණු අතර, එම හිඟ හිටි ආදායම් වලින් රු.5,563,026,761 ක් වර්ෂ තුනකට වැඩි කාලයක සිටදරු.4,315,649,690 ක් වර්ෂ 1 සිට වර්ෂ 3 දක්වා වූ කාල පරාසයකට ද අදාල විය. එම හිඟ හිටි ආදායම් අයකර ගැනීමෙ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.මුදල් රෙගුලාසි 128 (2) ප්‍රකාරව 2013 ජනවාරි 31 දිනට ඉදිරිපත් කළ යුතු හිඟ ආදායම් වාර්තාව 2013 අගෝස්තු 12 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි. ඉදිරිපත් කරන ලද හිඟ ආදායම් වාර්තාව හා ගිණුම් අතර රු.8,970 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර,ඒ සඳහා හේතු පැහැදිලි නොකෙරුණි.2011 වර්ෂයට සාපේක්ෂව 2012 වර්ෂයේ හිඟ ආදායම රු.1,526,850,254 කින් හෙවත් සියයට 15.38 ක ප්‍රතිශතයකින් වැඩි වී තිබුණි. හිඟ ආදායමින් සියයට 87.25 ක් හෙවත් රු.මිලියන 9,995 ක් වන ආදායම්, සංකේත අංක 10.01.01.00, 10.01.04.00 හෝ 10.01.05.01 ට අදාලවන පිළිවෙලින් ආනයන බදු, වරාය හා ගුවන්තොටුපල සංවර්ධන බදු සහ ආනයන සෙස් බදු ප්‍රමාණයන් විය. මෙම හිඟ ආදායම් රාජ්‍ය ආයතන වලින් ලැබිය යුතු හිඟ ආදායම් බවත් ප්‍රතිපාදන ලබාගෙන පියවීමට අදාල ආයතන වලට හා භාණ්ඩාගාරයට දන්වා යවා ඇති බවත් විගණනයට වාර්තා කර තිබුණි. එහෙත් මෙම හිඟ ආදායම් තුළ 2008 වර්ෂයේ සිට පැවත එන ශේෂයන්ද ඇතුලත්ව ඇති බව නිරීක්ෂණය විය.

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ආදායම් සංකේත අංක 10.02.05.03 ට අදාල වන රු.891,205,213 ක් වූ හිඟ ඛණිජ තෙල් නිෂ්පාදන බදු 2008,2009 වර්ෂවලට අදාල වන අතර ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවට හිඟ මුදල් ගෙවන ලෙස දන්වා ඇති බවට වාර්තා කර ඇතත්, 2013දෙසැම්බර් 31 දින තෙක් පියවා නොතිබුණි.

(ii) ආදායම් සංකේත අංක 10.02.05.02 අදාල රු.172,781,322 ක් වූ මත්පැන් බදු අදාල ආයතන විසින් ගෙවීම් පැහැර හැරීම හේතුවෙන් පවතින හිඟ ආදායම් වන අතර සමාලෝචිත වර්ෂයේදී මෙම හිඟ ආදායමින් කිසිදු මුදලක් ලැබී නොමැත.

(iii) ආදායම් සංකේත අංක 10.02.05.04 ට අදාල රු.343,691,886 ක් වූ හිඟ මෝටර් රථ බදු ප්‍රමාණය බදු අයකිරීම් කල් දැමීමේ පදනම මත රාජ්‍ය ආයතන වලට මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ඇතිව වාහන මුදා හැරීම නිසා හිඟ හිටීම හේතුවෙන් පවතින හිඟ ආදායම් බව නිරීක්ෂණය විය.

(iv) නිශ්පාදන බදු අංශයේ වාර්තා අනුව රු.31,554,740 ක් වූ හිඟ නිෂ්පාදන බදු අයකර ගැනීම සඳහා ආයතන 228ක් වෙත පවරන ලද නඩු සම්බන්ධයෙන් විධිවූ පරිදි ක්‍රියා නොකිරීම හේතුවෙන් එම බදු මුදල් හා ඒවාට පනවනු ලබන දඩ මුදල් රාජ්‍ය ආදායමට අහිමි වී තිබුණි.

**(ඩ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 24701 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2012 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟ හිට තිබුණු ශේෂවල එකතුව රු.8,304,943 ක් වූ අතර, එම හිඟ හිටි ශේෂ අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණ අතර පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ස්ථාන මාරු වී ගිය නිලධාරීන් දොළොස්දෙනෙකුගේ එකතුව රු.1,054,001 ක් වූ ණය ශේෂ මුදල් රෙගුලාසි 485 (4) හා 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 1.1.6 හා 1.1.7 වගන්ති ප්‍රකාර නිරවුල් කර නොතිබුණි.

(ii) දීර්ඝ කාලයක සිට ඉදිරියට ගෙන එනු ලබන විශ්‍රාම ගිය, මිය ගිය, වැඩ තහනම් කළහා සේවය හැර ගිය නිලධාරීන්ගේ හිඟ ණය අයකර ගැනීම් පිළිබඳව පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුනි. මේ පිළිබඳව ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4ඡේදයෙහි වගන්ති ප්‍රකාරව කටයුතු කර ඇති බවක් නිරීක්ෂණය නොවීය.

(iii) 2011 දෙසැම්බර් 30 දිනැති අංක 155 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 04 ඡේදයේ උපදෙස් වලට පටහැනි ලෙස රු.250,000 ඉක්මවා නිලධාරීන් 16 දෙනෙකුට ආපදා ණය ලෙස එකතුව රු.5,605,515 ක් ගෙවා ඇති බව නිරීක්ෂණය විය.

(iv) එක් නිලධාරිනියක් විසින් ස්ථාන දෙකකදී ආපදා ණය මුදල් දෙකක් ලබාගැනීම හේතුවෙන් වැඩිපුර ගෙවා ඇති රු.114,345 ක ණය මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(v) ඉදිරිපත් කර ඇති ගිණුම සමඟ වර්ෂය තුළ මුළු හර කිරීම් සහ වර්ෂය තුළ මුළු බැර කිරීම් සම්බන්ධව සාරාංශ වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි.

(vi) කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව හා පාලන ගිණුමේ ශේෂය අතර වෙනස වූ රු.28,867 සඳහා හේතු විගණනයට පැහැදිලි නොකෙරුණි.

**(ඒ) වෙනත් අත්තිකාරම් ගිණුම්**

අත්අඩංගුවට ගන්නාලද හා රාජසන්තක කර ලද බඩු ද්‍රව්‍ය පිළිබඳ වියදම් අත්තිකාරම් ගිණුම සම්බන්ධයෙන් රු.2,517,016 ක් වූ ලැබීම් තුල ඇතුලත් ශේෂ 156 කට අදාලව රු.645,894 ක් හෙවත් ලැබීම් වලින් සියයට 25.66 ක් වූ අතිරේක ලැබීම් වාර්තා කර තිබුණි. එම මුදලින් රු.2,100,219 ක මුදලක් 2007 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වාවූ කාලයට අදාල අතිරේක ලැබීම් බව නිරීක්ෂණය විය. පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) අත්තිකාරම් ලබාගත් යම් සිද්ධියක් සම්බන්ධයෙන් රේගු වැරදි නොමැති බව නිරීක්ෂණ වීමෙන් පසු විමර්ශන කටයුතු නවතා දමන අවස්ථාවලදී එවැනි සිද්ධි සඳහා ලබාගත් අත්තිකාරම් වලින් වූ පාඩු ආවරණය කරගත හැකි ක්‍රමවේදයක් හඳුන්වාදී නොතිබුණි.

(ii) ඇතැම් විමර්ශන ලිපිගොනු විගණනයට ලබා නොදීම හේතුවෙන් රු.13,136,701 ක් වූ නොපියවූ අත්තිකාරම් ශේෂය සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකි විය.

**12.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

**12.4.1 සංයුක්ත සැලැස්ම**

2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4)දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැලැස්මක් ශ්‍රී ලංකා රේගුව විසින් වර්ෂය ආරම්භයේදී පිළියෙල කල යුතු වුවත්, එම සැලැස්ම 2012 දෙසැම්බර් 31දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

**12.4.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

ඉහත 12.4.1 ඡේදයේ සඳහන් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය ප්‍රකාරව පිළියෙල කරන ලද සංයුක්ත සැලැස්මට අනුකූලව 2010 සහ ඉන් ඉදිරියට ශ්‍රී ලංකා රේගුව විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කරනොතිබුණි. සමාලෝචිත වර්ෂය තුලදී ක්‍රියාකාරී සැලැස්මක් නාමිකව සකස්කර තිබුණ ද, එයට අනුව කටයුතු කර ඇති බවක් නිරීක්ෂණය නොවීය.

**12.4.3 වාර්ෂික කාර්යසාධන වාර්තා**

ඉහත 12.4.1 ඡේදයේ හි සඳහන් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියේ සඳහන් 2002 සැප්තැම්බර් 12දිනැති අංක 402 සහ 2004 පෙබරවාරි 20 දිනැති අංක 402 (1) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාර ශ්‍රී ලංකා රේගුව විසින් පිළියෙල කළ යුතු වාර්ෂික කාර්යසාධන වාර්තාව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත විගණකාධිපතිට පිටපතක් සහිතව පාර්ලිමේන්තුවේ

සභාගත කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාල කාර්යසාධන වාර්තාව 2013 දෙසැම්බර් 31 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**12.4.4 විගණන කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම**

2012 වර්ෂය සඳහා කමිටු රැස්වීම් 03 ක් පමණක් පවත්වා තිබුණි.

**12.5 වත්කම් කළමනාකරණය**

**12.5.1 නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

පහත දක්වා ඇති සමහරක් වත්කම් නිශ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

(අ) බහාලුම් පරීක්ෂණ කටයුතු සඳහා සියයට 7.03 ක වාර්ෂික පොලී අනුපාතයක් යටතේ ලංකා බැංකුවෙන් ලබා ගත් එක්සත් ජනපද ඩොලර් 15,600,000 ක ණය මුදලක් වැය කර මිලට ගෙන තිබුණු ස්කෑන් යන්ත්‍ර හතර (04) ඌන උපයෝජිතව පැවතුණි.

(ආ) ශ්‍රී ලංකා රේගුව විසින් රු.859,500 ක් වැය කර මිලදී ගෙන තිබුණු ඇඟිලි අසලකුණු යන්ත්‍ර හතක් (07) ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. මෙම ඇඟිලි සලකුණු යන්ත්‍ර සඳහා වාර්ෂික රු.153,380 ක් සේවා ගිවිසුම් ගාස්තු ලෙස වැය කළද එම යන්ත්‍ර භාවිතවට ගෙන නොතිබුණි.

**12.5.2 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

2010 දෙසැම්බර් 17 දිනැති අංක පීඑෆ්/සමීක්ෂණ මණ්ඩල/01 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය මගින් සංශෝධිත 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාර 2012 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදු කර එම වාර්තා 2013 මාර්තු 31 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, ශ්‍රී ලංකා රේගුව විසින් අංශ තිස් පහකට අදාලව භාණ්ඩ සමීක්ෂණ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

**12.5.3 බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

ශ්‍රී ලංකා රේගුව විසින් ඉඩම් කැබලි තුනක් වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවට සහ පුද්ගලික පාර්ශ්වයන් දෙකටම අවිධිමත් ලෙස මුදා හැර තිබුණි.

**12.5.4 බේරුම් නොකළ බැරකම්**

ශ්‍රී ලංකා රේගුව විසින් 2012 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ වසර 01ට අඩු බැරකම් රු.76,817,356 ක් විය.

## 12.6 අනුකූල නොවීම්

### (අ) නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය වූ නීති,රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (i) ව්‍යවස්ථාපිත විධිවිධාන | |
| i. 2011 අංක 22 දරන දේශීය ආදායම් (සංශෝධන) පනතින් සංශෝධිත 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත | ඇතැම් නිලධාරීන්හට ගෙවනු ලබන බාහිර බහාලුම් පරීක්ෂණ ගාස්තු, ත්‍යාග ගෙවීම් යනාදිය ඔවුන් විසින් ගෙවිය යුතු උපනය විට ගෙවීම් බදු ගණන කිරීමේදී සැලකිල්ලට ගෙන නොතිබුණි. |
| ii. 2008 ජනවාරි 01 දිනැති 1530/13 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් නිවේදනය | රු. 25,000 ට වැඩි ගෙවීම් සඳහා රු. 25 ක මුද්දර ගාස්තු අය නොකළ අවස්ථා 51 ක් නිරීක්ෂණය විය. |
| (ii) ආයතන සංග්‍රහය | |
| XII පරිච්ඡේදයේ (1) වන වගන්තිය XIV පරිච්ඡේදයේ 2.1, 4.1, 28.6.1 වගන්ති සහ XLVIII වැනි පරිච්ඡේදයේ 13.2 වගන්තිය | නිවාඩු ලේඛන, ගමන් වියදම්, සංයුක්ත දීමනා, විනය පරීක්ෂණ යනාදිය සම්බන්ධයෙන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණු අවස්ථා විය. |
| (iii) මුදල් රෙගුලාසි | |
| මුදල් රෙගුලාසි136,137, 137 (6), 156 (5), 206 (1), 206 (1)(අ), 225 (4), 232 (2), 237 (ආ), 257, 262 (2) | ගෙවීම් වවුචර් පිළියෙල කිරීම, මාසික විදුලි පාරිභෝජන රටාවේ වෙනස්වීම්, ගෙවීම් වවුචර් වල සිදු කර ඇති වෙනස් කිරීම්, තැන්පතු වලින් ආපසු ගෙවීම්, ගබඩා භාණ්ඩ ලේඛනගත කිරීම යනාදිය සම්බන්ධයෙන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණු අවස්ථා විය. |

(iv) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ

| | |
|---|---|
| 2009 අප්‍රේල් 16 දිනැති අංක 19/2009 සහ 2009 ජුනි 17 දිනැති අංක 09/2009 (1) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා කර නොතිබුණ අතර පැමිණීමේ ලේඛනයද අත්සන් කර නොතිබුණි. |

(v) භාණ්ඩාගාර චක්‍රලේඛ

| | |
|---|---|
| 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | නියමිත පරිදි පරිගණක සහ උපාංග මිලදී ගැනීම සම්බන්ධ ලේඛණයක් පවත්වා නොතිබුණි. |

(vi) රාජ්‍ය මුදල් චක්‍රලේඛ

| | |
|---|---|
| රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 431 | ගුවන් යානා පත්‍ර අදාල සමාගම් වලින් මිලදී නොගත් අවස්ථා 05 ක් ද, ගුවන් ගමන් සංවිධානය කිරීමේ කටයුතු අදාල සමාගම් වෙතින් ඉටුකර නොගත් අවස්ථා 02 ක්ද නිරීක්ෂණය විය. |

(vii) දෙපාර්තමේන්තු නියෝග

| | |
|---|---|
| i. 2001 ජූලි 20 දිනැති ඩීඕපීඑල් 8 (DOPL 8)එල් 375 | රාජකාරි ස්ථානයෙන් බැහැර යාමේදී, බැහැර යාමේ ලේඛණයේ පිටවීම හා නැවත පැමිණීම ඇතුලත් කර සහතික කර නොතිබීම සහ බැහැර යාමේ ලේඛණය භාවිතා නොකළ අවස්ථා විය. |
| ii.2010 ජනවාරි 19 වන දිනැති අංත 01/2010 දරන දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 3.02 ඡේදය | කාර්යාලයට ප්‍රමාද වී පැමිණීමට ලබාදෙන උපරිම සහන කාලය, එදිනම පිටවීමේදී ආවරණය කර නොතිබුණු අවස්ථා විය. |

**(ආ) බදු අවශ්‍යතාවන්ට අදාල නොවීම**

2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 114 හා 116 දරන වගන්ති ප්‍රකාරව 2011අප්‍රේල් 01දින දේශීය ආදායම් කොමසාරිස් විසින් ආදායම් බදු චක්‍රයක් හා ඒවා භාවිතා කිරීම පිළිබඳව උපදෙස් මාලාවක් නිකුත් කර තිබුණි. එහෙත් ශ්‍රී ලංකා රේගුව විසින් නිලධාරීන්ට ත්‍යාග මුදල් ගෙවීමේදී මෙම බදු චක්‍රය හා ඊට අදාල උපදෙස් සැළකිල්ලට ගෙන නොතිබුණු අවස්ථා විය. ඒ අනුව නිලධාරීන්ට ගෙවන ත්‍යාග මුදල් එකවර ගෙවීමක් ලෙස සලකා කටයුතු කර තිබුණු නමුත් අවස්ථා කිහිපයකදී ගෙවනු ලබන ගෙවීම් සමුච්චිත කර අවසාන වශයෙන් අයකර ගතයුතු බදු ගණනය කිරීමක් සිදු කර නොතිබුණි. විවිධ අවස්ථාවල ගෙවන ත්‍යාග මුදල් සඳහා වෙන වෙනම උපයන විට බදු ගණනය කර එයට අදාළ කොටස පමණක් අය කිරීම හේතුවෙන් විශාල වශයෙන් රජයට ලැබිය යුතු බදු ආදායමක් අහිමි වී තිබුණි. විවිධ දීමනා ගණනාවක් ලබන රේගු නිලධාරීන්ගෙන් රජයට අය විය යුතු බදු මුදල් නිවැරදිව ගණනය කිරීම සඳහා විධිමත් වැඩපිලිවෙලක් යොදා නොතිබුණි. ත්‍යාග ගෙවීම් සම්බන්ධයෙන්විගණනයේදී සිදුකළ ගණනය කිරීම් අනුව නිලධාරින් 234 දෙනෙකුගෙන් පමණක් 2012/2013 බදු වර්ෂය තුලදී**,** එසේ අඩුවෙන් අය කර තිබුණු උපයන විට ගෙවීම් බදු ප්‍රමාණය දළ වශයෙන් රු.4,823,846 ක් විය.

## 12.7. කාර්ය සාධනය

2012 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව අනුව ශ්‍රී ලංකා රේගුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

| බදු වර්ගය | 2012 වර්ෂය සංශෝධිත ඇස්තමේන්තු අනුව බදු ආදායම | 2012 වර්ෂය තත්‍ය බදු ආදායම | 2012 වර්ෂය තත්‍ය බදු ආදායම ඇස්තමේන්තුගත ආදායමේ ප්‍රතිශතයක් ලෙස | 2011 වර්ෂය සංශෝධිත ඇස්තමේන්තු අනුව බදු ආදායම | 2011 වර්ෂය තත්‍ය බදු ආදායම | 2011 වර්ෂය තත්‍ය බදු ආදායම ඇස්තමේන්තුගත ආදායමේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|---|
| | රු. මිලියන | රු. මිලියන | | රු. මිලියන | රු.මිලියන | |
| ආනයන බදු | 76,830 | 73,489 | 95.65 | 80,252 | 76,010 | 94.71 |
| අපනයන බදු | 20 | 21 | 105.00 | 30 | 17 | 56.67 |
| වරාය හා ගුවන්තොටුපලබදු | 75,211 | 70,111 | 93.22 | 65,032 | 66,028 | 101.53 |
| සෙස් බදු - (ආනයන) | 29,287 | 29,604 | 101.08 | 26,366 | 26,876 | 101.94 |
| මෝටර්රථ අනුග්‍රහ බදු | - | - | - | - | 1 | |
| ප්‍රාදේශීය යටිතල පහසුකම් බදු | - | - | - | - | 6 | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| සෙස් බදු - (අපනයන) | 3,120 | 3,136 | 100.54 | 3,000 | 2,785 | 92.83 |
| විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද | 36,608 | 33,666 | 91.96 | 14,711 | 15,622 | 106.19 |
| සිගරට් | 54,924 | 53,529 | 97.46 | 49,804 | 49,589 | 99.57 |
| මත්පැන් | - | 39 | - | - | - | |
| ඛණිජතෙල් | 23,000 | 28,466 | 123.77 | 26,449 | 22,470 | 84.96 |
| මෝටර්රථ | 57,510 | 46,496 | 80.85 | 49,362 | 52,835 | 107.04 |
| අනෙකුත් | 5,132 | 3,336 | 65.00 | 2,973 | 5,797 | 194.99 |
| ඇහලුම් සඳහා දේශීය වියදම් ගාස්තු | 100 | 104 | 105.00 | 70 | 94 | 134.29 |
| මුළු එකතුව | 361,742 | 341,997 | 94.54 | 618,049 | 318,130 | 100.03 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2012 වර්ෂයේ සංශෝධිත ඇස්තමේන්තුව අනුව අපේක්ෂිත බදු ආදායමේ තථ්‍ය කාර්ය සාධනය සමස්ථයක් ලෙස සියයට 5.46 කින් අඩු වී තිබුණු අතර, ඉකුත් වර්ෂයෙහි එය සියයට 0.03 කින් වැඩි වී තිබුණි.

(ආ) රු.මිලියන 20,000 ඉක්මවා ආදායම් ලබන බදු ආදායම් සංකේතාංක හත (7) අතුරින් ඇස්තමේන්තුගත ඉලක්ක ඉක්මවා යාමට සමත්ව ඇත්තේ ප්‍රධාන වශයෙන් ඛණිජ තෙල් මත අය කරන නිෂ්පාදන බදු ආදායමින් පමණක් වන අතර ආනයන සෙස් බදු ආදායමේදී සුළු ඉක්මවා යාමක් පමණක් නිරීක්ෂණය විය. එම බදු ආදායම් වල තත්‍ය කාර්යසාධනය පිළිවෙලින් සියයට 123.77 හා 101.08 ක් විය. අනෙක් ප්‍රධාන බදු ආදායම් සංකේතාංක පහම (5) අපේක්ෂිත ඉලක්ක කරා ලඟා වී නොතිබුණි.

(ඇ) ආදායම් සංකේතාංක පහලොවක් (15) යටතේ ආදායම් ගිණුම් පහලොවක් (15) ඉදිරිපත් කර තිබුණද ආදායම් ඇස්තමේන්තු ඉදිරිපත් කර තිබුණේ සංකේතාංක එකොලහක් (11) සඳහා පමණි. ඉතිරි ආදායම් සංකේත 4 න් සංකේත 3 ක් සඳහා තත්‍ය බදු ආදායමක්ද නොවූ අතර මත් පැන් බදු ආදායම් සංකේතායේ පමණක් තත්‍ය ආදායම රු.මිලියන 39 ක් විය. මෙසේ වැඩි වී ඇති ආදායමින් රු. මිලියන 18,044 ක් හෙවත් සියයට 76 ක්ම අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය මත පනවා ඇති විශේෂ වෙළඳ භාණ්ඩ මත විටින් විට පනවා තිබුණු බදු වලින් එකතු කළ ආදායමක් විය.

(ඈ) සමස්ථයක් ලෙස 2011 වර්ෂයට සාපේක්ෂව 2012 වර්ෂයේදී උපයා තිබූ බදු ආදායම රු.මිලියන 23,869 කින් හෙවත් සියයට 7.5 කින් වැඩි වී තිබුණි. 2012 වර්ෂයේ ආදායම් ව්‍යුහය තුළ ඉහලම දායකත්වය ආනයන බදු,වරාය හා ගුවන් තොටුපල බදු හා සිගරට් හා මෝටර් රථ සඳහා වන නිෂ්පාදන බදු වලින් ලැබී තිබුණු අතර, එය මුළු ආදායමේ ප්‍රතිශතයක් ලෙස පිළිවෙලින් සියයට 21.49 ක්, 20.59 ක්, 15.65 ක් හා 13.59 ක් විය. එසේම මෝටර් රථ නිෂ්පාදන බදු සහ ආනයන බදු ආදායම් ඉකුත් වර්ෂයට වඩා අඩු වීම, ආදායම් ව්‍යුහයේ කැපී පෙනෙන ලක්ෂණයක් වූ අතර, එම අඩුවීම පිළිවෙලින් රු.මිලියන 6,339 ක් හා රු.මිලියන 2,521 ක් විය. එම අඩුවීම ඉකුත් වර්ෂයේ ආදායම් ප්‍රතිශතයක් ලෙස සියයට 12ක් හා සියයට 3.32 ක්විය. විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු ආදායම හැරුනු විට මෙම වර්ධනය සඳහා පහත සඳහන් හේතු වලින් ඇතිවන

බලපෑම සංඛ්‍යාත්මකව විග්‍රහ කිරීමට තරම් දත්ත ලබා ගත නොහැකි වුවද එම හේතු වලින් ජනිත වන ආදායම ද මෙම වර්ධනයට ප්‍රමාණාත්මක බලපෑමක් සිදු කළ හැකි බව විගණනයේදී නිරීක්ෂණය විය.

(i) ආනයනය කරනු ලබන භාණ්ඩ හා සේවා ප්‍රමාණයන්හි වර්ධනය

(ii) විදේශ විනිමය අනුපාතයන්හි ඇති වන විචලනය

(iii) ආනයනය කරනු ලබන භාණ්ඩ හා සේවා වල මිල ගණන්වල උච්චාවචනය

(iv) විටින් විට සිදු කරනු ලබන බදු සංශෝධනයන්

(ඉ) 2012 වර්ෂය තුල ශ්‍රී ලංකා රජයේ සමස්ථ වැට් බදු ආදායම රු.මිලියන 204,656 ක් වූ අතර,එම වැට් බදු ආදායම තුල ශ්‍රී ලංකා රේගුව විසින් ආනයන මත එකතු කර තිබුණු රු.මිලියන 99,469 ක වැට් බදු ප්‍රමාණයක්ද අඩංගු විය. රජයේ වැට් බදු ආදායමින් සියයට 48.6කට ආසන්න මුදලක් ශ්‍රී ලංකා රේගුව විසින් එකතු කර තිබුණද,වැට් බදු ආදායම සම්බන්ධව ගණන්දීමේ වගකීම දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා සතුවන බැවින් ශ්‍රී ලංකා රේගුවේ ආදායම් ගිණුම තුල වැට් බදු සම්බන්ධ තොරතුරු අනාවරණය වී නොතිබුණි. තවද විදේශ වෙළඳාම මත ශ්‍රී ලංකා රේගුව විසින් එකතුකර තිබුණු රු.මිලියන 15,660 ක ජාතිය ගොඩනැගීමේ බදු මුදල සම්බන්ධයෙන් ද ගණන් දීමේ වගකීම පැවරී ඇත්තේ දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත හෙයින් ශ්‍රී ලංකා රේගුවේ ආදායම් ගිණුම්වල එම ආදායම් පිළිබඳ තොරතුරු ද, අනාවරණය වී නොතිබුණි.

## 12.8 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

ශ්‍රී ලංකා රේගුව විසින් කර ඇති සමහර ගනුදෙනු මතභේදාත්මත ස්වරූපයේ ඒවා විය. නියැදි පරීක්ෂණ වලදී එසේ අනාවරණය වූ ගනුදෙනු කිහිපයක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) නිලධාරීන් විසින් ඔවුන්ගේ සාමාන්‍ය රාජකාරියක් ස්වරූපයෙන් සිදුකරන ඇතැම් කාර්යයන් සඳහා ද දැනට ක්‍රියාත්මක වන ත්‍යාග යෝජනා ක්‍රමය යටතේ විශාල වශයෙන් මුදල් ලබාදෙන බව ඉකුත් විගණන විමසුම් මගින් පෙන්වාදී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී විගණනයට භාජනය කළ ලිපිගොනු 2 කින් පමණක්මේ ආකාරයෙන් නිලධාරීන් වෙත රු.3,964,847 ක් ත්‍යාග ලෙස ගෙවා ඇති බව නිරීක්ෂණය විය. මෙසේ ත්‍යාග මුදල් ලබාගෙන ඇත්තේ නැවත අපනයනය කිරීමේ පරමාර්ථයෙන් තීරුබදු රහිතව ආනයනය කළ වාහන 02 ක්මෝටර්රථ ප්‍රවාහන කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කිරීම සඳහා අවසරය ඉල්ලා අදාල පාර්ශවයන් විසින් කරන ලද ඉල්ලීමකට අනුව තක්සේරු කරන ලද වාහනවල වටිනාකම පදනම් කරගෙනය.

(ආ) දැනට පවත්නා ත්‍යාග යෝජනා ක්‍රමය මගින් රාජ්‍ය ආදායම සුරක්ෂිත කිරීම සඳහා ලැබී ඇති දායකත්වය මතභේදාත්මක බව ඉකුත් විගණන වාර්තා මගින් පෙන්වා දී තිබුණි. පවතින නීතිරීති අනුව රේගු වැරදි සඳහා පනවන දණ්ඩන මුදල්වලට අමතරව එම වැරදි මගින් රජයට අහිමි වන බදු ආදායමෙන්ද විශාල කොටසක් නිලධාරීන්ට ත්‍යාග වශයෙන් ගෙවා තිබුණද රේගු බදු වංචාවල සැලකියයුතු පාලනයක් සිදු වී ඇති බවක් නිරීක්ෂණය නොවීය. ශ්‍රී ලංකා රේගුවේ මධ්‍යම විමර්ශන අංශය විසින් පමණක් 2011 හා 2012 වර්ෂයන් තුල කටයුතු අවසන් කරන ලද විමර්ශන 46 කින් එකතුකර තිබුණු රු.183,970,904 ක මුදලින් නිලධාරීන්ට ත්‍යාග වශයෙන් ගෙවා ඇති මුදල රු.91,985,452 ක් විය.

(ඇ) ශ්‍රී ලංකා රේගුව විසින් රු. මිලියන 7,149 ක ඇස්තමේන්තුගත පිරිවැයකට නව රේගු ගොඩනැගිල්ල ඉදිකිරීමට සැළසුම් කර තිබුනු අතර මෙම ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා උප කොන්ත්‍රාත්තු 10 ක් යටතේ මිල ගණන් කැඳවා තිබුණි. මෙම ගොඩනැගිල්ලේ මහජන ඇමතුම් පද්ධතියක් සඳහා ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 22 ක් වූ අතර මේ සම්බන්ධයෙන් සිදුකළ විගණන පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) කොන්ත්‍රාත්තුව සඳහා ආයතන 07 ක් මිල ගණන් ඉදිරිපත් කර තිබුනු අතර නියමිත දිනට අයි.සී.ටී.ඒ.ඩී. (ICTAD) සහතිකය ලබා නොතිබුණු ආයතනයන් වෙතකොන්ත්‍රාත්තුව පිරිනැමීම සඳහා අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන අභියාචනා කමිටුව විසින් තීරණය කර තිබුණි.

(ii) අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටුව විසින් බොහොමයක් කරුණු සලකා බලා තෝරාගත් කොන්ත්‍රාත්කරු ප්‍රතික්ෂේප කරමින් මෙම තීරණය ගෙනතිබුණු අතර ගණිතමය නිවැරදිතාවලින් පසු කොන්ත්‍රාත්තුවේ වටිනාකම රු.18,852,551 ක් විය.

(iii) ලංසුකරුවන්ගේ උපදෙස් ලේඛනය අනුව වර්ෂ 05 ක නඩත්තු පිරිවැයද ඇතුළුව මිල ගණන් ඉදිරිපත් කළ යුතු වුවද අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන අභියාචනා කමිටුව විසින් තෝරාගත් කොන්ත්‍රාත්කරුගේ මිල ගණන් වලට නඩත්තු පිරිවැය ඇතුලත්ව නොතිබුණි. මෙම කොන්ත්‍රාත්කරු විසින් වාර්ෂිකව පිරිවැයෙන් සියයට 5 සිට සියයට 12 තෙක් වැඩිවන ක්‍රමය යටතේ නඩත්තු පිරිවැය වෙනමම දක්වා තිබුණු අතර එම පිරිවැය කොන්ත්‍රාත්කරු තෝරා ගැනීමේදී සැලකිල්ලට ගෙන ඇති බවත් නිරීක්ෂණය නොවීය.

(iv) අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටුව විසින් මුලින් තෝරාගත් කොන්ත්‍රාත්කරුගේ මුළු පිරිවැයට නඩත්තු පිරිවැයද ඇතුලත්ව තිබුණු අතර, ඔහුගේ මුළු පිරිවැය රු.22,488,687 ක් විය.

(v) නඩත්තු පිරිවැයද ඇතුළුව අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන අභියාචනා කමිටුව විසින් තෝරාගත් කොන්ත්‍රාත්කරුගේ මුළු පිරිවැය රු.25,356,681 ක් වීම හේතුවෙන් මුලින් තෝරාගත් කොන්ත්‍රාත්කරු ප්‍රතික්ෂේප කිරීම නිසා රජයට සිදුවී ඇති ඇස්තමේන්තුගත අලාභය රු.2,867,994 ක් බව නිරීක්ෂණය විය. තවද, මෙම කොන්ත්‍රාත්තුව පිරිනමා ඇති ආයතනය ඉදිරිපත් කළ මිලට වඩා රු.6,504,130 ක් ගෙවීමට සිදුවිය හැකි බවද තවදුරටත් නිරීක්ෂණය විය.

(ඈ) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි සමාගමක් විසින් ශ්‍රී ලංකා රේගුවට සහ ආයෝජන මණ්ඩලයට එකිනෙකට පරස්පර තොරතුරු ඉදිරිපත් කිරීම නිසා ආරම්භ කර තිබුණු රේගු විමර්ශන කටයුත්තක් කිසිදු හේතුවක් නොදක්වා 2009 ඔක්තෝබර් 08 දින සිට අත්හැරදමා ඇති බව නිරීක්ෂණය විය. අදාල සමාගම මීට පෙරද රේගු බදු වංචා සිදු කර ඇති ආයතනයක් බව තහවුරු වී තිබුණු අතර ආයෝජන මණ්ඩලයට ඉදිරිපත් කර තිබුණු එක්සත් ජනපද ඩොලර් 382,122 ක වටිනාකම ශ්‍රී ලංකා රේගුව වෙත එක්සත්

ජනපද ඩොලර් 64,933 ක් ලෙස වාර්තා කිරීම වරදක් බව ලිපිගොනු අනුව නිරීක්ෂණය විය. කෙසේ වුවද මෙම වටිනාකමේ වෙනස පිළිබඳව දේශීය සමාගම හා එම සමාගමේ මවු සමාගම වන ඉන්දියානු සමාගමද එකිනෙකට පරස්පර තොරතුරු ඉදිරිපත් කර ඇති බව තහවුරු වී තිබියදී මෙසේ විමර්ශන කටයුතු අත්හැරීම මතභේදයට තුඩුදෙන කරුණක් විය. ආනයනිත භාණ්ඩවල වටිනාකම එක්සත් ජනපද ඩොලර් 382,122 ක් වූයේ නම් එයින් අයවිය යුතුව පැවති රේගු බදු වටිනාකම රු.2,500,000 ක් බව වාර්තා වී තිබුණි.

**12.9** අධිකාර බලය නොමැති ගනුදෙනු

---

කාර්නෙට් (Carnet)යෝජනා ක්‍රමය යටතේ ආනයනය කර ඇති වාහන සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රේගුව විසින් දැනට අනුගමනය කරනු ලබන ප්‍රතිපත්තියට පටහැනිව වාහනයක් ආනයනකරු වෙත මුදා හැර තිබුණු අතර එහිදී වාහනයේ තක්සේරු වටිනාකම වන රු.834,028 ක මුදල අයකර ගැනීම අත්හැර තිබුණි. මේ සඳහා විධිමත් අනුමැතියක් ලැබී නොතිබුණු අතර එය රජයට සිදු වූ අලාභයක් ලෙස නිරීක්ෂණය කරනු ලැබේ. මෙම වාහනය සඳහා දේශීය නියෝජිත ආයතනය විසින්ද අවස්ථා දෙකකදී වාහනයේ වටිනාකම සඳහා මිල ගණන් දෙකක් ඉදිරිපත්කර තිබුණු අතර ඉන් වැඩි වටිනාකම සැලකිල්ලට ගත්තේනම් අහිමි වූ ආදායම රු.1,033,920 ක් බව තවදුරටත් නිරීක්ෂණය විය.

**12.10** වංචනික ස්වරූපයේ ගනුදෙනු

---

මධ්‍යම අපහරණ අංශය මගින් අලෙවිකරන වාහන වලට අදාල දත්ත වංචනික ලෙස වෙනස්කර මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කිරීම මගින් මහාපරිමාණ බදු වංචා සිදු කෙරෙන අතර ඒවා වැළැක්වීම සඳහා ප්‍රමාණවත් ආරක්ෂිත ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. මේ ආකාරයෙන් ප්‍රදර්ශනයක් සඳහා රේගු බදු ගෙවීමකින් තොරව ගෙන එන ලද විදුලි කාර් රථ දෙකක් අදාල සමාගම බුන්වත් වීම හේතුවෙන් රේගුව භාරයට ගෙන එකක් රු.91,376 කට හා අනෙක රු.105,958 කට මධ්‍යම අපහරණ අංශය මගින් අලෙවිකර තිබුණි. රු.105,958 කට අලෙවි කරන ලද වාහනයේ වැසි අංකය වැරදි සහගත එකක් බව මිලදී ගත් පාර්ශවය විසින් ශ්‍රී ලංකා රේගුවට වාර්තා කර වෙනත් වැසි අංකයක් සාවද්‍ය ලෙස ශ්‍රී ලංකා රේගුවේ,මෝටර් රථ ප්‍රවාහන දෙපාර්මේන්තුවට සම්බන්ධ පරිගණක ජාලයට ඇතුලත් කර,Hummer වර්ගයට අයත් රු.මිලියන 36 කට වඩා වටිනා වාහනයක් ව්‍යාජ ලෙස ලියාපදිංචි කර නියමිත බදු මුදල වංචා කර තිබුණි. මෙහිදී වැසි අංකයට අමතරව වාහන වර්ගීකරණ අංකයද වෙනස් කරමින් මොටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට දත්ත සම්ප්‍රේෂණය කිරීම කර තිබුණි.

**12.11** පාඩු හා අලාභහානි

---

විනාශ වූ බෝට්ටුවකට සිදු වූ රු.6,455,000 ක අලාභය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 සිට 109 දක්වා වූ විධි විධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**12.12** අනාර්ථික ගනුදෙනු

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රේගු නිලධාරීන්ට ආහාර හා තේ සැපයිම වෙනුවෙන් වාර්ෂිකව විශාල මුදලක් ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙත ගෙවා තිබුණු අතර 2012 වර්ෂයේදී එසේ ගෙවා තිබුණු මුදල රු.4,982,805 ක් විය. මෙම මුදල් ගෙවීම් සම්බන්ධව ශ්‍රී ලංකා රේගුවේ කිසිඳු අංශයක් විසින් විධිමත් අධීක්ෂණයක් සිදු කර නොතිබුණු අතර නිරීක්ෂණය වූ දුර්වලතා කිහිපයක් පහත දැක්වේ.

(i) තත්‍ය වශයෙන් සැපයිය යුතු ආහාර හා තේ වේල් ප්‍රමාණය පිළිබඳ දෛනික විමර්ශන සිදු නොකර සෑම මසකම සපයා ඇති ආහාර හා තේ වේල් ප්‍රමාණය පිළිවෙලින් 3000 ක් හා 3400 ක් ලෙස සලකා මුදල් ගෙවීම.

(ii) නියමිත වෙලාවන්හිදී රාජකාරිවල නිරත වූ තත්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳව කිසිඳු සොයා බැලීමකින් තොරව ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ඉදිරිපත් කරන බිල්පත් හා ඉන්වොයිසි පදනම් කරගෙන ගෙවීම් කිරීම.

(ආ) 2012 වර්ෂය තුළ දේශීය ගමන්වියදම් ලෙස රු.32,999,958 ක් වැය කර තිබුණු අතර,ගමන්වියදම් දැරීමේදී ශ්‍රී ලංකා රේගුව විසින් සකසුරුවම් ලෙස කටයුතු නොකළ අවස්ථාද,පවතින නීතිරීති වලට අනුකූලව කටයුතු නොකළ අවස්ථාද,විශේෂයෙන් මාස 06 කට වරක් සිදුකරන අඛණ්ඩ ස්ථානමාරු ප්‍රතිපත්තිය සෑම නිලධාරියෙකුම සම්පූර්ණ මාසයක් සඳහා සංයුක්ත දීමනා ලබා ගත හැකිවන පරිදි ක්‍රියාත්මක කර ඇති අවස්ථාද නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

(ඇ) 2012 මාර්තු මස 01 දින විශ්‍රාම යාමට නියමිතව සිටි නිලධාරියෙකු වෙනුවෙන් 2012 ජනවාරි මස රු.279,000 ක පුහුණු වියදමක් දරා තිබුණි.

(ඈ) 1572/25 සහ 2008 ඔක්තෝබර් 24 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පල කරන ලද නිවේදනය ප්‍රකාරව නියමිත කාල සීමාව තුලදී විදුලි බිල්පත් නොගෙවීම හේතුවෙන් රු.787,907 ක පොලී මුදලක් ගෙවා තිබුණි.

**12.13 කළමනාකරණ දුර්වලතා**

පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය තුළ කාර්ය මණ්ඩල දිරි දීමනා ලෙස රු.246,317,867 ක් වැය කර තිබුණ අතර මෙම දිරි දීමනා ගෙවීම සඳහා කිසිඳු කාර්ය සාධන ඇගයීමක් සිදු කළ බවට සාක්ෂි නොවීය. භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ එච්.එෆ් 1/04/CUS/115 - 27 දරන 2011 දෙසැම්බර් 13 ලිපිය අනුව කාර්ය සාධන ඇගයීම් පදනම් කර ගෙන දිරි දීමනා ගෙවීමට අනුමත කර ඇතත් කාර්ය සාධනය පදනම් කර නොගෙන කාර්ය මණ්ඩලයේ පැමිණීම පමණක් පදනම් කරගෙන දිරි දීමනා ගෙවා තිබුණු අතර නිවාඩු පදනම් කර ගැනීමේදී නිවාඩු නිවැරදිව ගණනය කර නොතිබුණු අවස්ථා ද නිරීක්ෂණය විය. තවද, දිරි දීමනා ගෙවීම මූලික වැටුපෙන් සියයට 50 ක උපරිමයට සීමා කර තිබුණද ලබා ගත් නිවාඩු සඳහා දිනකට වැටුප අඩු කිරීම වෙනුවට වැටුපෙන් සියයට 50 ක් පමණක් අඩුකර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ විදේශ ගමන් වියදම් සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදනවලින් රු.672,971 ක් ද කළමනාකරණ හා වන්දි අරමුදලෙන් රු.21,915,688 ක් ද වශයෙන් එකතුව රු.22,588,659 ක් වැය කර තිබුණි. විදේශ ගමන් වියදම් සම්බන්ධව කරන ලද නියැදි විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය වූයේ විදේශ පුහුණුව සඳහා යන සමහර නිලධාරීන් විසින් එම පුහුණුව පිළිබඳ ප්‍රගතිවාර්තා ඉදිරිපත් නොකළ අවස්ථාද, එම වාර්තා පිළිබඳ නිසි ඇගයීමක් සිදු නොකරන අවස්ථාද, ඉදිරිපත් කරන වාර්තාවල අන්තර්ගත තොරතුරු සමුළුවලදී බෙදා දුන් නිබන්ධන හා න්‍යාය පත්‍රයන් ආදිය බවද, ගුවන් ප්‍රවේශපත්‍ර මිලදී ගැනීමේදී විධිමත්ව ක්‍රියානොකළ අවස්ථාද නිරීක්ෂණය විය.

(ඇ) කාර්නෙට් (Carnet) අන්තර්ජාතික ලියවිලි භාවිතා කර නැවත අපනයනය කිරීමේ පරමාර්ථයෙන් තීරුබදු රහිතව ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන වාහන බොහොමයක් නැවත අපනයනය නොකර දේශීයව පරිහරණය කරන බව නිරීක්ෂණය විය. මෙම වාහන නිසා රජයට සිදු වන බදු අලාභයන් අවම කර ගැනීම සඳහා ශ්‍රී ලංකා රේගුව විසින් ක්‍රියාත්මක කරනු ලබන ක්‍රමවේදයේ මන්දගාමී බවක් නිරීක්ෂණය විය. 2011 හා 2012 වර්ෂවලදී මෙවැනි වාහන 254 ක් සම්බන්ධව ශ්‍රී ලංකා රේගුවේ මධ්‍යම විමර්ශන අංශය විසින් විමර්ශන ආරම්භ කර තිබුණද වාහන 144 ක් සම්බන්ධයෙන් අදාල විමර්ශන කටයුතු 2012 දෙසැම්බර් 31 දින දක්වාත් නිමකර නොතිබුණි. විමර්ශන කටයුතු අවසන් කර තිබූ වාහන 46 කට අදාලව එකතු කර තිබුණු දණ්ඩන හා අභිමි කිරීම් ආදායම රු.183,970,904 ක් වුවද, විමර්ශන කටයුතු නිම නොකළ වාහන 144 සම්බන්ධයෙන් දණ්ඩන හා අභිමි කිරීමේ වටිනාකම තීරණය කර නොතිබුණි.

(ඈ) ශ්‍රී ලංකා රේගුවේ රේගු විමර්ශන කටයුතු ක්‍රියාවලිය හා සෘජුව සම්බන්ධ වන මධ්‍යම පරීක්ෂණ කාර්යාංශයේ රේගු විමර්ශන කටයුතු සම්බන්ධ කාර්යසාධනය ප්‍රමාණවත් මට්ටමක නොමැතිබව නිරීක්ෂණය විය. මෙම අංශය විසින් 2011 හා 2012 වර්ෂවලදී කටයුතු ආරම්භකර තිබූ විමර්ශන 111 කින් 84 ක්ම 2012 දෙසැම්බර් 31 දින වන විට අවසන් කර නොතිබුණි. රේගු අධ්‍යක්ෂවරයෙකු, නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂවරු දෙදෙනෙකු රේගු අධිකාරිවරුන් 09 දෙනෙකු ඇතුළුව 40 කගෙන් යුත් කාර්ය මණ්ඩලයක් මෙම අංශයට අනුයුක්ත කර තිබුණු අතර මෙම අංශයේ කටයුතුවලින් 2011 හා 2012 වර්ෂවල එකතුකර තිබූ මුදල රු.587,464,063 ක් වුවද ඉන් රජයේ ආදායමට බැර කර තිබුණේ රු.176,239,219 ක් පමණි.

(ඉ) රේගු විමර්ශන කටයුතුවල පවතින අසාමාන්‍ය ප්‍රමාදයන් නිසා රාජසන්තක කරන ලද භාණ්ඩ විනාශයට පත්වීම හේතුවෙන් රජයට විශාල වශයෙන් පාඩු සිදුවන අවස්ථා පිළිබඳව ඉකුත් විගණන වාර්තාවලින් පෙන්වා දී තිබුණි. මේ ආකාරයෙන් 2008 වර්ෂයේදී කොළඹ වරායේ අත්හැර ගොස් තිබුණු ඇඟළුම් අඩංගු බහාළුම් 04 ක් සඳහා වූ රේගු විමර්ශන කටයුතු 2008 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා මන්දගාමීව සිදුවීම හේතුවෙන් රෙදි තොගය ස්වාභාවික ආපදාවකට ලක්වී තිබුණි. මෙම රෙදි තොගය 2009 නොවැම්බර් මස රු.3,951,595 කට තක්සේරු කර තිබුණද ස්වාභාවික ආපදාව නිසා 2012 අප්‍රේල් 01 වන දින එම රෙදි තොගය රු.527,500 කට විකිණීමට සිදුවීම හේතුවෙන් වූ අලාභය රු.3,424,095 ක් විය. ශ්‍රී ලංකා රේගුවේ ආයෝජන මණ්ඩල සම්බන්ධීකරණ අංශය විසින් මෙම විමර්ශනය සිදුකර ඇති බව වාර්තා වී තිබුණි.

(ඊ) ශ්‍රී ලංකා රේගුවේ මධ්‍යම අපහරණ අංශය විසින් සිදුකරන විකිණීමේ ක්‍රියාවලිය විධිමත් හා විනිවිදභාවයකින් තොරව ක්‍රියාත්මක වන බව ඉකුත් විගණන වාර්තා මගින් පෙන්වා දී තිබුණි. 2012 වර්ෂයේ මුල් අර්ධ වර්ෂයේ විකුණුම් කටයුතු පිළිබඳ සිදුකල නියැදි පරීක්ෂණවලදී තවදුරටත් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) නියමිත දිනට නිදහස් කර නොගත් භාණ්ඩ වර්ග 38ක් සඳහා වූ ගැණුම්කරුවන්ගේ රු.2,205,000 ක තැන්පතු මුදල් රාජසන්තක නොකිරීම.

(ii) ගැණුම්කරුවන් තුන් දෙනෙකුට අදාලව රාජසන්තක කළ යුතු තැන්පතු මුදල් භාවිතා කර රු.6,138,888 ක් වටිනා භාණ්ඩ විෂයයන් 06 ක් අයදුම් කිරීමට ඉඩ සලසා තිබිම.

(iii) ගැණුම්කරුවන් තුන් දෙනෙකුට ප්‍රමාණවත් හා වලංගු තැන්පතු මුදල් නොමැතිව රු.13,985,366 ක් වටිනා භාණ්ඩ විෂයයන් 06 ක් සඳහා මිල ගණන් ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දී තිබීම.

(iv) අවස්ථා 04 කදී මිල ගණන් ඉදිරිපත් කිරීමට පෙර තැන්පත් කළ යුතු රු.175,000 ක මුදල්, මිල ගණන් ඉදිරිපත් කිරීමෙන් පසු අවස්ථාවක තැන්පත් කිරීමට ඉඩ සලසා දී තිබීම.

(v) විකිණීම සඳහා ඉදිරිපත් කර තිබුණු භාණ්ඩ විෂයයන් 29ක් අවස්ථා 05 කදී විකිණීමේ ක්‍රියාවලියෙන් ඉවත් කර ගෙන තිබුණද, ඒ සඳහා ලබා ඇති විධිමත් අනුමැතියක් විගණනයට ඉදිරිපත් නොකිරීම.

(vi) ගැණුම්කරුවන් විසින් දින 10 ක් තුළ මුදල් ගෙවා භාණ්ඩ නිදහස් කරගත යුතු වුවද, අවස්ථා 21කදී ඒ සඳහා දින 26 - 88දක්වා වූ කාලයක් ලබාදී තිබීම.

(උ) 2012 වර්ෂයේ පළමු අර්ධ වර්ෂය තුල ආනයනකරුවන් විසින් ආනයනය කරන ලදුව වරාය භූමියේ අත්හරින ලද භාණ්ඩ ඇතුලත් බහාළුම් 16කින් බහාළුම් 4 ක් විනාශකර තිබුණු අතර එකක් නැවත අපනයනය කර තිබුණි. වෙන්දේසියේ විකුණන ලද බහාළුම් 11 ක ඇතුලත් භාණ්ඩවලින් ශ්‍රී ලංකා රේගුව වෙත ලැබිය යුතු ගාස්තුව රු.9,447,919 ක් වූ අතර මෙම විකිණීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම මගින් ආනයනික භාණ්ඩ විනාශ වීම වලක්වා ගැනිමේ විධිමත් ක්‍රියාකාරී වැඩපිළිවෙලක් ශ්‍රී ලංකා රේගුව සතුව නොපැවති බව පහත නිරීක්ෂණයන්ගෙන් පැහැදිලි වේ.

(i) විකිණීම් ක්‍රියාවලිය කඩිනම් නොකිරීම හා ශ්‍රී ලංකා රේගුවේ මිල තක්සේරුව සාධාරණ නොවීම හේතුවෙන් නාරං අඩංගු බහාළුමක් විනාශවීම නිසා රු.1,003,520 ක් රේගු ගාස්තු අහිමි විම.

(ii) සුදුළූණු කි.ග්‍රෑ. 84000 ක් අඩංගු බහාළුම් 03 කින් සියයට 30 ක් මනුෂ්‍ය ආහාරයට නුසුදුසු යැයි තීරණය කර රු.1,134,000 ක් වූ රේගු බදු අත්හැර තිබුණද, විකිණීමේ ක්‍රියාවලියේදී එසේ විනාශවී ඇති ළූණු තොගද ඇතුළුව ගැණුම්කරු වෙත සම්පූර්ණ ළූණු

තොගයම මුදා හැර ඇති හෙයින් විනාශ වූ තොගයද මහජනයා අතට පත්වීමට ඇති ඉඩ කඩ අහුරාලීමට ක්‍රියාමාර්ගයක් නොවීම.

(iii) ආනයනකරුවන් විසින් වරාය භූමිය තුල අත්හරින ලද බහාළුම්වල ඇතුලත් භාණ්ඩ විකිණීමේදී ආහාර හා ඖෂධ පාලකගේ නිර්දේශ අනුව ඒවායින් කොටසක් පරිභෝජනයට නුසුදුසු ලෙස සලකා රේගු ගාස්තු අය නොකිරීම හේතුවෙන් ආනයනකරුවන් වෙත චේතාන්විතව මෙසේ ආනයනික භාණ්ඩ අතහැර පසුව මිලදී ගැනීමට පෙළඹීමට ඉඩ ඇතැයි යන සැකය බැහැර කළ නොහැකි වීම. අවස්ථා 10 කදී මෙසේ අත්හැර ඇති රේගු බදු වටිනාකම රු.1,933,640 ක් විය.

(ඖ) රේගු වැරදිවලට අදාලව පවත්වන රේගු විමර්ශන කඩිනම් කිරීමට පියවර නොගැනීම නිසා රේගු වැරදි සිදුකරන පාර්ශවයන්ට ආර්ථිකමය වශයෙන් වාසි සහගත තත්ත්වයක් ඇති වී ඇති බවත් රජයට ලැබිය යුතු ආදායම් නිසි කලට නොලැබීමත් බොහෝ විමර්ශන කටයුතු පිළිබඳ සිදුකල නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය විය. උදාහරණ කීපයක් පහත දැක්වේ.

(i) ශ්‍රී ලංකා රේගුවේ ආයෝජන මණ්ඩල අධීක්ෂණ ඒකකය විසින් සිදුකර ඇති රේගු විමර්ශන පිළිබඳව සිදුකළ නියැදි විගණන පරීක්ෂණවේදී නිරීක්ෂණය වූයේ 2010 ජනවාරි මස ආරම්භකළ විමර්ශන 02 ක් වර්ෂ 03 කට වැඩි කාලයක් සාධාරණ හේතුවකින් තොරව ප්‍රමාද වීම නිසා රු.1,950,812 ක බදු ආදායමක් සම්බන්ධ අවසන් තීරණ ගත නොහැකි තත්ත්වයක් උදාවී ඇති බවයි. මෙම අංශය විසින් 2004 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා විමර්ශන 92 ක් ආරම්භ කර තිබුණු අතර නිමකර නොතිබුණු විමර්ශන සංඛ්‍යාව 42 කි. විමර්ශන 32ක් පිළිබඳ කිසිඳු තොරතුරක් අනාවරණය නොවූ අතර විමර්ශන 03 ක් පමණක් නිමකර තිබීම කළමනාකරණ අකාර්යක්ෂමතාවක් බව නිරීක්ෂණය කෙරේ.

(ii) ශ්‍රී ලංකා රේගුවේ "D" ශාඛාව විසින් පුද්ගලික සමාගම විසින් ආනයනය කර තිබුණු සුඛෝපභෝගී මෝටර්රථ දෙකක් සඳහා අඩු වටිනාකමක් ප්‍රකාශ කර බදු වංචාවන් සිදුකර ඇති බවට වාර්තා කරමින් ආරම්භ කර තිබුණු රේගු විමර්ශනය සඳහා වසර 04ක් ගතවී තිබුණද, විමර්ශන කටයුතු අවසන් කිරීමට රේගු නිලධාරීන් පියවර ගෙන නොතිබුණි. වාහන දෙකකට අදාල ලියවිලි පමණක් රඳවාගෙන වාහන දෙක නිදහස් කර තිබුණු අතර ප්‍රවාහන අමාත්‍යාංශය විසින් ලියාපදිංචි කිරීමකින් තොරව මෙම වාහන දෙක පරිහරණය කරන බව නිරීක්ෂණය විය. වාහනවල වටිනාකම අඩුවෙන් ප්‍රකාශ කිරීම මත අතිරේකව අයකර ගත යුතු බවට වාර්තා වී ඇති රු.3,643,636 ක මුදල වර්ෂ 04 ක් තිස්සේ අයකර නොගැනීම හේතුවෙන් අදාල සමාගමට වාසි සහගත තත්ත්වයක් ඇති වී තිබුණි. එසේම රජයට ලැබිය යුතු ආදායම් නිසිකලට නොලැබීමත්, නීත්‍යානුකූලව ලියාපදිංචි නොකළ වාහන රාජ්‍ය ආයතන විසින් පරිහරණය කිරීමත් රේගු විමර්ශන වල ප්‍රමාදයන් නිසා ඇති වූ අහිතකර තත්ත්වයන් බව විගණනයේදී නිරීක්ෂණය කෙරේ.

(එ) තැපැල් රේගු කාර්යාල මගින් ප්‍රමාණවත් ආදායමක් නොලැබෙන බවත් බොහෝ විට සම්ප්‍රදායක් ලෙස එම කාර්යාල තුළ තැපැල් භාණ්ඩ පරීක්ෂා කිරීම සඳහා යොදා ඇති අභ්‍යන්තර පාලන වැඩපිළිවෙලේ දූර්වලතා ගණනාවක් පවතින බවක් නිරීක්ෂණය විය. යාපනය තැපැල් රේගු කාර්යාලයට අදාල නියැදි පරීක්ෂාවන්හිදී සාමාන්‍යයෙන් දිනකට ලැබෙන පාර්සල් වලින් සියයට 62 ක ප්‍රමාණයක් භාවිතා කළ ඇඳුම් ලෙසත් සියයට 22 කට ආසන්න ප්‍රමාණයක් ආහාර ලෙසත් සටහන් කර ඇති අතර බොහොමයක් පාර්සල්

වටිනාකමක් නොමැති ලෙස දක්වා නිදහස් කර තිබුණි. ලැබෙන පාර්සල් වලින් සියයට 50 කට වැඩි ප්‍රමාණයක් රේගු ගාස්තු හා බදු නොමැතිව නිදහස් කරන අතර, එම පාර්සල් තුළ බදු අයවිය යුතු භාණ්ඩ පැවතියේද යන්න විගණනයේදී පරීක්ෂා කළ හැකි වන පරිදි සුදුසු අභ්‍යන්තර පාලන වැඩ පිළිවෙලක් ද යොදා නොතිබුණි.

(ඒ) ශ්‍රී ලංකා රේගුවේ ආදායම් ව්‍යුහය තුල නිෂ්පාදන බදු වල සාපේක්ෂ දායකත්වය සියයට 38 ක් පමණ වූ අතර 2012 වර්ෂය තුල උපයා ඇති නිෂ්පාදන බදු ආදායම රු. මිලියන 139,970 ක් විය. නිෂ්පාදන බදු එකතුකිරීම සඳහා ශ්‍රී ලංකා රේගුව විසින් යොදා ඇති අභ්‍යන්තර පාලන වැඩපිළිවෙල සතුටුදායක මට්ටමක නොවූ අතර නිරීක්ෂණය වූ දුර්වලතා කිහිපයක් පහත දැක්වේ.

(i) 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත 1993 වර්ෂය දක්වා සුරාබදු දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක කර 1994 මැයි මස සිට රේගු අධ්‍යක්ෂ ජනරාල් මගින් ක්‍රියාත්මක කිරීමට අංක අ.ම.ප./93/360/0601 දරන 1994 මාර්තු 17 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව පියවර ගෙන ඇතත්,එම තීරණය සම්පූර්ණයෙන් ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් නිෂ්පාදන බදු සම්බන්ධ නෛතික විධිවිධාන යථාවත් නොවී පැවතුණි.

(ii) ඉහත සඳහන් නෛතික විධිවිධාන යථාවත් නොවීම නිසා 2012 වර්ෂයේ හිඟ ආදායම් තුල ඇතුලත් ආනයනිත භාණ්ඩ සම්බන්ධ ආයතන 03 කට අදාල රු. මිලියන 6,100ක හිඟ නිෂ්පාදන බදු මුදල්ද, මත්පැන් නිෂ්පාදන ආයතන 04 කින් ලැබිය යුතු රු.මිලියන 173 ක නිෂ්පාදන බදු මුදල්ද, හිඟ ආදායම් වාර්තාවල ඇතුලත් නොවූ ආයතන 03 කට ආදාලව ලැබිය යුතු රු.මිලියන 286 ක බදු මුදල්ද තවත් ආයතන 228 කින් ලැබිය යුතු රු. මිලියන 46.6 ක හිඟ බදු හා දඩ මුදල්ද සම්බන්ධයෙන් පවරා ඇති නඩු සමථයකට පත්කර ගැනීමේ හෝ ඉල්ලා අස්කර ගැනීම හෝ ඉවතලීමේ අවධානමක් පවතින බව නිරීක්ෂණය විය.

(iii) නිෂ්පාදන බදු නිලධාරීන් 18 ක් සුරාබදු පරීක්ෂකවරුන් 08 ක් ඇතුළුව නිෂ්පාදන බදු අංශයේ සමස්ථ කාර්ය මණ්ඩලය 30 ක් වූ අතර මෙම සියළුම කාර්ය මණ්ඩල සඳහා දැනට ක්‍රියාත්මක නිෂ්පාදන බදු ලිපිගොනු සංඛ්‍යාව 27 ක් පමණක් විය. ඇතැම් ලිපිගොනු සම්බන්ධ රාජකාරිය වී ඇත්තේ බදු ගෙවන ආයතනවල කාර්තුමය වාර්තා ගොනු ගත කිරීම පමණක් බව නිරීක්ෂණය විය.

(iv) මෙම අංශයේ ක්ෂේත්‍ර රාජකාරිවල නිරත කාර්යමණ්ඩලය සඳහා ආයතන පරීක්ෂා කිරීමේ නිශ්චිත සැලසුම් නොවූ අතර බදු ලිපිගොනුව පවත්වාගෙන යන නිලධාරීන්ගේ අභිමතය පරිදි ක්ෂේත්‍ර රාජකාරිවල නිරත වන බවත්, කිසිඳු අධීක්ෂණයකට ලක් නොකළ ආයතන පැවති බවත් දීර්ඝ කාලයක් තිස්සේ එක් නිලධාරියෙක් විසින් එකම ලිපිගොනුවක කටයුතු කරන බවත් මෙම අංශය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(v) නිෂ්පාදන බදු අංශය විසින් බදු අයකර ගත යුතු නව ආයතන හඳුනාගැනීම සඳහා කිසිඳු වැඩපිළිවෙලක් යොදා නොතිබුණු අතර 2012 වර්ෂයේ තුලදී කිසිඳු ආයතනයක් අළුතින් ලියාපදිංචි කර නොතිබුණි.

(vi) එතෙරදී වාහන කොටස්වලට කඩා ආනයනය කරන ලදුව දේශීයව එම කොටස් එකලස්කර වාහන නිපදවන ආයතනයන් හේතුවෙන් රජයට අහිමිවූ බදු ආදායම ගණනය කිරීම සඳහාත් උචිත ක්‍රමවේදයක් සැකසීමට 2011 මැයි 11 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නියම කර තිබුණද, ඒ සඳහා පියවර ගෙන ඇති බවක් නිරීක්ෂණය නොවීය. මෙම ආයතනය විසින් නිපදවා තිබුණු වාහන 103 කට අදාලව නිෂ්පාදන බදු මුදල්ද ගෙවා නොතිබුණු බව නිරීක්ෂණය විය.

**12.14 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2012 දෙසැම්බර් 31දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (අ) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 338 | 318 | 20 |
| (ආ) | තෘතියක මට්ටම | 1151 | 817 | 334 |
| (ඇ) | ද්විතියක මට්ටම | 968 | 718 | 250 |
| (ඈ) | ප්‍රාථමික මට්ටම | 488 | 270 | 218 |
| | එකතුව | 2945 | 2123 | 822 |

බඳවා ගැනීම්වලට අදාල නිලධාරීන්ගේ සහතිකවල නිරවද්‍යතාවය ශ්‍රී ලංකා රේගුව විසින් අදාල ආයතන මගින් තහවුරු කරවා ගෙන නොතිබුණි.

## 13. ශීර්ෂය 248- සුරාබදු දෙපාර්තමේන්තුව

### 13.1 විගණන විෂය පථය

සුරාබදු දෙපාර්තමේන්තුවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1)ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන යටතේ විගණනය කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත 2014 පෙබරවාරි 21 දින නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසැඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුලත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 13.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්ගේ වගකිම

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් සැසැඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාත්‍රාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම,පිළියෙල කිරීම සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරිම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම,ක්‍රියාක්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුලත් වේ.

### 13.3 විගණන නිරීක්ෂණය

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව සුරාබදු දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම් හා රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ඊ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 13.4 සිට 13.8 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

#### (අ) ලේඛන හා තොරතුරු ඉදිරිපත් නොකිරීම

(i) සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් හතකට (07) 2013 ජූනි 30 වන විටත් පිළිතුරු දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කර නොතිබුණි.

(ii) පහත දැක්වෙන ලිපිලේඛන විගණනයට ඉදිරිපත් නොකෙරුණි.මේ නිසා අංක 07/079/0269 දරන සුරා බලපත්‍රය 1985 වර්ෂයේ සිට 1988 වර්ෂය දක්වා

කාලපරිච්ඡේදය ඇතුළත නීත්‍යානුකූලව අයිතිය හුවමාරුවක් සිදු වී තිබේදැයි විගණනයේදී තහවුරු කර ගත නොහැකි විය.

i. අයිතිය හුවමාරුවීම නීත්‍යානුකූලව සිදු වූ බවට තහවුරු කිරීමට අදාල සාක්ෂිමය ලිපි ලේඛණ.

ii. යථෝක්ත බලපත්‍රයට අදාල 2002 වර්ෂයට පෙර පවත්වාගෙන යනු ලැබූ ලිපිගොනුව.

iii. ව්‍යාපාර ලියාපදිංචිය වෙනස් කිරීමට අදාල ලියකියවිලි සහ ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකය.

**(ආ) අයවැය විචලනය**

**ඇස්තමේන්තු සකස් කිරීමේ අඩුපාඩු**

මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව වාර්ෂික අයවැය ඇස්තමේන්තු සකස් කිරීමේදී දෙපාර්තමේන්තු අවශ්‍යතාවයන් හඳුනාගෙන නිශ්චිත සැලසුමක් යටතේ ඇස්තමේන්තු සැකසිය යුතු වුවත්,2012 වර්ෂයට අදාලව සුරාබදු දෙපාර්තමේන්තුවේ වාර්ෂික අයවැය ඇස්තමේන්තු සකස් කිරීමේදී පහත දැක්වෙන දුර්වලතා නිරීක්ෂණය විය.

(i) ප්‍රමාණවත් පරිදි ඇස්තමේන්තු සකස් නොකිරීම හේතුවෙන් අංක 1402 වැය විෂය සඳහා සියයට 156 ක පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදන ලබාගෙන තිබුණි.

(ii) වැය විෂය අංක 1102 වෙනුවෙන් වෙන් කර ඇති සම්පූර්ණ මුදලම මුදල් රෙගුලාසි 66 මඟින් මාරු කර තිබුණි.

**(ඇ) ඉන්ධන හා විදුලිය වියදම් කළමනාකරණය**

ඉන්ධන හා විදුලි වියදම් සම්බන්ධයෙන්වූ 2012 පෙබරවාරි 16 දිනැති අංක 156 දරන භාණ්ඩාගාර චක්‍රලේඛ උපදෙස් නොතකා එම වැය විෂයයන් සඳහා මුදල් රෙගුලාසි 66 මඟින් රු.4,790,000 ක් ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂයේදී මාරු කර තිබුණි.

**(ඈ) පොදු තැන්පත් ගිණුම**

වර්ෂ දෙකක් ඉක්ම වූ රු.2,810,120 ක් වූ ශේෂය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**(ඉ) ආදායම් ගිණුම්**

(i) ආදායම් සංකේතාංක -10.02.04.01

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

i. සුරාබදු ආඥා පනත හා ඊට අදාල සංශෝධනයන්වලට අනුව සුරාබදු ආදායම යන්නෙන් බද්දක්, ගාස්තුවක් හෝ දඩ වශයෙන් අයකර ගන්නා හෝ අයකර ගත හැකි (අධිකරණයකින් පනවන දඩ හැර) මෙම ආඥා පනත යටතේ හෝ මත්පැනට හෝ අදාල වෙනත් පවතින නීතියක් යටතේ හෝ රාජසන්තක කිරීමකින් නියමයකින් අයකර ගන්නා ආදායම වේ. එසේ වුවද, සුරාබදු දෙපාර්තමේන්තුව විසින් සුරාබදු ආදායම ලෙස මත්පැන් බදු ආදායම පමණක් හඳුනාගෙන වාර්ෂික ආදායම් ඇස්තමේන්තු සකස් කිරීම හා ගිණුම්ගත කිරීම් සිදුකර තිබුණි.

ii. සුරාබදු ආදායම සඳහා 2012 මූලික ඇස්තමේන්තුව මඟින් රු. මිලියන 65,200 ක් ඇස්තමේන්තු කර තිබුණි. නමුත් තථ්‍ය ආදායම රු. මිලියන 60,047 ක් වූ අතර,මේ අනුව දෙපාර්තමේන්තුව අපේක්ෂිත මූලික ඇස්තමේන්තගත ආදායම කරා ගමන් කිරීමට අපොහොසත් වී තිබුණි. මූලික ඇස්තමේන්තගත ආදායම හා තථ්‍ය ආදායම අතර,වෙනස රු. මිලියන 4,229 ක් වූ අතර, එය ප්‍රතිශතයක් ලෙස සියයට 6.49 කි. සුරාබදු ආඥා පනතට අනුව හිඟ ආදායම් වාර්තා ඉදිරිපත් කිරීමේදී හිඟ මත්පැන් බදු මුදලට අමතරව මත්පැන් බදු මුදල් ප්‍රමාදවීම් මත අයකර ගත යුතු හිඟ ප්‍රමාද ගාස්තුද ඇතුළත්ව සකස් කළ යුතු වුවද, ඒ අනුව හිඟ ආදායම් වාර්තා දෙපාර්තමේන්තුව විසින් සකස් කර නොතිබුණි.

iii. එක් ආයතනයකින් 2012 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.9,742,102 ක මුදල හිඟ ආදායම් වාර්තාවට ඇතුලත් කර නොතිබුණි.

iv. ඉදිරිපත් කළ ගිණුම්වලට අනුව එකතුව රු.1,683,970,524 ක් වූ ආදායම් හිඟ හිට තිබුණු අතර, ඒ හිඟ හිටි ආදායම් වර්ෂ 4 සිට වර්ෂ 15 අතර කාල පරාසයට අදාල ආයතන 5කින් හිඟ සුරාබදු ලෙස අයවිය යුතු මුදලකි. එම හිඟ හිටි ආදායම අයකර ගැනීම දුර්වල මට්ටමක පැවතුණි.

(ii) ආදායම් සංකේතාංක - 10.02.06.00

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

i 2012 වර්ෂයේදී දුම්කොල බද්ද මූලික ඇස්තමේන්තුව ඉක්මවා සියයට 36කින් වැඩි වී තිබුණද, ඇස්තමේන්තු සංශෝධනයක් කිරීමට කටයුතු කර නොතිබුණි.

ii මු. රෙ. 128 (2) (ඇ) පරිදි, තමා වගකීමට බැඳී සිටින විවිධ ආදායම් ශීර්ෂ,උප ශීර්ෂ විෂයයන් හා උප විෂයයන් යටතේ එක් එක් මුදල් වර්ෂයේ ජූනි 30වැනි දිනට හා දෙසැම්බර් 31 වැනි දිනට හිඟ ආදායම් පිළිබඳ තත්ත්වය පෙන්නුම් කෙරෙන අර්ධ වාර්ෂික වාර්තා පිළියෙල කොට විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතුය. හිඟ මුදල් නොමැති නම් 'හිස්' වාර්තාවක් ඉදිරිපත් කල යුතු වුවත්, එසේ කිරීමට කටයුතු කර නොතිබුණි.

**(ඊ) රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(i) විෂය අංක 24801 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2012 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟ හිට තිබුණු ශේෂවල එකතුව රු.2,001,384 ක් වූ අතර,එම හිඟ හිටි ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ii) 2012 ජනවාරි 01 දින ණය සහ අත්තිකාරම් ලේඛණයේ සටහන් කිරීමේදී 2011 දෙසැම්ර් 31 දිනට වූ ණය ශේෂයන් සමඟ සසඳා සටහන් නොකිරීම හේතුවෙන් නිලධාරීන් 49 දෙනෙකුගේ ණය ශේෂයන්හි වෙනස්කම් නිරීක්ෂණය විය.

(iii) 2012 වර්ෂයේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් ආරම්භක ශේෂයන්හි වෙනස්කම් 2012 සැප්තැම්බර් මාසයේදී නිවැරදි කර තිබුණි. නමුත් එම නිවැරදි කිරීම් සිදුකිරීමට නිවැරදි ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබූ අතර,ඒ සඳහා විධිමත් අනුමැතියක්ද විගණනයට ඉදිරිපත් නොවිය. ඒ හේතුවෙන් එම නිවැරදි කිරීම් සම්බන්ධයෙන් විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි විය.

## 13.4 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය

### 13.4.1 සංයුක්ත සැලැස්ම

2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැලැස්මක් දෙපාර්තමේන්තුව විසින් වර්ෂය ආරම්භයේදී පිළියෙල කළ යුතු වුවත්, එම සැලැස්ම 2013 ජූනි 30 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

### 13.4.2වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

ඉහත 13.4.1සඳහන් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය ප්‍රකාරව පිළියෙල කරන ලද සංයුක්ත සැලැස්මට අනුකූලව 2010 සහ ඉන් ඉදිරියට දෙපාර්තමේන්තුව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ඉහත සඳහන් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපියට අනුකූල නොවූ ක්‍රියාකාරී සැලැස්මක් වර්ෂය ආරම්භයේ පිළියෙල කර තිබුණි.

### 13.4.3 වාර්ෂික කාර්යසාධන වාර්තා

ඉහත 13.4.1 සඳහන් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියේ සඳහන් 2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 හා 2004 පෙබරවාරි 20 දිනැති අංක 402(1) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාර දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කළ යුතු වාර්ෂික කාර්යසාධන වාර්තාව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත විගණකාධිපතිට පිටපතක් සහිතව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය සඳහා කාර්ය සාධන වාර්තාව එසේ සභාගත කර නොතිබුණි.

## 13.5 වත්කම් කළමනාකරණය

### (අ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම

2010 දෙසැම්බර් 17 දිනැති අංක පීඑෆ්/සමීක්ෂණ මණ්ඩල/01 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය මඟින් සංශෝධිත 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාර 2012 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදු කර එම වාර්තා 2013 මාර්තු 31 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් එසේ සිදු කර නොතිබුණි. අවසාන වරට භාණ්ඩ සමීක්ෂණය පවත්වා තිබුණේ 2011 වර්ෂය වෙනුවෙනි.

### (ආ) ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ කාර්යයන්

පහත සඳහන් අවස්ථා නිරීක්ෂණය විය.

(i) දෙපාර්තමේන්තුව දුම්කොළ බදු පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ කාර්යභාරය ප්‍රමාණවත් ලෙස ඉටු නොකල අවස්ථා පහත දැක්වේ.

i. පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද 1999 අංක 8 දරන දුම්කොළ බදු පනත වෙනුවෙන් වසර 10ක් ගතවන තෙක් එනම් 2009 ජූලි වන තෙක් සුරාබදු නිවේදනයක් සකස් කර ගැසට් පත්‍රයේපලකර බලාත්මක කිරීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි. එසේම පනතේ තවත් වැදගත්නියමයන් මෙතෙක් ක්‍රියාත්මක කිරීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

ii. 2009 ඔක්තෝබර් 26 දිනැති ගැසට් පත්‍රයේ පල කරන ලද 2009 අංක 01 දරන දුම්කොළ බදු නියෝගයෙහි 5 වැනි කරුණට අනුව,ලියාපදිංචි සහතිකයක් ලබා ගැනීම සඳහා වූ සෑම ඉල්ලුම් පත්‍රයක්ම ලැබී දින 30 ක් ඇතුලත ලියාපදිංචිය ප්‍රදානය කළ යුතු හෝ ප්‍රතික්ෂේප කළ යුතු වුවත්,ඊට පටහැනිව ඉල්ලුම්පත්‍රය ලැබී වසරකට වැඩි කාලයක් ගතවීමෙන් පසු ලියාපදිංචි සහතිකය නිකුත් කර තිබූ අවස්ථා පහක් විගණනයේදී නිරීක්ෂණය විය. දෙපාර්තමේන්තුව විසින් මෙම ලියාපදිංචි සහතික ප්‍රදානය ප්‍රමාදයට හේතු සොයා බලා මෙවන් ප්‍රමාදයක් වළක්වා ලීමට කටයුතු කර නොතිබුණි.

iii. බලපත්‍රයේ වලංගු කාලය අවසන් වීමෙන් පසු බොහෝ නිෂ්පාදකයන් නැවත ලියාපදිංචිය අලුත් කිරීමට කටයුතු නොකළ අවස්ථා පැවතුණි. එවැනි අවස්ථාවලදී එකී නිෂ්පාදිත ආයතන විසින් බලාත්මක බලපත්‍රයක් රහිතව තවදුරටත් තම නිෂ්පාදිතයන් සිදුකිරීමට බොහෝ දුරට ඉඩකඩ ඇති බැවින්, ඒ පිළිබඳව දෙපාර්තමේන්තුව විසින් එකී ආයතන පරීක්ෂාවට ලක් කිරීමක් හෝ සිදු කර නොතිබුණි. එවැනි ලියාපදිංචි අලුත් කිරීමට කටයුතු නොකළ ආයතන අටක් විගණන නියැදි පරීක්ෂණයේදී අනාවරණය විය.

iv. 1999 අංක 8 දරන දුම්කොළ බදු පනතේ 17 වගන්තියට අනුව, මෙම පනත යටතේ කරනු ලැබූ රාජසන්තක කිරීම් සහ දණ්ඩනවලින් අයකර ගනු ලැබූ මුදල්වලින්3/4 ක් භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයාට ගෙවිය යුතු අතර, ඔහු විසින් ඒ මුදල් ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලැබේ.ඉතිරි මුදල අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන යෝජනා ක්‍රමයක් අනුව මේ පනත බලාත්මක කිරීමට සහාය වන සුරාබදු නිලධාරීන්, රේගු නිලධාරීන්, පොලිස් නිලධරයන්, ඔත්තු සපයන්නන් සහ වෙනත් අය අතර බෙදාදීම සඳහා, මේපනත යටතේ පිහිටුවනු ලබන සහ සුරාබදු කොමසාරිස් ජනරාල්වරයාගේ පාලනය යටතේ පවත්නා තැගි අරමුදලකට බැර කරනු ලැබිය යුතු වුවත්, මෙම පනත යටතේ තැගි අරමුදලක් 2012 වර්ෂය වන විටත් පිහිටුවා නොතිබුණි.

v. 1999 අංක 8 දරන දුම්කොළ බදු පනතේ 21 වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ නියෝග යටතේ අංක 1610/28 හා 2009 ජූලි 17 දින ගැසට් පත්‍රයේ හා ඊට අදාල සංශෝධන යටතේ පල කරනු ලැබූ නියෝග අංක 1625/1 යටතේ සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද ලියාපදිංචි කිරීමේ සහතිකයක් ලබා නොගෙන කිසිම තැනැත්තෙකු විසින් සිගරැට්,සුරුට්ටු,බීඩි, හෝ පයිප්ප දුම්කොළ සඳහා වූ අමුද්‍රව්‍ය හෝ නිමි භාණ්ඩ නිෂ්පාදනය කිරීම, ගබඩා කිරීම, ආනයන කිරීම හෝ අපනයනය කිරීම නොකළයුතුබවට සඳහන් කර තිබුණි. එසේ වුවද, සිගරැට් නිෂ්පාදන සමාගමක්විසින් ලියාපදිංචි කිරීමේ සහතිකයක් නොමැතිව ගබඩාවක් පවත්වාගෙන ගොස් තිබුණි.

(ii) විනය විරෝධී ක්‍රියා සිදුකරන නිලධාරීන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ ප්‍රකාරව විනය ක්‍රියාමාර්ග ගැනීමේ දිගුකාලීන ප්‍රමාදයක් නිරීක්ෂණය විය.

## 13.6 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු

-----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) බැංකු ගිණුමට ඍජුව ලැබෙන මුදල් හඳුනාගෙන අදාල ආදායම් සංකේතවලට ගිණුම්ගත කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් 2012 දෙසැම්බර් 31 වන විට රු.43,234,868 ක ශේෂයක් හඳුනා නොගත් තැන්පතු ලෙස නිරීක්ෂණය විය.

(ආ) 2012 දෙසැම්බර් 31 දින දක්වා පැවති රු.3,502,874 ක මුදලක් අදාල ආදායම් සංකේත හඳුනාගත නොහැකිවීම හේතුවෙන් රජයේ ආදායමට බැර කර තිබුණි. බැංකුවට ඍජුව ලැබෙන මුදල් හඳුනාගත හැකිවන පරිදි ප්‍රමාණවත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි.

## 13.7 කළමනාකරණ දුර්වලතා

---------------------------

2003 සැප්තැම්බර් 22 දින දරන අංක 859 දරන සුරාබදු නිවේදනයේ හා 2003 ඔක්තෝබර් 10 දින දරන අංක 1309/19 දරන සංශෝධිත නිවේදනයේ 1 වන උපලේඛණයේ 10 වන ඡේදයේ සඳහන් පරිදි නව අයදුම්කරුවෙකුට බලපත්‍රය මාරු කිරීම වෙනුවෙන් එක් බලපත්‍රයක් සඳහා රු.150,000

ක අමතර මුදලක් රජයට ගෙවිය යුතු වුවත්, ර. බී. 04 සුරාබදු බලපත්‍ර 15 ක් එලෙස මාරු කිරීම වෙනුවෙන් වූ රු.2,250,000 ක මුදලක් ගෙවා නොතිබුණි.

## 13.8 මානව සම්පත් කළමනාකරණය

### (අ) අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා

2012 දෙසැම්බර් 31දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| (i) ජ්‍යෙෂ්ඨ මට්ටම | 57 | 38 | 19 |
| (ii) තෘතියික මට්ටම | 380 | 284 | 96 |
| (iii) ද්විතියික මට්ටම | 855 | 592 | 263 |
| (iv) ප්‍රාථමික මට්ටම | 129 | 124 | 05 |
| | 1421 | 1038 | 383 |

(ආ) පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

2012 දෙසැම්බර් 31 දින වන විට පුරප්පාඩු 383ක් පැවති අතර ඒ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) සුරාබදු කොමසාරිස්වරුන් දෙදෙනෙකු සහ සුරාබදු අධිකාරීන් 16 ක් සහිත ජ්‍යෙෂ්ඨ මට්ටමේ සුරාබදු නිලධාරීන් 19 දෙනෙකුගේ පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

(ii) සමස්ථ කාර්ය මණ්ඩලයෙහි නිලධාරීන් 283 ක පුරප්පාඩු පවතින අතර එම පුරප්පාඩු සම්පූර්ණ කර දෙපාර්තමේන්තුවෙහි ඉලක්ක සපුරාගැනීම සඳහා දෙපාර්තමේන්තුව ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

## 14. ශීර්ෂය - 249 භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව

### 14.1 විගණන විෂය පථය

භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා ආදායම් ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 අප්‍රේල් 28 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුලත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 14.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මුල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුලත් වේ.

### 14.3 විගණන නිරීක්ෂණය

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 14.4 සහ 14.5 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) අයවැය විචලනය**

වැය විෂයයන් 03 ක් සඳහා ප්‍රතිපාදිත රු.1,200,000,000 ක මුළු මූලධන ප්‍රතිපාදනයම මුදල් රෙගුලාසි 66 මගින් වෙනත් මූලධන වැය විෂයයන් 03 ක් සඳහා මාරු කර තිබුණි.

**(ආ) ආදායම් ගිණුම්**

2012 දෙසැම්බර් 31 දිනට පහත දැක්වෙන පරිදි රු.7,205,394,066 ක මුදලක් වසර ගණනාවක සිට හිඟව පැවතුණි.

| ආදායම් සංකේතය | කාල විශ්ලේෂණය | | | 2012 දෙසැම්බර් 31 දිනට හිඟහිටි ආදායම |
|---|---|---|---|---|
| | වර්ෂ 1ට අඩු | වර්ෂ 1ට වැඩි 3ට අඩු | වර්ෂ 3 ට වැඩි | |
| | රු. | රු. | රු. | රු. |
| 20.02.01.01 | 44,702,086 | 35,498,682 | 334,303,489 | 382,908,172 |
| 20.02.02.01 | 1,842,565,787 | 1,526,104,246 | 1,388,698,592 | 3,364,458,223 |
| 20.02.02.99 | 47,805 | 24,382 | 0 | 72,187 |
| 20.03.02.99 | 951,263 | 3,580,884 | 4,153,640 | 4,392,242 |
| 20.03.99.00 | 13,000 | 4,699,150 | 393,368 | 13,000 |
| 20.06.04.00 | 1,200,747,816 | 1,065,526,757 | 1,287,275,669 | 3,453,550,242 |
| එකතුව | 3,089,027,757 | 2,635,434,101 | 3,014,824,758 | 7,205,394,066 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i)** පොලිය ණය දීම්, විකුණුම් හා ගාස්තු - දඩ මුදල් හා රාජසන්තක කිරීම්, විකුණුම් හා ගාස්තු පරිපාලනාත්මක ගාස්තු, අනෙකුත් කල් බදු කුලී යන ආදායම් ශීර්ෂ 04 කට අදාල මූලික ආදායම් ඇස්තමේන්තු සංශෝධනය කිරීමේදී අංක 01/2002 හා 2002 ජූලි 17 දිනැති චක්‍රලේඛයේ 3 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුල්‍ය අධ්‍යක්ෂ ජනරාල් වෙත වාර්තා කර නොතිබුණි.

(ii) විකුණුම් හා ගාස්තු - අනෙකුත් ලැබීම් - ආදායම් කේත අංක 20.03.99.00

රාජ්‍ය මුල්‍ය ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු චක්‍රලේඛ 01/2002 ප්‍රකාර මූලික ආදායම් ඇස්තමේන්තු සංශෝධනය කළ යුත්තේ සමාලෝචිත වර්ෂයේ එතෙක් ලැබී තිබුණු සත්‍ය ආදායම හා ලැබීමට තිබෙන ආදායම පිලිබඳව අධ්‍යයනය කිරීමෙන් පසුව වුවද 2012 වර්ෂයේ රු.6,000,000,000 ක් වූ මූලික ආදායම් ඇස්තමේන්තු රු.9,042,000,000 ලෙස සංශෝධනය කිරීමේදී ඒ අනුව ක්‍රියාකර නොතිබුණි.

(ඇ) රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු පහත දැක්වෙන අත්තිකාරම් ගිණුම් සීමා පිළිපැද තිබුණි.

| | වියදම | ලැබීම් | හර ශේෂය |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| අනුමත සීමාව | 5,500,000 | 2,800,000 | 30,000,000 |
| තථ්‍ය ශේෂය | 3,352,868 | 3,204,052 | 17,874,645 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) හිඟ ණය ශේෂ

2012 දෙසැම්බර් 31 දිනට මියගිය හෝ විශ්‍රාමලත් නිලධාරින්ගෙන් අයවිය යුතු වර්ෂ එකකට අඩු වලනය නොවන රු.104,148 ක හිඟ ණය ශේෂයක් පැවතුණි.

(ii) වෙනත් නිරීක්ෂණ

අංක 118 හා 2004 ඔක්තෝබර් 11 දිනැති ජාතික අයවැය චක්‍රලේඛයෙහි විධිවිධානවලට පටහැනිව ස්ථාන මාරු වී ගිය නිලධාරින් 5 දෙනෙකුට අදාල රු.1,099,173 ක් වූ ණය ශේෂ අයකර ගැනීම 2012 දෙසැම්බර් 31 දින වන විට මාස 04 සිට 11 ක් දක්වා ප්‍රමාද වී තිබුණි.

## 14.4 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය

### 14.4.1 සංයුක්ත සැලැස්ම

2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5 (4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03ක් සඳහා සංයුක්තසැලැස්ම දෙපාර්තමේන්තුව විසින් වර්ෂය ආරම්භයේදී පිළියෙල කළ යුතු වුවත්,එම සැලසුම 2012 දෙසැම්බර් 31 දින වන විටද සංයුක්ත සැලැස්මක් පිළියෙළ කර නොතිබුණි.

### 14.4.2 වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම

ඉහත 14.4.1 හි සඳහන් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරි සැලැස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටද පිළියෙල කර නොතිබුණි.

**14.5 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2012 දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාව තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (අ) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 20 | 16 | 04 |
| (ආ) | තෘතියික මට්ටම | 01 | 01 | - |
| (ඇ) | ද්විතීක මට්ටම | 82 | 60 | 22 |
| (ඈ) | ප්‍රාථමික මට්ටම | 18 | 18 | - |
| | එකතුව | 121 | 95 | 26 |

2012 දෙසැම්බර් 31 දිනට ජ්‍යෙෂ්ඨ මට්ටමේ අනුමත තනතුරු 04 ක් හා ද්විතීක මට්ටමේ අනුමත තනතුරු 22 ක් පිරවීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

## 15. ශීර්ෂය 250 - රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

### 15.1 විගණන විෂය පථය

රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 නොවැම්බර් 28 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුලත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 15.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයක් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුලත් වේ.

### 15.3 විගණන නිරීක්ෂණය

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 15.4 සිට 15.6 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණිත සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

#### (අ) ප්‍රතිපාදන ඌන උපයෝජනය

වැය විෂයයන් 02 ක් යටතේ ප්‍රතිපාදනය කර තිබුණු එකතුව රු.1,115,038 ක් වූ පුනරාවර්තන ප්‍රතිපාදනද එක් වැය විෂයයක් යටතේ ප්‍රතිපාදනය කර තිබූ රු.4,000,000 ක් වූ මූලධන ප්‍රතිපාදන ද ඉතිරි වී තිබුණි.

**(ආ) රජයේ නිලධාරිට අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 25001 දරන රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ 2012 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟ හිට තිබුණු ශේෂය රු.164,953 ක් වු අතර එම හිඟ හිටි ශේෂය අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

**(ඇ) විවිධ අත්තිකාරම් ගිණුම**

(i) **වී මිලදී ගැනීම් සඳහා ලබාදී තිබුණු අත්තිකාරම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

i. වී මිලදී ගැනීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාල 14 ක් අමාත්‍යාංශයක් හා දෙපාර්තමේන්තුවක් වෙත 2001 වර්ෂයේ සිට 2008 වර්ෂය දක්වා අවස්ථා 18 කදී ලබාදී තිබුණු අත්තිකාරම් මුදලින් 2012 දෙසැම්බර් 31 දින වන විට නොපිය වූ අත්තිකාරම් ශේෂය පහත දැක්වෙන පරිදි රු.481,376,824 ක් විය.
2002 වර්ෂයේදී දිස්ත්‍රික් ලේකම් කාර්යාල 13 ක් හා අමාත්‍යාංශයක් වෙත ලබාදී තිබුණු 2012 දෙසැම්බර් 31 දින වන විටත් පියවා නොතිබුණු වසර 10 කට වැඩි කාලයක සිට හිඟ හිටි රු.466,235,683 ක් වූ අත්තිකාරම් ශේෂයද, 2006 වර්ෂයේදී ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට ලබාදී තිබුණු වර්ෂ 06 කට අධික කාලයක් ගතවී තිබුණු රු.12,560,031 ක අත්තිකාරම් ශේෂය හා අම්පාර, මඩකලපුව හා ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික් ලේකම් කාර්යාල තුන වෙත ලබා දී තිබූ 2008 වර්ෂයේ සිට වර්ෂ 4 කට අධික කාලයක සිට පැවත එන රු.2,581,110 ක ශේෂ වශයෙන් එකතුව රු.481,376,824 ක හිඟ හිටි අත්තිකාරම් ශේෂ 2012 දෙසැම්බර් 31 දින වන විටත් පියවා නොතිබුණි.

ii. 2013 ජනවාරි මාසයේදී රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් එකතුව රු.234,693,030 ක් වූ අත්තිකාරම් ශේෂ සනාථ කර ගැනීම සඳහා අත්තිකාරම් ලබා දී තිබුණු ආයතනවලට ලිපි යවා තිබුණද පහත සඳහන් ආයතන විසින් මෙම වාර්තාවේ දින වන විටත් ශේෂ සනාථ කර නොතිබුණි.

| ගිණුම් අංකය | කාර්යාලය | 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|
| | | රු. |
| 25003/418 | පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 199,759,798 |
| 25003/423 | කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 5,349,072 |
| 25003/425 | හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 19,320,629 |
| 25003/439 | මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 627,225 |
| 25003/501 | මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 681,800 |
| 25003/455 | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව | 12,560,031 |
| 25003/431 | මහවැලි අමාත්‍යාංශය | (3,605,525) |
| | | 234,693,030 |

iii. පහත සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාල 03 කින් අයවිය යුතු එකතුව රු.2,886,535 ක අත්තිකාරම් මුදල මුදල් රෙගුලාසි 113 ප්‍රකාර ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිපාදන ලබා ගෙන පියවීම සිදු කළ යුතු බවට රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවෙන් උපදෙස් ලබා දී තිබුණත්, අදාළ දිස්ත්‍රික් ලේකම්වරු 2012 දෙසැම්බර් 31 දින වන විටත් එසේ කර නොතිබුණි.

| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු. |
| අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 1,809,310 |
| මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 627,225 |
| මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 450,000 |
| | 2,886,535 |

iv. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට, හිරියාල ගොවි සමාගමට හා ලෝක ආහාර වැඩසටහනට සහල් මිලදී ගැනීම වෙනුවෙන් කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ලබාදී තිබූ රු.5,439,019 ක අත්තිකාරම් මුදලින් රු.349,487 ක් මහා භාණ්ඩාගරය වෙත සෘජුවම පියවා ඇති බවට කුරුණෑගල දිස්ත්‍රික් ලේකම්ගේ අංක 1/5/5/12 හා 2012 මාර්තු 29 දිනැති ලිපියෙන් රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල් වෙත දන්වා තිබුණද 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය සසඳා නිරවුල් කර ගෙන නොතිබුණි.

v. අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ලබාදී තිබුණු අත්තිකාරම් වලින් 2012 දෙසැම්බර් 31 දින වන විට කාගම බැංකු සමිතියට ලබාදී තිබුණු රු.1,009,449 ක මුදල සහ සී/ස නොච්චියාගම විවිධ සේවා සමූපකාර සමිතියට ලබාදී තිබුණු රු.5,023,818 ක මුදල එම බැංකුව හා සමිතිය ඈවර කිරීමෙන් පසුව පියවන බව අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් විසින් රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල් වෙත දන්වා තිබුණද එසේ කටයුතු කර නොතිබුණි.සරුකෙත ගොවි සමාගමෙන් අයවිය යුතු රු.480,000 ක මුදල හා උතුරු මැද පළාත් සමුපකාර සංගමයෙන් අය විය යුතු රු.4,264,300 ක මුදල අයකර ගැනීම සඳහා නීතිමය කටයුතු ආරම්භ කර තිබුණි.

vi. විවිධ අත්තිකාරම් කාර්යය යටතේ මහවැලි අමාත්‍යාංශයට බැරවී ඇති රු.3,605,525 ක ශේෂය නිරවුල් කර නොතිබුණි.

vii. ත්‍රිකුණාමල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ස.තො.ස ආයතනයෙන් අයවිය යුතුරු.1,652,916 ක මුදල කපා හැරීමට කටයුතු කිරීමට රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් 2012 ජූනි 05 දිනැති අංක එස්ජ්/ගිණුම්/4/7000/422 දරන ලිපියෙන් ත්‍රිකුණාමලයේ දිස්ත්‍රික් ලේකම් වෙත දන්වා යවා ඇතත් මේ වන තෙක් ඒ සම්බන්ධයෙන්

ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබා දී තිබුණු අත්තිකාරම් මුදලින් වී මිලදී ගත් විවිධ සේවා සමූපකාර සමිති විසින් මිලදී ගත් වී සහල් බවට පත් කර රජයේ අනුමත මිලට වඩා අඩුවෙන් විකිණීම නිසා ඇති වී තිබුණු පාඩුව රු.8,757,384 කි. මෙම පාඩුව අදාල පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට හෝ ගිණුම් වලින් කපා හැරීමට කටයුතු කර නොතිබුණි.

viii. 2012 දෙසැම්බර් 31 දිනට රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ බැර ශේෂයක් ලෙස සදොස් ලෙස රු.6,261,658 ක් ගිණුම් ගතව තිබුණි. එම මුදල රත්නපුර දිස්ත්‍රික් ලේකම්ගේ ගිණුමට හර කර අදාල නියමිත ගිණුමට බැර කිරිම රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් කළ යුතු බවට 2009 නොවැම්බර් 27 දින රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පැවති වී මිලදී ගැනීමේ ප්‍රගති සමාලෝචන රැස්වීමේදී එකග වී තිබුණත් මෙම වාර්තාවේ දින වන විටත් එම වරද නිවැරදි කිරීමට අපොහොසත් වී තිබුණි.

(ii) නැති වු මුදල්, මුද්දර හා ටිකට්පත් ආදිය සඳහා අත්තිකාරම් ලබාදීම

i. මුදල් රෙගුලාසි 106 ප්‍රකාර ඉහත සඳහන් කරුණු වෙනුවෙන් පහත සඳහන් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා කාර්යාල වෙත රු.10,096,624 ක අත්තිකාරම් ලබාදී තිබුණි. එසේ ලබා දුන් අත්තිකාරම්වලින් 2012දෙසැම්බර් 31 දිනට රු.1,014,295 ක අත්තිකාරම් පියවා තිබුණි. නොපිය වූ අත්තිකාරම් මුදල වූ රු.9,082,329 සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 109 ප්‍රකාර කටයුතු කර ලබා ගත් නියෝග අනුව අතිරේක ප්‍රතිපාදන ලබා ගෙන අත්තිකාරම් නිරවුල් කළ යුතු වුවත්, එසේ ලබා ගත් අතිරේක ප්‍රතිපාදනවලින් අත්තිකාරම් මුදල් නිරවුල් කර නොතිබුණි.

| අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව | අත්තිකාරම් ලබාගත් කාරණය | අත්තිකාරම් ලබාගත් දිනය | ලබාගත් අත්තිකාරම | 2012 දෙසැම්බර් 31 දිනට නිරවුල් කිරිමේ කාල පමාව |
|---|---|---|---|---|
| | | | රු. | |
| නාගරික සංවර්ධන හා පූජා භූමි සංවර්ධන අමාත්‍යාංශය | නිවාස ව්‍යාපෘතියේ මුදල් වංචාව | 2007.11.29 | 6,640,249 | අවු.05 මාස 01 |
| සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය ජාතික රෝහල | මුදල් වංචාව - 2002 | 2002 පෙබරවාරි | 2,408,460 | අවු.10 මාස 10 |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කොළඹ | මුදල් වංචාව - 2005 | 2005.04.20 | 33,620 | අවු.07 මාස 08 |
| | | | 9,082,329 | |

ii. 2012 ජනවාරි 26 දිනැති අංක එස්ජ්/ගිණුම්/4/7000/2011 දරන භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල් ඇමතූ රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය මඟින් ඉහත (අ) හි සඳහන් ණය ශේෂ එම ආයතනවලට නිකුත් කරනු ලබන අග්‍රිමයෙන් වාරික වශයෙන් අයකර හිඟ හිටි අත්තිකාරම් පියවීමට කටයුතු කරන මෙන් දන්වා තිබුණත් එසේ කර නොතිබුණි.

## 15.4 වත්කම් කළමනාකරණය

විගණනය සඳහා ඉදිරිපත් කළ ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර නොතිබූ අතර, ලේඛනය සහ විසර්ජන ගිණුමේ සටහන (1) යටතේ දැක්වුණු ජංගම නොවන වත්කම් සංචලනය පිළිබඳ වාර්තාවේ ශේෂය අතර පහත දැක්වෙන පරිදි වෙනසක් පවතින බව නිරීක්ෂණය විය.

| වත්කම් සංකේතය හා නම | ස්ථාවර වත්කම් ලේඛනය අනුව 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය | ජංගම නොවන වත්කම් සංචලන වාර්තාව අනුව 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය | වෙනස |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| 3102 - කාර්යාල උපකරණ | 1,667,350 | 1,980,579 | 313,229 |
| 4064 - පරිගණක ජාල පද්ධති උපකරණ | 31,736 | 15,826 | (15,910) |
| 3514 - දූරකථන | - | 81,835 | 81,835 |
| 2999 - වෙනත් ඉදිකිරීම් | - | 797,312 | 797,312 |
| 2999 - වෙනත් ඉදිකිරීම් | - | 4,965,029 | 4,965,029 |
| | 1,699,086 | 7,840,581 | 6,141,495 |

## 15.5 පාඩු හා හානි

2012 දෙසැම්බර් 24 දින රු.165,000 ක් වටිනා ටොෂිබා 47074875 H අංක දරන ලැප්ටොප් පරිගණකය සොරකම් කිරීමෙන් වූ අලාභය සම්බන්ධයෙන් මු.රෙ. 104 ප්‍රකාරව අවශ්‍ය කටයුතු මෙම වාර්තාවේ දින වන විටත් සිදු කර නොතිබුණි.

**15.6 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (අ) | ජ්‍යෙෂ්ඨ මට්ට | 16 | 12 | 04 |
| (ආ) | තෘතියික මට්ටම | 04 | 04 | - |
| (ඇ) | ද්විතියික මට්ටම | 34 | 21 | 13 |
| (ඈ) | ප්‍රාථමික මට්ටම | 15 | 12 | 03 |
| | එකතුව | 69 | 49 | 20 |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 20 ක් පිරවීමට කටයුතු කර නොතිබුණි.

**16. විසර්ජන ශීර්ෂය 251- තක්සේරු දෙපාර්තමේන්තුව**

**16.1 විගණන විෂය පථය**

තක්සේරු දෙපාර්තමේන්තුවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා ආදායම් ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන යටතේ විගණනය කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 ජූලි 03 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගණුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුලත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**16.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන් දීමේ නිලධාරියාගේ වගකීම**

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල

කිරිම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරිම ප්‍රධාන ගණන් දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍යා ප්‍රකාශයන්ගෙන් තොර වු ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරිම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරිමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරිම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකිමට ඇතුලත් වේ.

## 16.3 විගණන නිරික්ෂණය

2012 දෙසැම්බර් 31 දිනට මුල්‍ය වාර්තා හා පොත් අනුව තක්සේරු දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම් හා සැසදුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ඊ) දක්වා වු පොදු නිරික්ෂණ සහ පහත 16.4 සිට 16.8දක්වා ජේදවල සදහන් ප්‍රධාන විගණන සොයා ගැනිම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරික්ෂණය විය.

### (අ) ගිණුම් ඉදිරිපත් කිරිම

තක්සේරු දෙපාර්තමේන්තුව විසින් 2012 මාර්තු 31 දින වන විට පහත සදහන් ගිණුම් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| ආදායම් සංකේතය | ගිණුමේ නම |
|---|---|
| 2003.20.09 | ආදායම් ගිණුම |

### (ආ) පරිපුරක ඇස්තමේන්තු මඟින් වෙන්කළ මුදල් භාවිතා නොකිරිම

වන්දි විනිශ්චය සහා වියදම් සඳහා රු. 7,000,000 ක ප්‍රතිපාදනයක් කර තිබියදී 2012 දෙසැම්බර් 14 දිනැති පරිපුරක ඇස්තමේන්තු අංක 150 යටතේ වැය විෂයය 1405 සඳහා රු.2,260,000 ක මුදලක් ප්‍රතිපාදනය කර ඇති අතර 2012 දෙසැම්බර් 31 දිනට ඉතිරිය රු.3,061,744 ක් විය. ඒ අනුව මුළු පරිපුරක ඇස්තමේන්තු ප්‍රතිපාදිත මුදලම උපයෝජනය කර නොමැති බව නිරික්ෂණය විය.

### (ඇ) ඉන්ධන හා විදුලි වියදම් කළමනාකරණය

ඉන්ධන හා විදුලි වියදම් සඳහා අයවැය ඇස්තමේන්තු මගින් සලසා තිබුණු ප්‍රතිපාදන ඇතුළත වියදම් කළමනාකරණය කර ගත යුතු බවත්, ඒ සඳහා කිසිදු අතිරේක මුදලක් ලබා නොදෙන බවත්, මුදල් රෙගුලාසි 66 මගින් ප්‍රතිපාදන මාරු කිරිම භාණ්ඩාගාරය විසින් අනුමත නොකරන බවත් 2012 පෙබරවාරි 16 දිනැති අංක 156 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයෙන් උපදෙස් දී තිබුණත්, එම උපදෙස් නොතකා එම වැය විෂයයන් සඳහා මුදල් රෙගුලාසි 66 මගින් රු.300,000 ක් ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂයේදි මාරු කර තිබුණි.

**(ඈ) පොදු තැන්පත් ගිණුම**

2012 දෙසැම්බර් 31 දිනට පොදු තැන්පත් ගිණුමේ ශේෂය රු. 435,149 ක් වූ අතර ඒ පිළිබඳ කාල විශ්ලේෂණයක් පහත දැක්වේ.

| වර්ෂ 1 ට අඩු | වර්ෂ 1 ට වැඩි 2ට අඩු | වර්ෂ 2ට වැඩි 5 ට අඩු | 2012දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|---|
| රු. | රු. | රු. | රු. |
| 321,500 | 34,019 | 79,629 | 435,149 |

වර්ෂ 2 ක් ඉක්මවූ රු.79,629 ක් වූ තැන්පතු 07 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**(ඉ) ආදායම් ගිණුම**

ඉදිරිපත් කරන ලද ගිණුම් අනුව එකතුව රු.358,421,647 ක් වූ ආදායම් හිග හිට තිබුණු අතර ඒ පිළිබඳ කාල විශ්ලේෂණයක් පහත දැක්වේ.

| ආදායම් සංකේතය | කාල විශ්ලේෂණය | | | 2012 දෙසැම්බර් 31 දිනට හිගහිටි ආදායම |
|---|---|---|---|---|
| | වර්ෂ 1 ට අඩු | වර්ෂ 1 ට වැඩි 3 ට අඩු | වර්ෂ 3ට වැඩි | |
| | රු. | රු. | රු. | රු. |
| 2003.02.09 | 16,432,241 | 334,879,147 | 7,110,259 | 358,421,647 |
| එකතුව | 16,432,241 | 334,879,147 | 7,110,259 | 358,421,647 |

2012වර්ෂයේ මුළු තක්සේරු ගාස්තුව රු.42,438,611ක් වුවත් වර්ෂය තුල රු.26,006,370 ක් පමණක් අයකරගෙන තිබුණි. එය මුළු තක්සේරු ගාස්තු ආදායමෙන් සියයට 61.28ක් විය.තක්සේරු ගාස්තු අයකර ගැනීම තක්සේරුව සිදුකිරීමෙන් පසු සිදුකිරීම හා ප්‍රාදේශිය කාර්යාල මගින් එකතු කරනු ලබන තක්සේරු ආදායම් පිළිබඳ වාර්තා ප්‍රධාන කාර්යාලයට නියමිත පරිදි එවා නොතිබීම තක්සේරු ගාස්තු හිඟව පැවතීමට විශාල වශයෙන් බලපා ඇති බව නිරීක්ෂණය විය.

විස්තර පහත දැක්වේ.

(i) ණය පදනමට තක්සේරු කටයුතු සිදු කිරිම

i. සාමාන්‍යයෙන් තක්සේරු දෙපාර්තමේන්තුව විසින් තක්සේරු කටයුතු සිදු කිරිමෙන් පසුව ගාස්තු කැදවිම සිදු කරනු ලබන අතර ඒ අනුව රජයේ ආයතන වලට අමතරව පෞද්ගලික ආයතන වලටද තක්සේරු කටයුතු සිදු කිරිමෙන් පසුව ගාස්තු අයකිරිමට කටයුතු කර ඇති බව නිරික්ෂණය විය. ණය පදනම මත තක්සේරු කටයුතු සිදු කිරිම නිසා 2008 වර්ෂයේ සිට පෞද්ගලික ආයතන වලින් අයවිය යුතු හිග තක්සේරුආදායම 2012 දෙසැම්බර් 31 දිනට රු.40,959,942 ක් විය.

ii. තක්සේරු දෙපාර්තමේන්තුවේ 2012 වර්ෂයට අදාලව රාජ්‍ය හා පෞද්ගලික ආයතන වලින් 2012 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු මුළු හිග තක්සේරු ආදායම රු.16,432,241 ක් වු අතර එයින් රු.1,065,870 ක් අවස්ථා 07 කදි පෞද්ගලික ආයතන 06 කින් අයවිය යුතු හිග තක්සේරු ආදායම් බව නිරික්ෂණය විය.

(ii) ප්‍රාදේශිය කාර්යාල මගින් එකතු කරනු ලබන තක්සේරු ආදායම් පිළිබද වාර්තා ප්‍රධාන කාර්යාලය වෙත නියමිත පරිදි එවා නොමැති වීම

2012 වර්ෂය තුලදි ප්‍රාදේශිය කාර්යාල 13 ක් මාසික ආදායම් වාර්තා ප්‍රධාන කාර්යාලය වෙත එවා නොතිබුණි. ප්‍රාදේශිය කාර්යාල 08 කින් මාස කිහිපයකට පමණක් අදාල මාසික ආදායම් වාර්තා එවා තිබුණි. නියමිත පරිදි මාසික ආදායම් වාර්තා එවා නොමැති වීම හේතුවෙන් ප්‍රාදේශිය කාර්යාල මගින් එකතු කරනු ලබන සියළුම තක්සේරු ආදායම් ප්‍රධාන කාර්යාලය වෙත නියමිත පරිදි ප්‍රේෂණය කර තිබේද යන්න තහවුරු කරගෙන නොතිබුණි.

**(ඊ) රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබද සැසදුම් ප්‍රකාශය**

විෂය අංකය 25101 දරන රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබද 2012 දෙසැම්බර් 31 දිනට සැසදුම් ප්‍රකාශන ප්‍රකාරව එදිනට අයවිම් හිග හිට තිබුණු ශේෂවල එකතුව රු. 1,116,203 ක් වු අතර, එම හිග හිටි ශේෂ අයකර ගැනිමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි. හිඟහිටිමට බලපා තිබුණු හේතු හා හිඟහිට තිබුණු කාලපරිච්ජේදය පිළිබද සටහනක් පහත දැක්වේ.

| | හේතුව | කාල විශ්ලේෂණය<br>වර්ෂ 1 ට අඩු | වර්ෂ 1 ට වැඩි 2ට අඩු | වර්ෂ 2 ට වැඩි 3 ට අඩු | වර්ෂ 3 ට වැඩි | එකතුව |
|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | සේවා ස්ථාන මාරුවීම් | - | 1,435 | - | 11,916 | 13,351 |
| (ii) | විශ්‍රාම ගැනීම් හා මිය ගිය | 94,839 | 426,650 | - | 74,950 | 596,439 |
| (iii) | වැඩ තහනම් කළ හා සේවය අත්හැර ගිය | - | 239,050 | 129,950 | 137,413 | 506,413 |
| | එකතුව | 94,839 | 667,135 | 129,950 | 224,279 | 1,116,203 |

චලනය නොවන ශේෂ 15 කට අදාලව රු.224,279 ක හිඟ ණය හා අත්තිකාරම් පැවති අතර එම මුදල් අයකර ගැනීම පිළිබඳව කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

## 16.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

### 16.4.1 වාර්ෂික කාර්යසාධන වාර්තාව

රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන ලිපියේ සඳහන් 2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 සහ 2004 පෙබරවාරි 20 දිනැති අංක 402(1) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාර දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කළ යුතු වාර්ෂික කාර්ය සාධන වාර්තාව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත විගණකාධිපතිට පිටපතක් සහිතව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාල කාර්ය සාධන වාර්තාව 2013 ජුනි 20 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කල බවට තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීය.

### 16.4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛ ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

### 16.4.3 අභ්‍යන්තර විගණනය

2012 ජුලි 01 දින සිට 2012 දෙසැම්බර් 31 දක්වා අභ්‍යන්තර විගණක තනතුර සහ අභ්‍යන්තර විගණක සහයක තනතුර පුරප්පාඩුව පැවතීම හේතුවෙන් අභ්‍යන්තර විගණන ඒකකය ක්‍රියාත්මක නොවීය.

**16.5 වත්කම් කළමනාකරණය**

**ජංගම නොවන වත්කම්**

ජංගම නොවන වත්කම් ගිණුම්ගත කිරීම පිළිබඳව පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ස්ථාවර වත්කම් ලේඛනයේ වාහන 09 ක විස්තර දක්වා ඇතත් ඒවා එකිනෙකෙහි පිරිවැය දක්වා නොමැති අතර වාහන 06 කට අදාලව එකතුව පිරිවැය රු.12,715,000 ක් පමණක් දක්වා තිබුණි. නමුත් විසර්ජන ගිණුමේ වාහන වල වටිනාකම රු.7,605,000 ක් ලෙස දක්වා තිබුණි.

(ආ) වායු සමීකරණ යන්ත්‍ර 21 කට අදාලව තොරතුරු ස්ථාවර වත්කම් ලේඛනයේ සටහන් කර තිබුණද ඊට අදාලව පිරිවැය සටහන් කර නොතිබුණි. ජංගම නොවන වත්කම් පිළිබඳ සංචලන වාර්තාව අනුව වර්ෂයේ මිලදී ගැනීම් පිරිවැය රු.161,649 ක් විය.

(ඇ) තක්සේරු දෙපාර්තමේන්තු පරිශ්‍රය පිහිටි ඉඩමේ වටිනාකම ස්ථාවර වත්කම් ලේඛනයේ සහ 2012 වර්ෂයේ විසර්ජන ගිණුමේ ඇතුලත් කර නොමැති බව නිරීක්ෂණය විය.

**16.6 අනුකුල නොවීම**

**නිති, රිති, රෙගුලාසි යනාදියට අනුකුල නොවීම**

නියැදි විගණන පරික්ෂණ වලදී නිරීක්ෂණය වු නිති,රිති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකුල නොවු අවස්ථා පහත විග්‍රහ කර ඇත.

| | නිති, රිති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකුල නොවීම |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | <u>මුදල් රෙගුලාසි</u> | | |
| | මුදල් රෙගුලාසි 50 | | විසර්ජන ගිණුමට අනුව ඇස්තමේන්තු ප්‍රතිපාදනවලින් සියයට 50 ක් ඉක්මවා ප්‍රතිපාදන ඉතිරිව තිබුණු වටිනාකම රු.511,290 ක් වු වැය විෂයන් 01 ක් ද සියයට 20 ඉක්මවා ප්‍රතිපාදන ඉතිරිව තිබුණු වටිනාකම රු.4,249,371 ක් වු වැය විෂයන් 5 ක් ද නිරීක්ෂණය විය. ඒ අනුව වියදම් ඇස්තමේන්තු සකස් කිරිමේදි ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පුර්ණයෙන් සකසුරුවම් හා කාර්යාක්ෂම ලෙස සකස් කර නොමැති බව නිරීක්ෂණය විය. |

| | | |
|---|---|---|
| මුදල් රෙගුලාසි 85(1) | | 2012 වර්ෂය සඳහා විස්තරාත්මක මූලික ආදායම් ඇස්තමේන්තුවක් ප්‍රාදේශීය කාර්යාල අනුව පිළියෙල කර නොතිබුණි. |
| මුදල් රෙගුලාසි 128 (2) (ඇ) | - | වෙනත් කාර්යාල මගින් එකතු කරනු ලබන ආදායම් කොටස් එම කාර්යාල මගින් වාර්තා ලබාගෙන රාජ්‍ය ආදායම් ගිණුම් හා වාර්තා වල අන්තර්ගත කර නොතිබුණි. |
| මුදල් රෙගුලාසි 128(2) (ඉ) | | රජයට ලැබිය යුතු හිඟ ආදායම් අප්‍රමාදව එකතු කර ගැනීම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් විශේෂ විධි විධාන යොදා නොතිබුණි. |
| මුදල් රෙගුලාසි 128(2) (උ) | | රාජ්‍ය ආදායම් ගිණුම් හා වාර්තා අනුව ආදායම භාණ්ඩාගාරයේ වාර්තා සමග මාසිකව සසදා නොතිබුණි. |
| මුදල් රෙගුලාසි 371 | 261,205 | අවස්ථා 17 කට අදාලව තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම කල විගසම පියවා නොතිබුණි. |
| මුදල් රෙගුලාසි 427(2) | | අග්‍රිම ගිණුමට අදාල භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් දෙපාර්තමේන්තු පොත් සමග මාසිකව සසදා නොතිබුණි. |
| මුදල් රෙගුලාසි 571 | | පොදු තැන්පත් ගිණුමේ 2012 දෙසැම්බර් 31 දිනට වර්ෂ 2 ඉක්මවූ හඳුනා නොගත් තැන්පතු වල වටිනාකම රු.79,629 ක් විය. |

(ආ) <u>රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය</u>
**2003** ජුනි **02** දිනැති අංක **PED 12** දරණ යහපාලනය පිළිබඳ චක්‍රලේඛයේ

| | | |
|---|---|---|
| **5.1.2** | - | වර්ෂය තුලදී ඉලක්ක ගත අරමුණු කරා ලගාවීමට අනුගමනය කල යුතු උපාය මාර්ග ඇතුලත් කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| 5.1.3 | - | අනුමත කරන ලද සංයුක්ත සැලැස්මේ පිටපත් වර්ෂය ආරම්භ විමට දින 15 ට ප්‍රථම මුදල් අමාත්‍යාංශය, මහා භාණ්ඩාගාරය,රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව හා විගණකාධිපති වෙත ඉදිරිපත් නොකිරිම හා සංයුක්ත සැලැස්ම අනුමත කර නොගැනිම. |
| (ඇ) <u>භාණ්ඩාගාර චක්‍රලේඛ</u><br>2001 ජනවාරි 25 දිනැති අංක IAI/2001/1 දරන අභ්‍යන්තර විගණන පිහිටුවීමේ චක්‍රලේඛය | - | විගණන හා කළමනාකරණ කමිටු කාර්යයන් සක්‍රිය කිරිම සඳහා පවත්නා සිමිත සම්පත් උපරිම අයුරින් ප්‍රයෝජනයට ගනිමින් අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවිය යුතු වුවත් 2012 ජුලි 01 දින සිට 2012දෙසැම්බර් 31 දක්වා අභ්‍යන්තර විගණන ඒකකය අවශ්‍ය නිලධාරින් අනුයුක්ත නොකිරිම හේතුවෙන් ක්‍රියාත්මක තත්වයේ නොපැවතුණි. |
| (ඇ) <u>ජාතික අයවැය චක්‍රලේඛ</u> | | |
| 2012 පෙබරවාරි 16 දිනැති අංක 156 දරන රාජ්‍ය වියදම් කළමනාකරණ චක්‍රලේඛය | 300,000 | විදුලි වියදම් වෙනුවෙන් ඇස්තමේන්තුවේ සඳහන් ප්‍රතිපාදන සිමාව තුල වියදම් කළමනාකරණය නොකිරිම හේතුවෙන් මුදල් රෙගුලාසි 66 යටතේ ප්‍රතිපාදන මාරු කිරිමට සිදුවී තිබුණි. |
| (ඉ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ පිළිබඳ 2006 ඔක්තෝබර් 05 දිනැති අංක 06 චක්‍රලේඛය මගින් සංශෝධිත 2006 ජනවාරි 25 දනැති අක 08 දරන ජාතික ප්‍රසම්පාදන නියෝජිතායතන චක්‍රලේඛය | | |
| (i) 2.8.4 වගන්තිය | 195,915 | අවස්ථා 01 කට අදාලව තාක්ෂණික ඇගයිම් කමිටුවක් පත් කර නොතිබුණි. |
| (ii) 2.8.4(ඇ) වගන්තිය | 1,505,521 | අවස්ථා 02 කට අදාලව තාක්ෂණික ඇගයිම් කමිටුව විෂය පිළිබද විශේෂඥයකුගෙන් සමන්විත වී නොතිබුණි. |
| (iii) 4.2.1 (අ) වගන්තිය | | මිළදි ගැනීම් හා ඉදිකිරිම් සඳහා දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| | (iv) 4.3.1වගන්තිය | 195,915 | අවස්ථා 01 කට අදාලව මුළු පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල කර නොතිබුණි. |
| | (v) 5.4.8 (අ) වගන්තිය | 875,773 | අවස්ථා 01 කට අදාල ඇස්තමේන්තු කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 5 නොඅඩු කාර්ය සාධන සුරක්ෂණ ලබා ගෙන නොතිබුණි. |
| | (vi)5.6 වගන්තිය | 137,860 | අවස්ථා 01 කට අදාලව මිලදි ගැනිම සඳහා පිරිවිතර සකස් කර නොතිබුණි. |
| | (vii)6.3.1 (අ) වගන්තිය | 467,370 | අවස්ථා 04 කට අදාල මුද්‍රා තබන ලද මිල ගණන් කැදවා නොතිබුණි. |
| | (viii)8.9.1 (අ) වගන්තිය | 875,773 | අවස්ථා 01 කට අදාල රු.250,000 ඉක්මවූ කොන්ත්‍රාත් සඳහා විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමකට නොඑළඹීම. |
| (ඊ) | 2008 දෙසැම්බර් 31 දිනැති අංක 434 දරණ ආදායම් රැස්කිරිම පිළිබද චක්‍රලේඛය | 3,956,666 | රජයේ මුල්‍යාධාර මත යැපෙන සියළුම ආයතන සඳහා ගාස්තුවකින් තොරව තක්සේරු කටයුතු සිදු කළ යුතු වුවත් රාජ්‍ය මුල්‍යාධාර මත යැපෙන ආයතන වලින් රු.3,956,666 ක් 2012 වර්ෂයට අදාලව ආදායම් ලෙස ගිණුම් ගත කර තිබුනි.<br>මෙම හිඟ ආදායම් අයකර ඇත්තේ රාජ්‍ය මුල්‍යාධාර මත යැපෙන ආයතන විසින් පෞද්ගලික පාර්ශව වෙනුවෙන් ලබාගත් තක්සේරු කටයුතු සඳහා බව පැවසුවද එය සනාථ කර ගැනිම සඳහා ප්‍රමාණවත් තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (උ) | දෙපාර්තමේන්තු චක්‍රලේඛ 14/2001 | | ප්‍රාදේශිය කාර්යාල විසින් ප්‍රධාන කාර්යාලය වෙත මාසික තක්සේරු වාර්තා එවා නොතිබුණි. |

## 16.7 කාර්යසාධනය

2012 වාර්ෂික අයවැය ඇස්තමේන්තු / සංයුක්ත සැලැස්ම / ක්‍රියාකාරි සැලසුමට අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**සැලසුම් කිරිම**

**වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම සංයුක්ත සැලැස්මට අනුකුල නොවීම**

පහත සදහන් අවස්ථාවලදි පිළියෙල කර තිබුණු වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම සංයුක්ත සැලැස්මට අනුකුල වි නොතිබුණි.

| | විස්තරය | සංයුක්ත සැලැස්මට අනුකුලව - 2012 ඉලක්ක (ඒකක) | 2012 ක්‍රියාකාරි සැලැස්මේ සදහන් ඉලක්ක (ඒකක) |
|---|---|---|---|
| (i) | පෞද්ගලික ඉඩම් අත්පත් කර ගැනිම සම්බන්ධයෙන් තත්ත්ව වාර්තා | 6,300 | 9,000 |
| (ii) | ඉඩම් අත්පත්කර ගැනිම් සම්බන්ධ තක්සේරු කිරිම් | 1,300 | 4,700 |
| (iii) | සංවර්ධන කාර්යයන් සදහා පවරා ගැනිම් වෙනුවෙන් වන්දි ඇස්තමේන්තු කිරිම් | 10,600 | 800 |
| (iv) | රජය මගින් ඉඩම් මිලදි ගැනිම් හා බදු දිම සදහා තක්සේරු කිරිම | 31,200 | 21,000 |
| (v) | රාජ්‍ය ආයතන තම දේපළ කුලියට දීම හෝ පෞද්ගලික දේපල කුලියට ගැනීමේදි කුලි තක්සේරු කිරිම. | 5,200 | 3,500 |
| (vi) | අධිකරණ අවශ්‍යතා සදහා තක්සේරු කිරිම. | - | 02 |
| (vii) | රජයේ ගොඩනැගිලි කුලියට දීම සදහා තක්සේරු කිරිම. | 5,600 | 2,400 |
| (viii) | මුද්දර බදු තක්සේරු කිරිම. | 373 | 150 |
| | වරිපනම් නැවත තක්සේරු කිරිම | | |
| (ix) | I මුලික පරික්ෂණ | 63,500 | 470,000 |
| | II අවසන් පරික්ෂණ | 0 | 200,000 |
| (x) | වරිපනම් තක්සේරු කිරිම. | 37,200 | 30,500 |
| (xi) | ගොඩනැගිලි වරිපනම් තක්සේරු කිරිම. | 2,700 | 3,000 |
| (xii) | විරෝධතා නැවත තක්සේරු කිරිම. | 7,000 | 3,500 |
| (xiii) | ගෙවල් කුලි මණ්ඩල රැස්වීම් වලට සහභාගි වීම. | - | 300 |

**16.8 මානව සම්පත් කළමනාකරණය**

**(අ) අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | | අනුමත සේවක සංඛ්‍යාව | තත්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම් | 86 | 58 | 28 | - |
| (ii) | තෘතියික මට්ටම් | 362 | 331 | 31 | - |
| (iii) | ද්විතියක මට්ටම් | 101 | 76 | 25 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම් | 90 | 85 | 05 | - |
| (v) | වෙනත්(අනියම්/ පදනම | - | - | - | 02 |
| | එකතුව | 639 | 552 | 89 | 02 |

(ආ) පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ

(i) සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 89 ක් පිරවීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

(ii) 2012 වර්ෂයේ අනුමත කාර්ය මණ්ඩලයේ බංගලා භාරකරු තනතුරු දෙකක් අනුමත කරගෙන නොතිබූ අතර , අනියම් පදනම මත සේවකයන් දෙදෙනෙකු බඳවා ගෙන තිබුණි.

**17. විසර්ජන ශීර්ෂය 252 - ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව**

**17.1 විගණන විෂය පථය**

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 දෙසැම්බර් 11 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශය පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශය පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුලත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**17.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මුල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශය පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුලත් වේ.

**17.3 විගණන නිරීක්ෂණ**

2012 දෙසැම්බර් 31 දිනට මුල්‍ය වාර්තා හා පොත් අනුව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ඈ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 17.4 සිට 17.10 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) රාජ්‍ය වියදම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2011 දෙසැම්බර් 30 දිනැති අංක 155 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව 2012 වර්ෂය සඳහා පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද වාර්ෂික අයවැය ඇස්තමේන්තු මගින් සලසා තිබුණු පුනරාවර්තන ප්‍රතිපාදනවලින් සියයට 2 ක ප්‍රතිපාදන ඉතිරි කර නොතිබුණි.

(ii) මූලධන වැය විෂයයන් 03 ක එකතුව රු.74,201,830 ක් ඉතිරිවීම් වලට හේතුව ඉහත (අ) (i) හිසඳහන්චක්‍රලේඛය ප්‍රකාර ඉතිරි කිරීම් ලෙස දක්වා තිබුණද එම ඉතිරිවීම්, වියදම් සකසුරුවම් ලෙස කළමනාකරණය කිරිමේ අපේක්ෂාවෙන් කරන ලද ඉතිරි කිරීම් නොව වෙනත් හේතුන් මත සිදුවූ ඉතිරිවීම් විය.

**(ආ) අග්‍රිම ගිණුම්**

මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව කාර්යය නිමකළ වහාම ලබාගත් තත්කාර්ය අතුරු අග්‍රිමය නිරවුල් කළයුතු වුවත්, කාර්යය නිමවී මාස 01 සිට මාස 05 දක්වා ප්‍රමාදයකින් පසුව පියවීම් සිදු කර තිබුණ අවස්ථා පැවතුණි.

**(ඇ) පොදු තැන්පත් ගිණුම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වත්කම් මිලදී ගැනීම සඳහා 2011 වර්ෂය අවසානයේදී පොදු තැන්පත් ගිණුමට මාරු අකර තිබු රු.24,400,000 ක මුදලින් 2012 දෙසැම්බර් 31 දින වන විටත් මිලදී ගැනීම් සිදු කර තිබුණේ රු.10,534,742 ක වත්කම් පමණි. ඉතිරි රු.13,865,258 ක මුදල උපයෝජනයකින් තොරව තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

(ii) නිකුත් කළ නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොකළ මාස 06 ඉක්මවු චෙක්පත් සම්බන්ධයෙන් මු.රෙ 396 (ඇ) පරිදි කටයුතු කළ යුතු වුවත් ඊට පටහැනිව චෙක්පත් 30 ක එකතුව රු.117,010 ක් 2012 දෙසැම්බර් 31 දින පොදු තැන්පත් ගිණුමට මාරුකර තිබුණි.

**(ඈ) රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුමපිලිබඳ සැසඳුම් ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ණය දීම් සම්බන්ධයෙන් පවත්වා ගත යුතු ණය ගැති හා ණය හිමි ලේඛන යාවත්කාලීනව පවත්වා නොතිබුණි.

(ii) චලනය නොවන හිඟ ණය ශේෂ 20 කට අදාලව රු. 560,877 ක හිඟ ණය හා අත්තිකාරම් පැවති අතර එම මුදල් අයකර ගැනිම පිලිබඳ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

## 17.4 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය

### 17.4.1 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5 (4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියේ සඳහන් 2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 සහ 2004 පෙබරවාරි 20 දිනැති අංක 402(1) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛප්‍රකාර දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කළ යුතු වාර්ෂික කාර්යසාධන වාර්තාව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත විගණකාධිපතිට පිටපතක් සහිතව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාල කාර්ය සාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කර තිබුණේ 2013 ජුනි 21 දිනදීය.

### 17.4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව යෝජිත ප්‍රසම්පාදන සැලැස්මට අමතරව ප්‍රසම්පාදන කාල සටහන හා නව ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් සඳහා වු අයවැය ඇස්තමේන්තුව සකස් කර නොතිබුණි.

**17.4.3. අභ්‍යන්තර විගණනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2009 ජුනි 09 දිනැති හා ඩීඑම්ජ්/2009(1)දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ 09 ඡේදය ප්‍රකාරව ජනවාරි 31දිනට අදාල වර්ෂයේ මූලික වාර්තාව ඉදිරිපත් කර නොතිබුණු අතර වර්ෂයේ සාරාංශ වාර්තාව පිළියෙල කර නොතිබුණි.

(ආ) අභ්‍යන්තර විගණන වැඩසටහන අනුව විගණනයක් සිදු කළ බව පිළිගැනීමට කිසිදු අභ්‍යන්තර විගණන විමසුමක් ඉදිරිපත් නොකෙරුණ අතර විශේෂ විමර්ෂණ අභ්‍යන්තර විගණන විමසුම් 05ක් පමණක් ඉදිරිපත් කර තිබුණි. තවද දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්ය වූ සංගණන පැවැත්වීම සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

(ඇ) අභ්‍යන්තර විගණන අවශ්‍යතා සඳහා නිලධාරීන් දෙදෙනෙකු පමණක් අනුයුක්ත කර තිබීම ප්‍රමාණවත් නොවීම හා භෞතික සම්පත්වල අඩුපාඩු අභ්‍යන්තර විගණන කටයුතු කරගෙන යාමට පවතින බාධාවක් ලෙස දක්වා තිබුණද එම අඩුපාඩු මඟහරවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**17.5 වත්කම් කළමනාකරණය**

**(අ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

2010 දෙසැම්බර් 17 දිනැති අංක පීඑෆ්/සමීක්ෂණ මණ්ඩල/01 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය මඟින් සංශෝධිත 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2012 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදු කර එම වාර්තා2013 මාර්තු 31 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තා ඉදිරිපත් කර තිබුණේ 2013 සැප්තැම්බර් 12 දිනදීය.

**(ආ) ජංගම නොවන වත්කම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) දෙපාර්තමේන්තු නව ගොඩනැගිල්ල ඉදි කරමින් පවතින ඉඩමේ වටිනාකම තක්සේරු කර ගිණුම් ගත කර නොතිබුණි.

(ii) දෙපාර්තමේන්තුව මඟින් නව ගොඩනැගිල්ල ඉදි කිරීම සඳහා දරන ලද රු.308,284,963 ක වියදම ජංගම නොවන වත්කම් සංචලන වාර්තාවේ පෙන්වා ඇතත්, ව්‍යාපෘතිය අවසන් වීම මත සංඛ්‍යාන කුසලතා ඉහල නැංවීමේ ව්‍යාපෘතිය යටතේ නව ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා වැය කළ රු.104,018,475 ක් වූ වියදම ජංගම නොවන වත්කම් සංචලන වාර්තාවේ දක්වා නොතිබුණි.

## 17.6 අනුකූල නොවීම්

**නිති, රිති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වු නීති රීති හා ,රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවු අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| (අ) ව්‍යවස්ථාපිත විධිවිධාන<br>1987අංක 3 දරන පොදු කොන්ත්‍රාත් ගිවිසුම් පනත | | |
| (i) 6 (1) (අ) උප වගන්තිය | - | කොන්ත්‍රාත් ගිවිසුමේ පිරිවැය රුපියල් පනස් ලක්ෂය ඉක්මවන අවස්ථාවක සෑම ලංසුකරුවෙකුම පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර්වරයා වෙත ලියාපදිංචි විය යුතු වුවත්, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සඳහා ඉදි කරනු ලබන ගොඩනැගිල්ලේ දෙවන අදියර සඳහා ඉදිරිපත් වූ ලංසුකරුවන් එසේ ලියාපදිංචි වී සිටි ලංසුකරුවන්ද යන්න සනාථ කරගෙන නොතිබුණි.<br>තවද ලංසුව පිරිනැමූ පසු දින 60 ක් ඇතුලත කොන්ත්‍රාත් ගිවිසුමද මෙම පනත යටතේ ලියාපදිංචි කළ යුතු වුවත් මෙම ලංසුව පිරිනමන ලද සමාගම ඒ අනුව කටයුතු කර ඇති බව නිරීක්ෂණය නොවීය. |
| (ii) 12 වගන්තිය | | පනතේ 8 වන වගන්තිය සඳහන් තැනැත්තන් විසින් මේ පනත යටතේ නිකුත් කරන ලද වලංගු ලියාපදිංචි කිරීමේ සහතිකයක් පලමුවෙන් තමා වෙත ඉදිරිපත් කරනු ලැබුවහොත් මිස, පොදු මණ්ඩලයක හෝ ඒ මණ්ඩලයේ කාර්මික කමිටුවක ලංසු මණ්ඩලයක හෝ ඇගයීම් මණ්ඩලයක යම් සාමාජිකයෙකු විසින් හෝ එහි යම් නිලධාරියෙකු නැතහොත් සේවා නියුක්තයෙකු විසින් නැතහොත් යම් රාජ්‍ය නිලධාරියෙකු හෝ රෙජිස්ට්‍රාර්වරයා විසින් ලියාපදිංචි කිරීමේ කාර්යය සඳහා හැර යම් පොදු කොන්ත්‍රාත් ගිවිසුමකින් උද්ගත වන්නා වූ හෝ එවැනි කොන්ත්‍රාත් ගිවිසුමකට |

අදාල වන්නා වූ යම් කරුණක් සම්බන්ධයෙන් 8 වන වගන්තිය සඳහන් යම් තැනැත්තෙකු සමඟ කිසිම කටයුත්තක් කරනු නොලැබිය යුතු බවද, මෙම ලංසුවට අදාල ලියාපදිංචි වූ බවට වලංගු ලියාපදිංචි කිරීමේ සහතිකයක් ඇති බවට තහවුරු කර නොගෙන ලංසුකරුවන් සමඟ ප්‍රසම්පාදන හා ඇගයීම් කමිටු වල නිලධාරීන් කටයුතු කර තිබුණි. ඉහත පරිදි කටයුතු කිරීම මත පනතේ 12 වගන්තිය අනුව එකී නිලධාරීන් විසින් දඬුවම් ලැබිය යුතු වරදක්ද සිදු කර තිබුණි.

(ආ) ආයතන සංග්‍රහය
------------------
XII පරිච්ඡේදයේ

(i) 1.2 හා 1.7 වගන්ති

i. මෙරට ගත කරන නිවාඩු පොදු 125 අ ආකෘතියෙන් ඉල්ලුම් කර පොදු 190 ආකෘතිය ප්‍රකාරව නිවාඩු ලේඛනයක එකී නිවාඩු ඇතුලත් කළ යුතු වුවත් ජාතික ගිණුම් අංශයේ රාජ්‍ය කළමනාකරණ සේවයේ නිලධාරිනියක විසින් 2012 වර්ෂයේ ජනවාරි සිට නොවැම්බර් දක්වා නොපැමිණි දින 16 ක් වෙනුවෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

ii. ප්‍රධාන කාර්යාලයේ නිලධාරීන්ගේ නිවාඩු පැන්සලෙන් සටහන් කර තිබුණු අවස්ථා සහ නිවාඩු ලේඛනයේ නිවාඩු සටහන් කර නොතිබුණු අවස්ථා විය.

(ii) 15.4 හා 15.12 වගන්ති — 421,800

මසකට වැඩි කාලයක් සඳහා වැටුප් රහිත නිවාඩු ලබා ගන්නා සෑම නිලධාරියෙක්ම සිය නිවාඩු කාලය අවසන් වූ පසු රජය යටතේ සේවයට ආපසු පැමිණෙන බවටද, තමන් ලබා ගත් වැටුප් රහිත සම්පූර්ණ නිවාඩු කාලය මෙන් දෙගුණයකට සමාන කාලයක් රජයට සේවය කරන බවටද නිලධාරියා නිවාඩු යාමට පෙර ගිවිසුම් අත්සන් කළ යුතු වුවත්, සංඛ්‍යා ලේඛන නිලධාරියකු සමඟ ගිවිසුමකට එළඹ තිබුණේ වැටුප් රහිත නිවාඩු කාල පරිච්ඡේදය අවසානයේ එනම් 2007 නොවැම්බර් 01 දිනදීය.

| | | | |
|---|---|---|---|
| (iii) | 15.16 වගන්තිය | 108,720 | අනුමත කරන නිවාඩු කාලය දීර්ඝ කරන සෑම අවස්ථාවකදීම ගිවිසුමේ දක්වා ඇති අනිවාර්ය සේවා කාලය හා දණ්ඩන මුදලද ඊට අනුරූපවන පරිදි වැඩි කළ යුතු අතර එකී සංශෝධනයන් පිළිබඳ නිලධාරියාට දන්වා ඔහුගේ කැමැත්ත ලියවිල්ලකින් ලබා ගෙන එම ලියවිල්ල ගිවිසුම සමඟ අමුණා තිබිය යුතුය. එසේ වුවද සංඛ්‍යා ලේඛන නිලධාරිවරියකගේ වැටුප් රහිත නිවාඩු කාලය 2004 නොවැම්බර් 01 දින සිට 2006 නොවැම්බර් 01 දින දක්වා දීර්ඝ කර ඇතත් එවැනි එකඟතාවයක් නොමැති වීම හේතුවෙන් එම කාලයට අදාල මුදල අය කර ගැනීමට නොහැකි වී තිබුණි. |
| (iv) | 16.15 වගන්තිය | 1,409,090 | එතෙර රැකියාවන් සඳහා වැටුප් රහිත නිවාඩු ලබා ගැනීමේදි ලබාගත් වැටුප් රහිත නිවාඩුව මෙන් දෙගුණයක් අනිවාර්ය සේවා කාලය වශයෙන් සේවය කළ යුතු වුවත් වැටුප් රහිත නිවාඩු කාලයෙන් පසු නිලධාරින් 04 දෙනෙකු සේවයට වාර්තා කර නොතිබුණ අතර එකී නිලධාරින්ගෙන් රජයට අය විය යුතු මුදල් අයකර ගෙන නොතිබුණි. |
| (v) | 23.8 වගන්තිය | | දිවයිනෙන් බැහැර නියමිත රටට පැමිණීමෙන් පසු තමාගේ ලිපිනයද එහි වෙනස්වීම්ද සිය දෙපාර්තමේන්තු ප්‍රධානියාට දැනුම් දිය යුතු වුවත් ඉහත නිලධාරින් 04 දෙනා එසේ කර නොතිබුණි. |
| (vi) | 23.10 හා 23.10.1 වගන්ති | | හදිසි අවස්ථාවකදී හැර දිවයිනෙන් බැහැර ගත කරන නිවාඩු දීර්ඝ කිරීමක් සඳහා අයදුම්කරන බවට අනුමත කරන බලධාරියාගේ එකඟතාවය දිවයිනෙන් පිටත්ව යෑමට පෙර ලබාගෙන ඇත්නම් මිස දිවයිනෙන් බැහැර නිවාඩු දීර්ඝ නොකළ යුතුවා සේම, නිවාඩු දීර්ඝ කරවා ගැනීමට අදහස් කරන නිලධාරින් කල්වේලා ඇතිව ඉල්ලීම් කළ යුතු වුවත් නිලධාරින් දෙදෙනෙකු එසේ කර නොතිබුණි. |
| (vii) | 23.18 වගන්තිය | | රජයේ නිලධාරින් දිවයිනෙන් බැහැර ගත කරන නිවාඩු පිළිබඳ වාර්තාවක් |

| | | | |
|---|---|---|---|
| | | | දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් මාස්පතා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් එසේ කර නොතිබුණි. |
| | (viii) | XXVIII පරිච්ඡේදයේ 1.7 වගන්තිය | රාජකාරි ලියකියවිලිවල විගණන කටයුතු වලදී පමණක් කොළ පාට භාවිතා කළ යුතු වුවත් ඊට පටහැනිව CC10ලේඛනයේ කොළ පාට පැනෙන් ලියා තිබුණි. |
| (ඇ) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ<br>------------------------------ | | |
| | (i) | 1990 ඔක්තෝබර් 30 දිනැති අංක 41/90 චක්‍රලේඛයේ 2.11 වගන්තිය - | සෑම මාස 06 කට වරක්ම රජයේ වාහනවල ඉන්ධන දැවීම පරීක්ෂා කළ යුතු වුවත් දෙපාර්තමේන්තුවේ වාහන 57 ක් සඳහා එසේ කර නොතිබුණි. |
| | (ii) | 1992ජනවාරි 25 දිනැති අංක 03/92 චක්‍රලේඛයේ 02 (1) වගන්තිය | පෙ.ව.8.30 සිට පෙ.ව.9.00 දක්වා කාලය තුල කාර්යාලයට පැමිණෙන නිලධාරියෙකුට එසේ ප්‍රමාද වන කාලය ප.ව.4.45 දක්වාද සුළු සේවකයින් සඳහා පෙ.ව.8.00 ත් පෙ.ව.8.15 ත් අතර ප්‍රමාදව පැමිණෙන කාලය ප.ව.5.00 දක්වාද පමණක් ආවරණය කිරීමට ඉඩදී තිබුණද ඊට පටහැනිව ප්‍රමාදව පැමිණීම් සහ නියමිත වේලාවෙන් පසුව ආවරණය කිරීමට ඉඩදී තිබුණි. |
| | (iii) | 2006 මැයි 30 දිනැති අංක 09/2006 චක්‍රලේඛයේ 01 වගන්තිය - | රජයේ සේවයන්හි නියුතු කනිෂ්ඨ සේවකයින් හැර අනෙකුත් සියලුම සේවකයින්ගේ කාර්යාල වේලාව පෙ.ව 8.30 සිට ප.ව.4.15 දක්වාද කනිෂ්ඨ සේවකයින් සඳහා කාර්යාල වේලාව පෙ.ව.8.00 සිට ප.ව.4.45 දක්වා වුවද ඊට පටහැනිව පැමිණීම් පිටවීම් පැවති අතර ඒ සඳහා නිවාඩු/ කෙටි නිවාඩු ලබා ගෙන නොතිබුණි. |
| | (iv) | 2008 ජුනි 26 දිනැති අංක 13/2008 චක්‍රලේඛයේ 7 වගන්තිය - | නිවාස සහ කාර්යාලය අතර කණ්ඩායම් ප්‍රවාහන පහසුකම් සැලසිය හැකි උපරිම දුර ප්‍රමාණය කි.මී.50 ක් වුවත් ඊට පටහැනිව එම සීමාව ඉක්මවා කි.මී.66 - කි.මී.108 දක්වා වාහන 04ක් කණ්ඩායම් ප්‍රවාහන පහසුකම් සඳහා යොදවා තිබුණි. තවද සමහර අවස්ථාවලදී මෙම දුර ප්‍රමාණයන්ද ඉක්මවා තිබුණි. |
| | (v) | 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 චක්‍රලේඛයේ 01, 02 - | සියලුම රාජ්‍ය ආයතනවල නිලධාරින් තම සේවා ස්ථානයට පැමිණීම හා පිටවීම ඇඟිලි සලකුණු යන්ත්‍ර මගින් |

| | |
|---|---|
| වගන්ති | සනාථ කළ යුතු වුවද අංශ කිහිපයක කරන ලද නියැදි පරීක්ෂාවේදී එසේ කර නොතිබුණ අවස්ථා නිරීක්ෂණය විය. |

(ඇ) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය

| | |
|---|---|
| (i) 3.2.2 (අ) වගන්තිය | ප්‍රසම්පාදන දැන්වීම්, හැකි සෑම අවස්ථාවකදීම අවම වශයෙන් වැඩි අලෙවියක් සහිත එක් ජාතික පුවත්පතකද, ජාතික ප්‍රසම්පාදන නියෝජ්‍යායතනයේ වෙබ් අඩවියේද, වෙනත් අදාල වෙබ් අඩවිවලද පල කරනු ලැබිය යුතු වුවත්, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සඳහා ඉදිකරන ලබන ගොඩනැගිල්ලේ දෙවන අදියර සඳහා කැඳවූ ප්‍රසම්පාදන දැන්වීම වෙබ් අඩවිවල පලකර නොතිබුණි. |

## 17.7 කාර්ය සාධනය

2012වර්ෂයට අදාලව ඉදිරිපත් කරන ලද ක්‍රියාකාරි සැලැස්ම සහ කාර්යසාධන වාර්තාවට අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) ප්‍රමාණවත් ලෙස ඉටු නොකල ප්‍රධාන කාර්යයන්

දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයක් වූ ජන හා නිවාස සංගණනය පිළිබඳ 2011 අවසන් වාර්තාව මෙතෙක් ප්‍රකාශයට පත්කර නොතිබුණි.

(ආ) සැලසුම් කිරීම

(i) පහත සඳහන් අවස්ථාවලදී ක්‍රියාකාරි සැලැස්මට අනුකූලව ක්‍රියාකර නොතිබුණ බව නිරීක්ෂණය විය.

| | කාර්යය | නිම කිරීමේ ප්‍රගතිය |
|---|---|---|
| i. | අර්ධ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳ සංඛ්‍යාති-2010 | වෙබ් අඩවියේ පලකර නොතිබුණි. |
| ii. | අර්ධ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳ සංඛ්‍යාති-2011 | 2011 වර්ෂයට අදාල දත්ත රැස්කර ඇතුලත් කර අවසන් කර නොතිබුණි. |
| iii. | කෘෂිකර්ම සංගණනය - 2012 | ප්‍රශ්නාවලිය පමණක් සකස් කර |

| | | |
|---|---|---|
| | | තිබුණ අතර කිසිදු කාර්යයක් සිදුකර නොතිබුණි. |
| iv. | ප්‍රකාශන කටයුතු - සංඛ්‍යා නිබන්ධන සංඛ්‍යාන අත්පොත් ත්‍රෛමාසික දත්ත පත්‍රිකා | 2011 වර්ෂයට අදාල අත්පොත්/ පත්‍රිකා ප්‍රකාශයට පත්කර නොතිබුණි. |
| v. | පුස්තකාලය මිලදී ගැනීම් (රු.1,000,000) පොත් බැඳීම් (රු.300,000) | පොත් සහ විදේශ සඟරා මිලදී ගැනීම, පොත් බැඳීම සිදුකර නොතිබුණි. |
| vi. | වාර්ෂික කර්මාන්ත සමීක්ෂණය-2011 | වාර්තා ප්‍රසිද්ධ කර නොතිබුණි. |
| vii. | වී සංඛ්‍යාති- 2011,2012 මහ කන්නය 2012 යල කන්නය | වාර්තා සකස් කර නොතිබුණි. |
| viii. | ලොකු එනුනිෂ්පාදනය -2012 | වාර්තාව මුද්‍රණය කර බෙදා හැර නොතිබුණි. |
| ix. | තේ, රබර්, පොල් නිෂ්පාදන වියදම් සමීක්ෂණය-2011/2012 | සිදුකර නොතිබුණි. |
| x. | ශ්‍රී ලංකා ශ්‍රම බල සමීක්ෂණය - 2012 | සිදුකර නොතිබුණි. |
| xi. | පුහුණු අංශය | පරිගණක පුහුණු පාඨමාලා මගින් නිලධාරින් 180, සංඛ්‍යාන පුහුණු පාඨමාලා මගින් නිලධාරින් 160 හා විශේෂ දේශන මගින් නිලධාරින් 20 ක් පුහුණු කළ යුතු වුවත් එම පුහුණු වීම් සිදුකර නොතිබුණි. |
| xii. | පර්යේෂණ සහ විශේෂ අධ්‍යනය | සිදුකර නොතිබුණි. |

(ii) වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මට ඇතුලත් කර නොතිබුණු පහත කාර්යයන් සිදුකර තිබුණි.

i. වෛද්‍ය සංඛ්‍යාති

ii. සමාජ ආරක්ෂණක දර්ශකය නම් වු දර්ශකයක් පිළියෙල කිරීම සඳහා ගෘහ ඒකක ආදායම් වියදම් සමීක්ෂණයට සමගාමීව තවත් සමීක්ෂණයක් පැවැත්වීම.

**17.8 වංචනික ස්වරූපයේ ගනුදෙනු**

2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.18 (ආ) වගන්තිය ප්‍රකාරව ලංසු ඇගයීමේදී වැට් බදු සැලකිල්ලට නොගතයුතු වුවත්, 2008 ජනවාරි සිට 2009 මැයි දක්වා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ආරක්ෂක සේවාව ලබා ගැනීමේදී ලංසුකරුවන්ගේ මිල ගණන් සියයට 15 ක වැට් සැලකිල්ලට ගෙන ලංසු ඇගයීම් කර තිබුණි.

එසේ වැට් බදු එකතු කළ පසු දක්වා තිබූ මිල ගණන්වලට දෙපාර්තමේන්තුව නැවත සියයට 15 බැගින් වැට් බදු එකතු කර අදාල සමාගම සමඟ ගිවිසුමට එළඹ තිබුණි. එම නිසා මෙම සමාගමට 2008 ජනවාරි සිට 2009 මැයි දක්වා කාල පරිච්ඡේදයට රු. 1,056,402 ක් වැඩිපුර ගෙවා තිබුණු අතර එම මුදල් ආපසු අය කර ගැනීමට හෝ වගකිව යුතු නිලධාරින්ට එරෙහිව ක්‍රියාමාර්ග ගැනීමට හෝ කටයුතුකර නොතිබුණි.

**17.9 කළමනාකරණ දුර්වලතා**

පහත සඳහන් දුර්වලතාවයන් නිරික්ෂණය විය.

(අ) වාහන ලේඛනය ,වාහන ලොග් පොත්, ඉන්ධන ඇනවුම් පොත් හා දෛනික ධාවන සටහන් යාවත්කාලීනව පවත්වා නොතිබුණී .

(ආ) වාර්ෂික ස්ථානමාරු නොලබා අවුරුදු 05 සිට 34 දක්වා කාල පරාසයක් තුල මෙම දෙපාර්තමේන්තුවේ සේවයේ යෙදී සිටින ඒකාබද්ධ සේවයේ නිලධාරින් 31 දෙනෙකු සිටින අතර මෙයින් 18 දෙනෙකුම ඔවුන්ගේ මුල්පත්වීම් දින සිටම මෙම දෙපාර්තමේන්තුවේ සේවයේ යෙදී සිටින නිලධාරින් වේ.

(ඇ) රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවට අනුයුක්තව සිටි සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර ලිපිකාරවරියක 2011 ජුලි 13 දින සිට සේවයට වාර්තා කර නොතිබියදී 2011 ජුලි මාසයේ රු.13,153 ක වැටුප සම්පූර්ණයෙන්ම එම නිලධාරිනියට ගෙවා තිබුණි. 2012 ජනවාරි 10 දිනැති ලිපියෙන් නිලධාරිනිය වෙත තනතුර හැරයාමේ නිවේදනය නිකුත් කර තිබුණද එකී මුදල නිලධාරිනියගෙන් අයකරගෙන නොතිබුණි.

## 17.10. මානව සම්පත් කළමනාකරණය

### (අ) අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 259 | 137 | 122 | - |
| (ii) | තෘතියික මට්ටම | 06 | 04 | 02 | - |
| (iii) | ද්විතීක මට්ටම | 1333 | 972 | 361 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 201 | 170 | 31 | - |
| (v) | වෙනත් (අනියම්/තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | 20 | 23 | - | 03 |
| | එකතුව | 1819 | 1306 | 516 | 03 |

(ආ) පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) අංක HR/11/CARDER/2013 දරන 2013 ජූලි 27 දිනැති අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය මඟින් ඉහත සඳහන් පරිදි සේවක සංඛ්‍යාව පිළිබඳ විස්තර විගණනයට ලබාදී තිබුණද කාර්ය සාධන වාර්තාවේ 2012 දෙසැම්බර් 31 දිනට සේවක සංඛ්‍යාව පිළිබඳ විස්තර පහත සඳහන් පරිදි ඇතුලත් කර තිබුණි.

| අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|
| 1835 | 1336 | 478 |

DCS/AD/CC/AU/2012/26දරන 2013 දෙසැම්බර් 04 දිනැති ලිපියට අනුව කාර්ය සාධන වාර්තාවේ දත්තයන් නිවැරදි ඒවා බව දන්වා තිබුණි.

(ii) කාර්ය සාධන වාර්තාව අනුව පුරප්පාඩු සංඛ්‍යාවේ එකතුව 499 ක් විය යුතු වුවත් එය 478 ලෙස දක්වා තිබුණි.

(iii) තවද ඉදිරිපත් කරන ලද කාර්ය සාධන වාර්තාවේ අනියම් සේවකයින් යටතේ පුරප්පාඩු **23** ක් ලෙස දැක්විය යුතු වුවත් එහි පුරප්පාඩු කිසිවක් දක්වා නොතිබුණි.

(iv) නිසි පරිදි තොරතුරු පවත්වා ගෙන ගොස් නොතිබීම සහ නොසැලකිලිමත්භාවය නිසා ඉහත දක්වා ඇති තත්ත්වයක් උද්ගත වී ඇති බව නිරීක්ෂණය කරන අතර කාලීන වූත් නිවැරදි වූත් දත්ත ලබාදීම දෙපාර්තමේන්තුවේ මෙහෙවර ලෙස දැක්වෙතත් තම දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පවා නිවැරදිව තබා ගැනීමට අපොහොසත් වී ඇති බව නිරීක්ෂණය කරනු ලැබේ.

(v) සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 516ක් පිරවීමට අපොහොසත් වී තිබුණි.

(vi) බඳවා ගෙන තිබුණු අතිරික්ත සේවකයින් 03 දෙනෙකු සඳහා විධිමත් අනුමැතියක් ලබා ගෙන නොතිබුණි.

**8. විසර්ජන ශීර්ෂය 280 - ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව**

**18.1 විගණන විෂය පථය**

ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 නොවැම්බර් 06 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශය පිළිබඳ විගණන නිරීක්ෂණ අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශය පිළබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුලත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**18.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරින්ගේ හා ගණන්දීමේ නිලධාරින්ගේ වගකීම**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් හා ගණන්දීමේ නිලධාරියාගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශය පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයක් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුලත් වේ.

**18.3 විගණන නිරීක්ෂණ**

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 18.4 සිට 18.7 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) අයවැය විචලනය**

වැය විෂයයන් 15 කට එකතුව රු.33,744,400 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර එයින් එකතුව රු.29,719,141 ක් උපයෝජනය කිරීමෙන් පසු රු.4,025,259 ක ඉතිරියක් නිරීක්ෂණය විය. එම ඉතිරිවීම් එක් එක් වැය විෂයය සඳහා සළසා තිබුණු ශුද්ධ

ප්‍රතිපාදනයෙන් සියයට 09 සිට සියයට 53 දක්වා වූ පරාසයක ප්‍රතිශතයක් ගෙන තිබුණි. වැය විෂයයන් සඳහා අධි ප්‍රතිපාදන සැලසීම නිසා මෙම ඉතිරියන් ඇති වී තිබුණු බව නිරීක්ෂණය විය.

**(ආ) ඉන්ධන හා විදුලි වියදම් කළමනාකරණය**

ඉන්ධන හා විදුලි වියදම් සඳහා අයවැය ඇස්තමේන්තු මගින් සලසා තිබුණු ප්‍රතිපාදන ඇතුළත වියදම් කළමනාකරණය කරගත යුතු බවත්, ඒ සඳහා කිසිදු අතිරේක මුදලක් ලබා නොදෙන බවත්, මුදල් රෙගුලාසි 66 මගින් ප්‍රතිපාදන මාරු කිරීම භාණ්ඩාගාරය විසින් අනුමත නොකරන බවත් 2012 පෙබරවාරි 16 දිනැති අංක 156 දරන අයවැය චක්‍රලේඛයෙන් උපදෙස් දී තිබුණත්, එම උපදෙස් නොතකා ඉන්ධන වියදම් සඳහා මුදල් රෙගුලාසි 66 මගින් රු.590,000 ක් ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂයේදී මාරුකර තිබුණි.

**(ඇ) අග්‍රිම ගිණුම්**

ඉන්ධන ලබාගැනීමේදී රජයේ ඇණවුම් භාවිතා කරමින් ඉන්ධන ලබාගත යුතු වුවත්, ඊට පටහැනිව රු.15,000 ක ඉන්ධන අග්‍රිමයක් ලබාදී එමගින් ඉන්ධන බිල්පත් ප්‍රතිපූරණය කර තිබුණි.2012 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා මෙසේ ප්‍රතිපූරණය කර ඇති මුදල රු. 324,000ක් විය.

## 18.4 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය

**වාර්ෂික කාර්යසාධන වාර්තාව**

2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5 (4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියේ සඳහන් 2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 හා 2004 පෙබරවාරි 20 දිනැති අංක 402(1) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාර දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කළ යුතු වාර්ෂික කාර්යසාධන වාර්තාව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත විගණකාධිපතිට පිටපතක් සහිතව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාල කාර්ය සාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කර තිබුණේ 2013 ජූලි 23 දිනදීය.

## 18.5 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
| --- | --- | --- |
| | රු. | |
| (අ) මුදල් රෙගුලාසි | | |
| මුදල් රෙගුලාසි1646 | - | මාසික සාරාංශ සහ දෛනික ධාවන සටහන් සෑම මසක් අවසාන වීමෙන් පසු ඊලඟ මාසයේ 15 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද දෙපාර්තමේන්තුව සතුව ඇති වාහන 11 කට අදාල දෛනික ධාවන සටහන් එසේ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | | |
| (**i**)2007 අගෝස්තු 24 දිනැති අංක 06/2006 (iv)දරන චක්‍රලේඛයේ 5 ඡේදය | 353,402 | නිලධාරියෙක් රාජකාරි සඳහා පිටවී සිටින කාලය වෙනුවෙන් ඔහුගේ යැපීම් හා නවාතැන් පිළිබඳ සංයුක්ත වියදම් පියවා ගැනීමට දීමනාවක් ගෙවිය යුතු වුවත් ඊට පටහැනිව ව්‍යාපෘති අධීක්ෂණයට යාම සඳහා රු.3,000 සිට රු.40,000 දක්වා අතුරු අග්‍රිම ලබාගෙන ආහාර, නවාතැන් හා ඉන්ධන සඳහා සීමාවකින් තොරව වියදම් දරා තිබුණි. |
| (**ii**)2009 ඔක්තෝබර් 21 දිනැති අංක 13/2008 (iii)දරන චක්‍රලේඛයේ 02 ඡේදය | | නිලධාරියකු විශ්‍රාම පූර්ව නිවාඩු ලබා සිටින කාලය තුල නිල වාහන භාවිතා කිරීමට හෝ ඉන්ධන දීමනා ලබාගැනීමට හෝ රියදුරුගේ සේවය ලබාගැනීමට හිමිකම් නොමැති බව සඳහන් කර තිබුණද ඊට පටහැනිව විශ්‍රාම පූර්ව නිවාඩු ලබාසිටි අධ්‍යක්ෂවරයෙකු |

| | | |
|---|---|---|
| | | විසින් මාස 3 ක් සඳහා නිල වාහන පාවිච්චි කර රියදුරුගේ සේවය හා එකතුව රු.57,540 ක ඉන්ධන දීමනාද ලබාගෙන තිබුණි. |
| (ඇ) | 2006 අංක 12 දරන මුද්දර - ගාස්තු (විශේෂ විධිවිධාන) පනත | අවස්ථා 11කදී එකතුව රු.706,322 ක් සඳහා මුද්දර ගාස්තු අයකර නොතිබුණි. |

## 18.6 කාර්ය සාධනය

2012 වාර්ෂික අයවැය ඇස්තමේන්තු / ක්‍රියාකාරි සැලැස්මට අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිලිබද නිරික්ෂණ පහත දැක්වේ.

**ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන්**

දෙපාර්තමේන්තුව ප්‍රධාන කාර්යයන් ප්‍රමාණවත් ලෙස ඉටු නොකර තිබුණු අතර, එසේ නිරික්ෂණය වූ අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(අ) විදේශ අරමුදල් යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති වල මෙහෙයුම් කටයුතු අධීක්ෂණය, විදේශ අරමුදල් භාවිතයෙන් ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘති සහ වැඩසටහන්වල ප්‍රගතිය වේගවත් කිරීම සහ විදේශ අරමුදල් භාවිතා කිරීමේ දූර්වලතා මඟහරවා ගැනීමට අවශ්‍ය පියවර ගැනීමද දෙපාර්තමේන්තු අරමුණු අතර විය.එසේ වුවද ව්‍යාපෘති කාලය අවසන් විමට ආසන්නව තිබියදිත් රු. මිලියන 14,799 ක් වටිනා ව්‍යාපෘති 8ක වැඩ ආරම්භ කර නොතිබුණු අතර ව්‍යාපෘති කාලය අවසන් විමට ආසන්නව තිබියදිත් මුළු ඇස්තමේන්තු පිරිවැයෙන් සියයට 0.09- සියයට 49 අතර වියදම් කළ ව්‍යාපෘති 46ක් විය.

(ආ) ක්ෂේත්‍ර චාරිකා සංවිධානය කිරිම, ව්‍යාපෘති ඇගයිමේ එක් මෙවලමක් වුවද 2012 වර්ෂය තුලදි ක්‍රියාත්මක වු රු. මිලියන 50 ට වැඩි මුළු ව්‍යාපෘති 527 න් 09ක පමණක් ක්ෂේත්‍ර චාරිකා සිදු කර තිබුණි.

(ඇ) සංවර්ධන ව්‍යාපෘතිවල කාර්තුමය තත්ත්ව වාර්තා සහ වර්ෂ අවසාන තත්ත්ව වාර්තාව සකස් කළ යුතු වුවත් එම වාර්තා සකස් කර නොතිබුණි.

**18.7 මානව සම්පත් කළමනාකරණය**

**-----------------------------------**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

**---------------------------------------------------**

2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (අ) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 34 | 26 | 08 |
| (ආ) | තෘතියික මට්ටම | 01 | 01 | - |
| (ඇ) | ද්විතීක මට්ටම | 29 | 19 | 10 |
| (ඈ) | ප්‍රාථමික මට්ටම | 18 | 16 | 02 |
| | එකතුව | 82 | 62 | 20 |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 20 ක් පිරවීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

## 19. විසර්ජන ශීර්ෂය 296 - ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව

### 19.1 විගණන විෂය පථය

ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ 2012 දෙසැම්බර් 31දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා ආදායම් ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී . සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 දෙසැම්බර් 12 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදී .ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම මත පදනම් වී ඇත .එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුලත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 19.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ,148 ,149 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මුල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ .වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුලත් වේ.

### 19.3 විගණන නිරීක්ෂණය

2012 දෙසැම්බර් 31 දිනට මුල්‍ය වාර්තා හා පොත් අනුව ආනයන හා අපනයන පාලනදෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම,ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 19.4 සිට 19.7දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

#### (අ) අයවැය විචලනය

වැය විෂයයන් 11 කට එකතුව රු. 8,178,372 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර එයින් එකතුව රු. 6,783,839 ක් උපයෝජනය කිරීමෙන් පසු රු. 1,394,533 ක ඉතිරියක් නිරීක්ෂණය විය. එම ඉතිරිවීම් එක් එක් වැය විෂයය සඳහා සළසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 10 සිට සියයට 36 දක්වා වූ පරාසයක ප්‍රතිශතයක් ගෙන තිබුණි. වැය විෂයයන් සඳහා අධි ප්‍රතිපාදන සැලසීම නිසා මෙම ඉතිරියන් ඇති වී තිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) **ආදායම් ගිණුම**

**ආදායම් සංකේතාංකය - 10.01.03.00 -ආනයන හා අපනයන බලපත්‍ර ගාස්තු**

සමාලෝචිත වර්ෂය සඳහාරු.280,000,000 වූ මූලික ආදායම් ඇස්තමේන්තුව රු.450,000,0000 ක් ලෙස සංශෝධනය කර තිබුණද වර්ෂය තුල රැස් කර තිබුණ ශුද්ධ ආදායම රු.512,671,434 ක් එනම් මූලික ඇස්තමේන්තු ආදායමෙන් සියයට 183 ක් සහ සංශෝධිත ඇස්තමේන්තු ආදායමින් සියයට 114 ක් විය.ඒ අනුව ඇස්තමේන්තු කිරීම නිසි අධ්‍යයනයකින් සිදු කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ඇ) **රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

දෙපාර්තමේන්තුව විසින් නිලධාරින්ට ණය ලබා දීමේදී පිළිපැදිය යුතු විධිවිධාන අනුගමනය නොකර රු.275,175 ක ණය ගෙවා තිබුණි .

## 19.4 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය

### 19.4.1 සංයුක්ත සැලැස්ම

2010 මාර්තු 10 දිනැති අංක PF/R/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය ප්‍රකාරව 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැලැස්මක් දෙපාර්තමේන්තුව විසින් වර්ෂය ආරම්භයේ පිළියෙල කළ යුතු වුවත්, එසේ සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

### 19.4.2 අභ්‍යන්තර විගණනය

කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව විසින් අභ්‍යන්තර විගණනය සිදු කරනු ලබන අතර කාර්තු 4ට අදාලව අභ්‍යන්තර විගණන වාර්තා 4 ක් නිකුත් කර තිබුණි .

### 19.4.3 විගණන හා කළමනාකරණ කමිටුව ක්‍රියාත්මක කිරීම

අවම වශයෙන් කාර්තුවකට එක් වරක්වත් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්විය යුතු වුවත් 2012 වර්ෂයේදී විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 03ක් පමණක්පවත්වා තිබුණි.

## 19.5 කාර්ය සාධනය

දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද කාර්ය සාධන වාර්තාවට අනුව 2012 වර්ෂය තුල ඉටු කරන ලද කාර්යයන් පහත දැක්වේ.

(අ) **බලපත්‍ර නිකුත් කිරිම**

වර්ෂය තුල මූලික කාණ්ඩ 05ක් යටතේ භාණ්ඩ ආනයනය කිරීමට ලබාදී තිබුණ මුළු බලපත්‍ර සංඛ්‍යාව 11598 කි.

**(ආ) ආනයන හා අපනයන සම්බන්ධයෙන් රජයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය රෙගුලාසි ප්‍රසිද්ධ කිරීම**

ආනයන හා අපනයන පිළිබඳ රජයේ නව ප්‍රතිපත්ති මත නව රෙගුලාසි ප්‍රකාශයට පත් කිරීම සඳහා ගැසට් නිවේදන 04ක් ප්‍රකාශයට පත්කර තිබුණි.

**19.6 අවිධිමත් ගනුදෙනු**

දෙපාර්තමේන්තුව විසින් එළඹ තිබුණු සමහර ගණුදෙනු විධිමත් බවින් තොරවිය .ත්‍යාග යෝජනා ක්‍රමය යටතේ ලබාදුන් ආනයන බලපත්‍ර මත ආගමික ස්ථාන වෙනුවෙන් ආනයනය කරන ලද වාහනවල කොන්දේසි අවිධිමත්ව ඉවත් කිරීම හේතුවෙන් එකී යෝජනා ක්‍රමයේ අරමුණ ඉටුනොවීමටත් වාණිජ පරමාර්ථයෙන් වාහන ආනයනය කරන්නන්ට අක්‍රමිකතා සිදු කිරීමටත් එමගින් ඉඩ සලසා දී තිබුණි .නිරීක්ෂණය වූ එවැනි අවස්ථාවන් කිහිපයක් පහත දැක්වේ.

(අ) බලපත්‍ර ලාභියාගේ ඉල්ලීම මත ණයපහසුකම් ලබාගැනීම වෙනුවෙන් වාහනය බැංකුවට උකස් කිරීම සඳහා “ වසර 05ක් යනතුරු විකිණීම හා පැවරීම කළ නොහැකිය” යන කොන්දේසිය දෙපාර්තමේන්තුව අවස්ථා 27කදී ඉවත් කර තිබුණද, අවස්ථා 09කදී බැංකුවට උකස් නොකර වෙනත් අයට වාහනවල අයිතිය පවරා දී තිබුණි.

(ආ) වාහන බලපත්‍රවල “අවුරුදු 05ක් යනතුරු විකිණීම හෝ පැවරීම සිදුකළ නොහැක”යන කොන්දේසිය තිබියදී අවස්ථා 34කදී වසර 05ඉක්මවීමට පෙර වෙනත් පාර්ශවයන්ට වාහනවල අයිතිය පවරා තිබුණි.

(ඇ) පළමු ලියාපදිංචියේදීම බලපත්‍රලාභියාගේ නමින් නොව වෙනත් අයගේ නමින් වාහන 159ක් ලියාපදිංචි කර තිබුණි.

(ඈ) ත්‍යාග යෝජනා ක්‍රමය යටතේ ආනයනය කර තිබුණු වාහනවලින් වාහන 115ක් 2012 ඔක්තෝබර් 19දින වන විටත් ලියාපදිංචි කර නොතිබුණි .

(ඉ) ත්‍යාග යෝජනා ක්‍රමයට අනුව 2011ජනවාරි 01 දින සිට 2012 සැප්තැම්බර් 14 දින දක්වා වූ කාලපරිච්ජේදය තුල ගෙන්වන ලද වාහන 589ක ලියාපදිංචිය සිදුවී ඇති ආකාරය පරීක්ෂාවේදී සත්‍ය වශයෙන්ම විහාරස්ථාන කාර්ය සාධක සමිති නමින් ලියාපදිංචි වී තිබුණු වාහන සංඛ්‍යාව 254ක් එනම් සියයට 43ක් පමණක් වන අතර එය පැරණි වාහන ගෙන්වීම අධෛර්යමත් කිරීමේ රජයේ වර්තමාන ප්‍රතිපත්තියටද සම්පූර්ණයෙන්ම පටහැනි වී තිබුණි .

## 19.7 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (අ) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 08 | 07 | 01 |
| (ආ) | තෘතියික මට්ටම | 02 | 01 | 01 |
| (ඇ) | ද්විතීක මට්ටම | 60 | 45 | 15 |
| (ඈ) | ප්‍රාථමික මට්ටම | 19 | 19 | - |
| | එකතුව | 89 | 72 | 17 |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 17ක් පිරවීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

## 20. විසර්ජන ශීර්ෂය 323 - නීති කටයුතු දෙපාර්තමේන්තුව

### 20.1 විගණන විෂය පථය

නීති කටයුතු දෙපාර්තමේන්තුවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 නොවැම්බර් 06 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශය පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුලත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 20.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුලත් වේ.

### 20.3 විගණන නිරීක්ෂණය

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව නීති කටයුතු දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 20.4 සිට 20.8 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

#### (අ) අයවැය විචලනය

වැය විෂයයන් 05 කට එකතුව රු.1,246,600 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර එයින් එකතුව රු.799,968ක් උපයෝජනය කිරීමෙන් පසු රු.446,632ක ඉතිරියක් නිරීක්ෂණය විය.එම ඉතිරිය එක් එක් වැය විෂයය සඳහා සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට

14සිට සියයට 75 දක්වා වූ පරාසයක් ගෙන තිබුණි.වැය විෂයන් සඳහා අධි ප්‍රතිපාදන සැලසීම නිසා මෙම ඉතිරියන් ඇති වී තිබුණු බව නිරීක්ෂණය විය.

**(ආ) විසර්ජන ගිණුමේ අඩුපාඩු**

විසර්ජන ගිණුමේ ඩී.ජී.එස්.ඒ. 5 හි ශුද්ධ ප්‍රතිපාදනයේ එකතුව රු. 11,262,000 ක් වුවද එය රු. 11,626,000 ක් ලෙස දක්වා තිබුණි.

**(ඇ) රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිලිබද සැසඳුම් ප්‍රකාශය**

ණයදීම් සම්බන්ධයෙන් විධිවිධාන ප්‍රකාරව පවත්වා ගත යුතු උත්සව අත්තිකාරම් ලේඛනය, විශේෂ අත්තිකාරම් ලේඛනය, ණයගැති ලේඛනය, ණය හිමි ලේඛනය හා පාලන ගිණුම පවත්වා නොතිබුණි.

**20.4 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය**

**වාර්ෂික කාර්යසාධන වාර්තාව**

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා පලාත් පාලන ආයතන ප්‍රධානීන් අමතන ලද 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5 (4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියේ සඳහන් 2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 හා 2004 පෙබරවාරි 20 දිනැති අංක 402(1) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාර දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කළ යුතු වාර්ෂික කාර්යසාධන වාර්තාව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත විගණකාධිපතිට පිටපතක් සහිතව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාල කාර්ය සාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කර තිබුණේ 2013 ඔක්තෝබර් 09 දිනදීය.

**20.5 වත්කම් කළමනාකරණය**

වෙනත් දෙපාර්තමේන්තු සහ ව්‍යාපෘති මගින් ලැබී තිබුණු වත්කම් විෂයයන් 25, ස්ථාවර වත්කම් ලේඛනයෙහි ඇතුළත් කර තිබුණද , ඒවායේ වටිනාකම දක්වා නොතිබුණි. එම වත්කම් ජංගම නොවන වත්කම් සංචලන පිලිබද වාර්තාවටද ඇතුළත් කර නොතිබුණි.

**20.6 අනුකූල නොවීම්**

**නිති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| ආයතන සංග්‍රහය<br>II වැනි පරිච්ඡේදය<br>2.1 වගන්තිය | අධ්‍යක්ෂ (නීති), ජ්‍යෙෂ්ඨ නීති විශ්ලේෂක, නීති විශ්ලේෂක තනතුරු සඳහා බඳවා ගැනීම් පරිපාටියක් අනුමත කරගෙන නොතිබුණි. |

**20.7 කාර්ය සාධනය**

2012 වාර්ෂික අයවැය ඇස්තමේන්තු / ක්‍රියාකාරී සැලසුමට අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිලිබඳ නිරික්ෂණ පහත දැක්වේ.

**ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ කාර්යයන්**

දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යයන් ප්‍රමාණවත් ලෙස ඉටු නොකර තිබුණු අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

**(අ) නඩු කටයුතු සම්බන්ධ කාර්යභාරයන්**

2012 දෙසැම්බර් 31 දින වන විට නීති කටයුතු දෙපාර්තමේන්තුවට ලැබී ඇති නඩු කටයුතු පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | ලැබී ඇති නඩු සංඛ්‍යාව | අවසන් වී ඇති නඩු සංඛ්‍යාව | දැනට පවත්නා නඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| ශ්‍රේෂ්ඨාධිකරණය | 46 | 11 | 35 |
| අභියාචනාධිකරණය | 29 | 04 | 25 |
| මහාධිකරණය | 03 | 01 | 02 |
| දිසා අධිකරණය | 02 | - | 02 |
| මානව හිමිකම් කොමිෂන් සභාව | 04 | 01 | 03 |
| | 84 | 17 | 67 |

2012 දෙසැම්බර් 31 දින වන විට නඩු කටයුතු කාර්යභාරයන් 84ක් දෙපාර්තමේන්තුවට ලැබී තිබුණද 2012 දෙසැම්බර් 31 දිනට අවසන් කර ඇත්තේ නඩු කටයුතු 17ක් පමණි.

**(ආ) නීති උපදෙස් ලබා දීම**

2012 දෙසැම්බර් 31 දින වන විට නීතිපති උපදෙස් ලබා ගැනීමට නීති කටයුතු දෙපාර්තමේන්තුවේ නිරීක්ෂණ සඳහා ලැබී ඇති ලිපි ගොනු සංඛ්‍යාව (ගිවිසුම් හැර) 10ක් වන අතර වැඩ කටයුතු අවසන් වී පවතින ලිපි ගොනු සංඛ්‍යාව 07කි. ඒ අනුව ලිපි ගොනු 03ක වැඩ කටයුතු අවසන් වී නොතිබුණි.

**(ඇ) ගිවිසුම් හා අනුබද්ධ කාර්යයන්**

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු හරහා විදේශ රාජ්‍යයන් හා ද්වි පාර්ශවික හා බහු පාර්ශවික සංවිධාන මඟින් රටේ සංවර්ධනය උදෙසා වන විවිධ ව්‍යාපෘති හා වැඩසටහන් වෙනුවෙන් ලැබෙන ණය මුදල් හා ආධාර වලට අදාලව 2012 දෙසැම්බර් 31 දින වන විට ලැබී ඇති ගිවිසුම්වල ප්‍රගතිය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | ගිවිසුම් පිළිබඳ යොමු වී ඇති ලිපි ගොනු සංඛ්‍යාව | වැඩ කටයුතු සිදු වෙමින් පවතින ලිපි ගොනු සංඛ්‍යාව | වැඩ අවසන් වී ඇති ලිපි ගොනු සංඛ්‍යාව |
|---|---|---|---|
| විදේශ සම්පත් දෙපාර්තමේන්තුව | 74 | 53 | 21 |
| අනෙකුත් දෙපාර්තමේන්තු | 03 | 02 | 01 |
| | 77 | 55 | 22 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) විදේශ සම්පත් දෙපාර්තමේන්තුවෙන් ගිවිසුම් පිළිබඳ යොමු වී ඇති ලිපි ගොනු 74 න් ලිපි ගොනු 21 ක වැඩ අවසන් කර ඇති නමුත් ලිපිගොනු 53ක වැඩ අවසන් කර නොමැති අතර, එය සියයට 71ක ප්‍රමාණයක් විය.

(ii) එසේම වෙනත් දෙපාර්තමේන්තු මඟින් ලැබී ඇති ලිපිගොනු 03න් 01ක කාර්යයන් නිම වී ඇති අතර ලිපි ගොනු 02ක කාර්යයන් නිම කර නොතිබුණි.

**20.8 මානව සම්පත් කළමනාකරණය**

**(අ) අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 15 | 08 | 07 | - |
| (ii) | ද්විතීයික මට්ටම | 05 | 05 | - | - |
| (iii) | ප්‍රාථමික මට්ටම | 06 | 02 | 04 | - |
| (iv) | වෙනත් (අනියම්/තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | - | 01 | - | 01 |
| | එකතුව | 26 | 16 | 11 | 01 |

(ආ) පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 11 ක් පිරවීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

(ii) බඳවා ගෙන තිබුණු අතිරික්ත සේවක සංඛ්‍යාව පිළිබඳ විධිමත් අනුමැතියක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 21. විසර්ජන ශීර්ෂය 324 - කළමණාකරණ විගණන දෙපාර්තමේන්තුව

### 21.1 විගණන විෂය පථය

කළමණාකරණ විගණන දෙපාර්තමේන්තුවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 නොවැම්බර් 08 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශය පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශය පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුලත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 21.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශය පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුලත් වේ.

### 21.3 විගණන නිරීක්ෂණ

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව කළමණාකරණ විගණන දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 21.4 සිට 21.7 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

#### (අ) ලේඛන හා පොත්පත් පවත්වා ගැනීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන යාවත්කාලීනව පවත්වා නොතිබුණි.

| | අදාල රෙගුලාසිය | ලේඛන වර්ග |
|---|---|---|
| (i) | 1978දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | ස්ථාවර වත්කම් ලේඛනය |
| (ii) | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක හා පරිගණක උපාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය |

**(ආ) අයවැය විචලනය**

එක් වැය විෂයයක් යටතේ ප්‍රතිපාදනය කර තිබුණු රු.50,000 ක් වූ සම්පූර්ණ මූලධන ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

**(ඇ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

(i) 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන චක්‍රලේඛයේ 1.1.7 ඡේදයප්‍රකාරව ස්ථාන මාරුවී පැමිණි නිලධාරින්ගේ ණයශේෂ මාස 02 ක කාලයක් ඇතුලත නිරවුල් කළ යුතු වුවත් නිලධාරින් දෙදෙනෙකුගේ එකතුව රු.188,850 ක ණය ශේෂ මාස 03 සිට 08 දක්වා කාලයක් ප්‍රමාද වී නිරවුල් කර තිබුණි.

(ii) ඉහත චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාන මාරුවී ගිය නිලධාරින්ගේ ණය ශේෂ මාස 03 ක් ඇතුලත නිරවුල් කළ යුතු වුවත් ස්ථාන මාරුවී ගිය නිලධාරියෙකුගේ රු. 175,088 ක ණය ශේෂය මාස 05 ක් ප්‍රමාද වී නිරවුල් කර තිබුණි.

## 21.4 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය

**වාර්ෂික කාර්යසාධන වාර්තාව**

2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5 (4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියේ සඳහන් 2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 හා 2004 පෙබරවාරි 20 දිනැති අංක 402(1) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාර දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කළ යුතු වාර්ෂික කාර්යසාධන වාර්තාව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත විගණකාධිපතිට පිටපතක් සහිතව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාල කාර්ය සාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කර තිබුණේ 2013 ජුනි 18 දිනදීය.

**21.5 වත්කම් කළමනාකරණය**

**වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

2010 දෙසැම්බර් 17 දිනැති අංක පීඑෆ්/සමීක්ෂණ මණ්ඩල/01 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය මගින් සංශෝධිත 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාර 2012 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදු කර එම වාර්තා 2013 මාර්තු 31 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, එම වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

**21.6 කාර්ය සාධනය**

2012 වාර්ෂික අයවැය ඇස්තමේන්තු, සංයුක්ත සැලැස්ම සහ ක්‍රියාකාරි සැලසුමට අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**(අ) ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන්**

දෙපාර්තමේන්තුව ප්‍රධාන කාර්යයන් ප්‍රමාණවත් ලෙස ඉටු නොකර තිබූ අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(i) කාර්තුවකට එක බැගින් වසරකට අභ්‍යන්තර විගණන කළමනාකරණ කමිටු අවම වශයෙන් 04 ක් පැවැත්විය යුතු වුවත් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශ සඳහා පවත්වා තිබුණේ රැස්වීම් 03 ක් පමණි.

(ii) තවද, එක් කළමනාකරණ කමිටු රැස්වීමක් හෝ පවත්වා නොමැති අමාත්‍යාංශ 03 ක්ද එක් රැස්වීමක් පවත්වන ලද අමාත්‍යාංශ 04 ක්ද රැස්වීම් 02 ක් පමණක් පවත්වන ලද අමාත්‍යාංශ 10 ක්ද රැස්වීම් 03 ක් පමණක් පවත්වන ලද අමාත්‍යාංශය 20 ක්ද පැවතුණි.

**(ආ) සැලසුම් කිරීම**

**වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මට අනුකූලව ක්‍රියා නොකිරිම.**

පහත සඳහන් අවස්ථාවලදි ක්‍රියාකාරි සැලසුමට අනුකූලව ක්‍රියානොකර තිබුණු බව නිරික්ෂණය විය.

(i) වර්ෂය තුලදි පැවැත්විමට අපේක්ෂිත අභ්‍යන්තර විගණන කළමණාකරණ කමිටු රැස්විම් ගණන හා ඒවා පැවැත්විය යුතු කාල වකවානු සැලැස්මට ඇතුලත් කර නොතිබුණි.

(ii) ක්‍රියාකාරි සැලසුමට අනුව අභ්‍යන්තර විගණන අත්පොත සැකසීමෙන් පසු ජූලි මාසයේ සිට දෙසැම්බර් මස දක්වා පුහුණු වැඩසටහන් පැවැත්විය යුතු වුවද කොපමණ පුහුණු වැඩසටහන් ප්‍රමාණයක් පැවැත්විය යුතුද යන්න සැලැස්මේ දක්වා නොතිබුණ අතර පුහුණු වැඩසටහන් කිසිවක් පවත්වාද නොතිබුණි.

(iii) 2012 මාර්තු 12,15,19,21,22 දිනයන්හිදි මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේදි පුහුණු වැඩසටහන්සහ 2012 සැප්තැම්බර් 14 සිට 19 දක්වා කතරගම නේවාසික වැඩමුළුවක් පවත්වා ඇතත් එය ක්‍රියාකාරි සැලැස්මෙහි ඇතුලත් වී නොතිබුණි.

## 21.7 මානව සම්පත් කළමනාකරණය

**(අ) අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2012 දෙසැම්බර් 31 දිනට වු සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 07 | 07 | - |
| (ii) | තෘතියික මට්ටම | 09 | 03 | 06 |
| (iii) | ද්විතීක මට්ටම | 18 | 14 | 04 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 09 | 09 | - |
| | එකතුව | 43 | 33 | 10 |

(ආ) පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2012දෙසැම්බර් 31 දිනට නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරු සංඛ්‍යාව 1 ක් වුවත් 2012වර්ෂයේ කාර්ය සාධන වාර්තාවේ එම තනතුරු සංඛ්‍යාව 2ක් ලෙස සටහන් කර තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 10 ක් පිරවීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

## 22. මිලෝදා ආයතනය - 2012

### 22.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 22.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2012 දෙසැම්බර් 31 දිනට මිලෝදා ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණමූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 22.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 22.2.1 ලැබියයුතු හා ගෙවිය යුතු ගිණුම්

එකම ආයතනය ණයගැතියන් ලෙසත් ණයහිමියන් ලෙසත් පෙන්වා තිබුණු අතර එවැනි ආයතන 17 ක එකතුව රු.453,800 ක් ණයගැතියන් ලෙසත් එකතුව රු.260,475 ක් ණයහිමියන් ලෙසත් පෙන්වා තිබුණි.මෙහිදී හිලව් කළ හැකි ශේෂය පිළිවෙලින් රු.91,975ක් හා රු.79,200 ක් වුවද එවැනි හිලව් කිරිමක් කර නොතිබුණි.

#### 22.2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත දැක්වෙන නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීමේ අවස්ථාවන් නිරීක්ෂණය විය.

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | ආයතන සංග්‍රහයේixපරිච්ඡේදයේ 1.2 වගන්තිය | ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ පූර්ව අනුමැතිය නොමැතිව ඉකුත් වර්ෂයේ මෙන්ම සමාලෝචිත වර්ෂයේදිද ආයතනයේ ගණකාධිකාරීවරුන් දෙදෙනෙකුට වැටුපෙන් 1/3 ක දීමනා ලෙස රු.160,946 ක් ගෙවා තිබුණි. |
| (ආ) | රජයේ මුදල් රෙගුලාසි 756 | 2012 වර්ෂය වෙනුවෙන් වූ භාණ්ඩ සමීක්ෂණ සිදුකර අදාල වාර්තාවල පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) | 2011 පෙබරවාරි 09 දිනැති අංක 13/2008 (iv)දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 02ඡේදය | ඉන්ධන දීමනාව ලබාගැනීමට හිමිකමක් නොමැති නිලධාරින් දෙදෙනෙකුට මාසිකව රු.20,000 ක් බැගින් එකතුව රු.289,032 ක ඉන්ධන දීමනා ගෙවා තිබුණි. |

**22.3 මූල්‍ය සමාලෝචනය**
---------------------

**22.3.1 මූල්‍ය ප්‍රතිඵල**
--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.3,975,277 ක අතිරික්තයක් වූ අතර, ඊට ප්‍රතිරූපිව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.1,975,354 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.5,950,631 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි . ඉකුත් වර්ෂයේ ඌනතාවය සමාලෝචිත වර්ෂයේ අතිරික්තයක් බවට පත් වීමට පුහුණු වැඩසටහන් ආදායම වැඩිවීම, පොලී ආදායම වැඩිවීම සෘජු වියදම් අඩුවීම සහ ක්ෂය කරන ලද වත්කම් කිහිපයක ඵලදායී ආයු කාලය නිමවීම නිසා වර්ෂයේ ක්ෂය අඩුවීම හේතු වී තිබුණි.

**22.3.2 විග්‍රහත්මක මූල්‍ය සමාලෝචනය**
-----------------------------------

සමාලෝචිත වර්ෂයේ සෘජු මෙහෙයුම් ක්‍රියාකාරකම්වල ශුද්ධ ප්‍රතිඵලය රු.7,133,399 ක ඌනතාවයක් වුවද, වර්ෂය තුළ ලැබී තිබුණු රු.11,108,676 ක් වූ ආයෝජන පොලී ආදායම නිසා සමාලෝචිත වර්ෂයේ ශුද්ධ මූල්‍ය ප්‍රතිඵලය රු.3,975,277 ක අතිරික්තයක් බවට පත් වී තිබුණි.

**22.4 මෙහෙයුම් සමාලෝචනය**
---------------------------

**22.4.1 කාර්ය සාධනය**
-----------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා පුහුණු සහ අධ්‍යයන වැඩමුළු 204 ක් සැලසුම් කර තිබුණද වර්ෂය තුළදී ඉන් 59 ක් පමණක් පවත්වා නිලධාරීන් 1829 ක් පුහුණු කර තිබුණි. ඒ අනුව ආයතනය සැලසුම් කළ පුහුණු පාඨමාලා අතුරින් පාඨමාලා 145 ක් පැවැත්වීමට අපොහොසත් වී තිබුණි.

(ආ) 2010 අගෝස්තු 04 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයට අනුබද්ධිත පුහුණු ආයතනයක් වශයෙන් මිලෝදා ආයතනය සංස්ථාපිත කර තිබුණද, 2012 වර්ෂයේදී පුහුණු පාඨමාලා සඳහා සහභාගී කරවා ගෙන තිබුණු නිලධාරීන් 1,829 න් 1,537 ක් හෙවත් සියයට 84 ක්ම වෙනත් අමාත්‍යාංශ,දෙපාර්තමේන්තු, දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා මණ්ඩල ආදී ආයතනවල නිලධාරීන් වීතිබුණි.

(ඇ) තවද මෙම අමාත්‍ය මණ්ඩල තීරණයේ දක්වා ඇති පරිදි ඒ ඒ ආයතනවල විශේෂිත වූ නිලධාරීන් සඳහා වූ පාඨමාලා කිසිවක් සැළසුම් කර නොතිබුණි.

**22.4.2 අවිධිමත් ආයෝජන**

2005 ජුලි 13 දිනැති අංක 30 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව රාජ්‍ය ආයතනවල තාවකාලික අතිරික්ත අරමුදල් භාණ්ඩාගාර බිල්පත්වල හෝ වෙනත් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබේනම් එම මුදල් 2005 අගෝස්තු 01දින සිට ගිණුම් අංක 4670 දරන රාජ්‍ය ආයතනවල තාවකාලික අතිරික්ත භාර අරමුදලේ තැන්පත් කළ යුතුව තිබුණද, ඊට පටහැනිව රු.93,000,000 ක් මහජන බැංකුවේ ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි.

**22.4.3 කාර්ය මණ්ඩල පරිපාලනය**

2012දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව හා පුරප්පාඩු පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| වර්ගය | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| (අ) මාණ්ඩලික | 06 | 02 | 04 |
| (ආ) මාණ්ඩලික නොවන | 15 | 13 | 02 |
| (ඇ) කණිෂ්ඨ ශ්‍රේණි | 05 | 02 | 03 |
| එකතුව | 26 | 17 | 09 |

ආයතනයේ පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව 09ක් පැවතියද ඒ සඳහා බඳවා ගැනීම් කටයුතු ආයතනය විසින් සිදුකර නොතිබුණි.

**22.5 ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**22.5.1 සංයුක්ත සැලැස්ම**

ආයතනය සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**22.5.2 අයවැය ලේඛනමය පාලනය**

සමාලෝචිත වර්ෂයට අදාලව,ආයතනයේ මූලික අරමුණ වූ පුහුණු හා අධ්‍යාපන වැඩසටහන් යටතේ ඇස්තමේන්තු කරන ලද ආදායම රු.36,125,000 ක් වූ අතර,ඒ යටතේ ලද තථ්‍ය ආදායම රු.19,107,900 ක් විය. ඒ අනුව සැලසුම් කරන ලද ආදායම රු.17,017,100 කින් අඩුවී තිබුණි. පැවැත්වීමට බලාපොරොත්තු වූ පාඨමාලා සංඛ්‍යාව නොපැවැත්වීම හේතුවෙන් මෙසේ තථ්‍ය ආදායම අයවැය ගත ප්‍රමාණයට වඩා සියයට 47කින් අඩුවී තිබුණු අතර ශුද්ධ අතිරික්තයද අයවැය ගත අගයට වඩා සියයට 24කින් අඩුවී තිබුණි. මේ අනුව 2012 වර්ෂයේදී ආයතනය අයවැය ගත ඉලක්කයන් ලබා කර ගෙන නොතිබුණ අතර අයවැය ලේඛනය සඵල කළමණාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කර ගෙන නොතිබුණි.

**22.5.3 වාර්ෂික වාර්තා සභාගත කිරීම**

වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**22.6 පද්ධති හා පාලන**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු ආයතනයේ විධායක අධ්‍යක්ෂවරයාගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) ණය ගැතියන් හා ණය හිමියන්

(ආ) අයවැය ලේඛනය